# ජ්‍යොතිෂය, වෙදකම, යන්ත්‍ර-මන්ත්‍ර විධි හා භික්ෂුව

දාපනේ චන්දරතන හිමි

මිනිස් ශිෂ්ටාචාරයෙහි ආරම්භයේ පටන්ම, මිනිසා නොයෙක් ස්වාභාවික බලවේගවලට වන්දනා මාන කිරීම පුද පූජා පැවැත්වීම, එමගින් ආත්ම සුභ සිද්ධිය හා ආරක්ෂාව අපේක්ෂා කිරීම සිදුකොට ඇති බව ඓතිහාසික හා පුරා විද්‍යාත්මක සාධකවලින් පැහැදිලි වේ. ජ්‍යොතිෂය පිළිබඳ මූලික සංකල්ප කවදා කෙසේ ආරම්භ වූයේ දැයි නිශ්චිතවම කිවහැකි නොවුණත් එය මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ පටන්ම පැවත එන විෂයක් බව බොහෝ දෙනාගේ විශ්වාසයයි. මානව විද්‍යාඥයින් විසින් මිනිස් ශිෂ්ටාචාරයේ මුල් අවධියෙහි ඇදහිලි, විශ්වාස ප්‍රාථමික ක්‍රියාකාරකම් ලෙස සලකන අතර එවැනි බොහෝ විශ්වාස හා ඇදහිලි සමාජ පරිණාමය හා විද්‍යාවෙහි දියුණුවත් සමඟ අර්ථ ශූන්‍ය ක්‍රියාකාරකම් ලෙස සැලකීමටත් මිනිසා පුරුදු වී ඇත. එසේ වුවත් ජ්‍යොතිෂය විෂය නොයෙක් මතවාදයන්ට ලක්වෙමින් විද්‍යාව සමග ද ගැටීමෙන් වර්තමානය දක්වා පැවත ඒම එහි දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයක් ලෙස සඳහන් කළ හැක. මානව ශිෂ්ටාචාරයෙහි ආරම්භක යුගයේ පටන් වර්තමානය දක්වා පරිණාමය වීමේදී මිනිස් ක්‍රියාකාරකම්වල වෙනසක් දැකිය හැක. එහෙත් ශ්‍රීමත් ජේම්ස් ජීන් පවසනු ලබන්නේ ''පුද්ගලයාගේ ඉතිහාසය වු කලී හුදෙක් නොපැහැදිලි වාර්ගික ඉතිහාසයක් ම වෙයි. එබැවින් අපේ වර්ගයා සිය ප්‍රාථමික අවධිය යම්සේ ගත කලේ ද එහි පුද්ගලයන් දැනුදු ක්‍රියාකරන්නේ එසේමය. සොබා දහමේ සිදුවීම් අන් හැටියකින් නොවී'' (පැට්රික් නාරාවිල, 2005. පි. 8)

මෙමගින් පැහැදිලි කිරීමට උත්සාහගෙන ඇත්තේ මිනිසා විසින් විවිධ විෂයන් කෙරෙහි විවිධ මතවාද ඉදිරිපත් කරමින්

ස්වභාවධර්මයට හා එහි ක්‍රියාකාරිත්වයට නව අර්ථකථන ඉදිරිපත් කොට ඇතත් අතීතයේ මෙන්ම වර්තමානයේද ස්වභාවධර්මය ක්‍රියාත්මක වන්නේ එකම ක්‍රමවේදයකට බවයි. එබැවින් යම් සත්‍ය වූ විෂයක් ස්වභාවධර්මයට සාපේක්ෂ ලෙස ඉදිරිපත් කොට ඇත්නම් එය ලෝකය පරිණාමය වීමත් සමග අසත්‍ය විය නොහැකි බවය. ජ්‍යෝතිෂය වැදගත් විෂයක් වන බැවින් එය අධ්‍යයනය කිරීමට බොහෝ විට සෑම දෙනාම වැඩි කැමැත්තක් දක්වන බව පැහැදිලි වේ. විද්‍යාත්මක ක්‍රමයේ පියා ලෙස සැලකෙන දේවධර්මාචාර්යයකු වූ ඇල්බර්ටස් මැග්නස් ජ්‍යෝතිෂය පිළිබඳ උනන්දුවක් දැක්වූ එවැනි උගතෙකි. තවද බෙකන් සාමි ප්‍රවීණ ජෝතිර්වේදියෙක් විය. ඔහු ප්‍රකාශ කර සිටියේ ජ්‍යෝතිෂය ප්‍රතික්ෂේප කරනවාට වඩා එය සංස්කරණය කරගත යුතු බවය. (එම.පි.6)

එසේම මහා විද්‍යාඥයෙකු වූ නිව්ටන් පවා ජ්‍යෝතිෂය පිළිබඳ ඇල්මක් දැක්වූ උගතෙකු බව ඇතමුන් පෙන්වාදෙත්. ඔහුගේ පුස්තකාලයෙහි ජ්‍යෝතිෂය පිළිබඳ ග්‍රන්ථ එකතුවක් තිබූ බව සඳහන් වේ. එමෙන්ම ඔහුගේ ශිෂ්‍යයෙකු වූ හලේ ජ්‍යෝතිෂය පිළිබඳව තම ගුරුවරයා වන නිව්ටන් දක්වන සැලකිල්ල පිළිබඳව අකමැත්ත ප්‍රකාශකළ විට නිව්ටන් සඳහන් කරනු ලැබුයේ ''මම ඒවා අධ්‍යයන කරලා තියෙනවා, ඔයා එහෙම කරලා නැනේ'' යන්නයි. (එම)

මෙලෙස ඇතැම් විද්‍යාඥයන් ජ්‍යෝතිෂය විෂය පිළිබඳ උනන්දුවක් දැක්වුවත් බොහෝ විද්‍යාඥයන් ජ්‍යෝතිෂය පිළිගැනීමට මැලිකමක් දක්වා ඇත. එමෙන්ම විද්‍යාත්මක ක්‍රමවේදය යටතේ එය සත්‍යයෙන් තොර වූ විෂයක් බව පෙන්වීමට බොහෝ භෞතිකවාදී වූ විද්‍යාඥයන් උත්සාහගෙන ඇත. මෑත ඉතිහාසයේ ලංකාවේද එවැනි කීපදෙනෙකු ජ්‍යෝතිෂයට අභියෝග කරමින් විද්‍යාත්මක සත්‍යෝක්ෂණ ක්‍රමවේද යටතේ ජ්‍යෝතිෂයෙහි ඇති අර්ථ ශූන්‍ය බව පෙන්වා දැක්වීමට විවිධ වූ පර්යේෂණයන් සිදු කොට ඇත. ආචාර්ය ඒබ්‍රහම්. ටී. කොවුර් එවැනි පුද්ගලයෙක් විය. ඔහු විසින් ඒ පිළිබඳව පර්යේෂණ රාශියක් සිදුකොට ඇත. එසේ සිදුකොට පළ කරන ලද ග්‍රන්ථ කිපයක් නම් ''දෙවියෝ සහ භූතයෝ - විද්‍යාත්මක ඇගයුමකි'' ''මා කළ ගවේෂණ -

විද්‍යාත්මක ඇගයුමකි'' ආදිය දැක්විය හැක. මෙවැනි පර්යේෂණ හා විද්‍යාත්මක ක්‍රමවේද පිළිබඳ නොසතුට පළ කරන බී.වී රමන් සඳහන් කරනු ලබන්නේ ''ඇතැම් විට තමාට ඒත්තු නොයන හෝ නොකළ හැකි දේ මානව සංහතියේ සිටින අනෙක් අයට ඒත්තු නොයා හැකි හෝ කළ නොහැකි විය යුතුය යැයි විද්‍යාඥයා හඟී. තමාට අර්ථකථනය හෝ විග්‍රහ නොකළ හැකි සංසිද්ධියක් සම්බන්ධයෙන් අනෙක් අයටත් එසේ නොකළ හැකි යැයි සිතීම මුග්ධ තර්කයකි.'' (එම)

ජ්‍යෝතිෂය හා විද්‍යාව අතර ඝට්ටනයක් ඇතිවීමට හේතුව හා විද්‍යාව මගින් ජ්‍යෝතිෂය ප්‍රතික්ෂේප වීමට හේතු මොනවාද යන්න පිළිබඳ ඉතා කෙටියෙන් අවබෝධයක් ලබාගැනීම අත්‍යවශ්‍ය කාරණාවකි. ජ්‍යෝතිෂය මගින් සිදු කරනුයේ පුද්ගලයාගේ හෝ සංසිද්ධියක ඉරණම පිළිබඳ අනාවැකි කීමකි. ඉරණම නිතැතින්ම නියතිවාදය හා බැඳී පවතින්නකි. ඉරණම්වාදය හා නියතිවාදය පිළිඹිඹු කරන ජ්‍යෝතිෂය විෂය ලෝකය හා පුද්ගලයා පිළිබඳ අර්ථ කථනයක් ඉදිරිපත් කරනු ලබන්නේ නියතිවාදි මූලධර්මය මත රඳා පවතිමිණි. ලෝකයෙහි ක්‍රියාකාරකම් නියතවාදි ස්වරූපයකට සිදුවන බව බැලූ බැල්මට පෙනෙන පැහැදිලි කරුණකි. හේතුඵලවාදය පවා අභිභවනය කරමින් නියතිවාදය නැගී සිට ඇත. ඉතිහාසයේ පටන්ම මෙම නියතිවාදී මූලධර්මය යටපත් කිරීමටත් නිදහස හා අහඹු පැවැත්මක් යටතේ ලොව සියල්ල සිදුවන බව ඔප්පු කිරීමටත් දාර්ශනිකයන් විසින් උත්සාහ ගත්තේ වී නමුදු එවැනි උත්සාහයක් නිරර්ථක වීමට හේතු වූයේ ඔවුන් ඉදිරිපත් කරන ලද එවැනි තර්ක හා න්‍යායවල බොහෝ විට ඔවුන් නොදැනුවත්වම නියතිවාදය අන්තර්ගත වී තිබීමයි. එබැවින් ජ්‍යෝතිෂය විද්‍යාව අසත්‍යයක් යැයි ඔප්පු කිරීමට ඇතැම් විද්‍යාඥයන් විසින් උත්සාහ කලත් එය සම්පූර්ණ ලෙස සිදු කිරීමට නොහැකි විය. ඊට හේතුව නම් නියතිවාදී ස්වරූපය ප්‍රතික්ෂේප කිරීමට තරම් කරුණු ඉදිරිපත් නොවීමයි.

එහෙත් ක්වන්ටම් භෞතික විද්‍යාව දියුණු වීමත් සමගම නියතවාදී මූලධර්මවලට දැඩි හානියක් සිදුවිය. ක්වන්ටම් සිද්ධාන්තයට අනුව ලෝකයේ පැවැත්ම සිදුවන්නේ නියතවාදී

සිද්ධාන්තයකට අනුව නොව අහඹු සංසිද්ධියකට අනුව බව පරමාණු විශ්ලේෂණය කිරීමෙන් විද්‍යාඥයන් ඉදිරිපත් කළහ. රූපඩ් විසින් සොයාගත් පරිදි ''ඇතැම් විට පරමාණුහු තුමු ම නිරායාසයෙන්ම විභේදයනය වෙත් ඇතැම් විට වෙනස් මගක් හැසිරෙත්'' (එම) තවද බෝහර් මෙසේ සඳහන් කොට ඇත.''පරමාණුවක ඉලෙක්ට්‍රෝන අඛණ්ඩවම ඒකාකාරව ගමන් නොකරයි.'' ඒවා ගමන් කරන්නේ පිම් පනිමිනි. (Doyle Bob -2011 p.103) මෙලෙස පරමාණු පිළිබඳව ඉදිරිපත් කරන ලද අහඹුවාදය නියතිවාදය බැහැර කිරීමට හේතු විය. එහෙත් මෙම ක්වන්ටම් සිද්ධාන්තයේ ඉදිරිපත් කරන ලද අහඹුව පිළිබඳව පිළිගැනීමට ජ්‍යොතිෂඥයා කැමති නොවේ. එයට හේතුව නම් විද්‍යාඥයින්ගේ විෂය පරමාණු පිළිබඳ මිසක් මිනිසාගේ අධ්‍යාත්මය කෙරෙහි නොවන බව ඔවුන්ගේ පිළිගැනීමයි. එසේ ම බි.වී රාමන් පෙන්වා දෙන පරිදි ''අප මානව ජීවියෙකු ගතහොත් ඔහු වෙත කිසියම් ආකාරයක නියතතාවක් පවතියයි සොයාගන්නට පුළුවන. ඇත්තටම අනියත සිදුවීම් පවා සංඛ්‍යාන නීතිවලින් පාලනය කරනු ලැබේ. ඉලෙක්ට්‍රෝන සමූහයාගේ හැසිරීම් පාලනය කල හැකි නීති සොයාගත හැකිය'' (පැට්රික් නාරාවිල, 2005. පි. 14).

නියතිවාදය නැවත ස්ථාපිත කිරීම සඳහා බී. වි. රාමන් බර්ට්රන්ඩ් රසල්ගේ කියමනක් ද යොදා ගනි. ''මම සිදුවීම් පෙළක්, එනම්, හේතුඵල, කාර්යාවලියක් සිහියට නගිමි, ඒවායින් කිපයක් ඉදිරිපත් කළහොත් පරිසරය ගැන කිසිවක් නොදැන තිබුණත් අනෙක් ඒවා ගැන යමක් තේරුම් ගන්නට අපට පුළුවන. (එම. පි. 16) මෙවැනි කරුණකින් ඔහු ඔප්පු කිරීමට උත්සාහගෙන ඇත්තේ අනාවැකි පිළිගත හැකි යන්න බව බී.පි. රාමන් පවසයි. එසේම මෙවැනි කියමන් ගෙනහැර දක්වමින් නූතන විද්‍යාවට අභියෝග ඉදිරිපත් කරමින් රාමන් තම කෘතිය වූ ''Planetary influences on humon affairs'' යන කෘතියෙන් ඔප්පු කිරීමට උත්සාහගෙන ඇත්තේ ඉන්දියානු මහා ඍෂින් විසින් අන්තර්ඥානයෙන් සොයා ගන්නා ලද ඇතැම් සිද්ධාන්ත අසත්‍ය යැයි ප්‍රකාශ කිරීමට විද්‍යාත්ම ක්‍රමවේද ප්‍රමාණවත් නොවන බවයි.

භාරතිය සන්දර්භය තුළ ජ්‍යෝතිෂය සලකනු ලබන්නේ වේදයෙහි තෙවන ඇස ලෙසය. (Third eye of vedas) ලොව ඇති සියලුම වස්තූන් කෙරෙහි ඉර හඳ ආදි ග්‍රහ තාරකාවන්ගේ බලපෑම සිදුවන බව ඍග්වේදයෙහි සඳහන් වේ. ජ්‍යෝතිෂය විෂය මහා බ්‍රාහ්මයා විසින් ආරම්භ කරන ලද අතර එය මහා ඍෂින් විසින් ප්‍රකාශිත බව භාරතීය පිළිගැනීමයි. වේද සාහිත්‍ය ඉගෙන ගැනීමට උපකාර වන්නා වූ විෂය අතර ජ්‍යෝතිෂය ද එක් විෂයකි (එනම්, ශික්‍ෂා, කල්ප, ව්‍යාකරණ, නිරුක්ති, ඡන්දස සහ ජ්‍යෝතිෂය) එසේම ඍග් වේද සහ යජුර් වේද සංස්කරණයන්හි ජ්‍යෝතිෂය පිළිබඳ කරුණු අන්තර්ගත වේ. නක්‍ෂත්‍රය පිළිබඳ දියුණු තොරතුරු මේවායෙහි අන්තර්ගත නොවුණත් යාග පැවැත්වීමේදී, ඒවා පැවැත්විය යුතු වේලාව නියම කිරීම ආදිය මෙම යුගයෙහි නක්‍ෂත්‍ර ශාස්ත්‍රයෙන් සිදු වී ඇති බව පැහැදිලි වේ.

භාරතීය නක්‍ෂත්‍ර ශාස්ත්‍රයෙහි නිමිති කීම ප්‍රධාන ලක්‍ෂණයක් විය. මේ සඳහා චන්ද්‍ර සහ සූර්ය ලිත් භාවිත කොට ඇත. ජ්‍යෝතිෂාංග පිළිබඳව ඍග් වේදයෙහි ශ්ලෝක සතිසෙකින් හා යජුර් වේදයෙහි ශ්ලෝක තෙසළිසෙකින් යුක්ත වේ. මෙවායෙහි දින මාස, අවුරුදු සැකසෙන ආකාරය පිළිබඳ සඳහන් වේ. ජ්‍යෝතිෂය පිළිබඳ ලියැවුණු කෘති පසු කාලයට අයත් බැවින් වෛදික යුගයෙහි පැවැති ජ්‍යෝතිෂය ක්‍රමවේද පිළිබඳ නිශ්චිතව සඳහන් කිරීමට නොහැක. කෙසේ වෙතත් අතීතයේ පටන් වර්තමානය දක්වා ජ්‍යෝතිෂය විෂය නොකැඩී අඛණ්ඩව භාරතයේ භාවිත වන බව ඉතා පැහැදිලිය.

භාරතිය ජ්‍යෝතිෂය විෂය කෙරෙහි මෙසපොතෙමියානු ආභාසය ලැබී ඇති බව නිගමනය කිරීමට ඇතැමුන් උත්සාහගෙන ඇත. තවද රෝමයේ මෙන්ම පැරණි භාරතයේද පූජකවරු නක්‍ෂත්‍රය භාවිත කළහ. යාග හා පුද පූජාවන් සිදුකරන වෙලාව හා දින ගණනය කිරීමට වෛදික යුගයේ නක්‍ෂත්‍ර භාවිත කොට ඇත. මෙලෙස ඉතා පැරණි ඉතිහාසයක් ඇති ජ්‍යෝතිෂය විෂය පැරණි භාරතයේ පමණක් නොව ග්‍රීක, රෝම වැනි ශිෂ්ටාචාරවලත්, මෙසපොතෙමියාව, මායා වැනි පැරණි ශිෂ්ටාචාරවලත්, පැරණි චීනය වැනි ශිෂ්ටාචාරවලත්, ජ්‍යෝතිෂය අතීතයේ සිටම භාවිතකොට ඇති බවට සාධක ඇත.

පැරණි මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ පටන් පැවත එන ජ්‍යොතිෂය විද්‍යාව ''පුද්ගලයාගේ හා ජාතීන්ගේ අතීතාවේග හා අනාගත ක්‍රියාකාරිත්වය අනාවරණය කරන සහ විශ්ලේෂණය කරන දර්ශනය'' (එම.පි.35) යනුවෙන් හඳුන්වා ඇත. එබැවින් එය මානව ගවේශකයන්ගේ විශිෂ්ට දායාදයන් ලෙස සලකනු ලැබේ. මානවයාගේ චින්තනය අධිභෞතික සංසිද්ධීන් කෙරෙහි යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස මෙය ආරම්භ වී නැයි සැලකිය හැක. එසේම ජ්‍යොතිෂය තනි විෂයක් නොවන අතර එය භූගෝල විද්‍යාව, ගණිත ශාස්ත්‍රය හා ගෘහනිර්මාණය වැනි විෂය හා බද්ධ වූවකි. චන්ද්‍ර සූර්ය ආදී නවග්‍රහ මණ්ඩලයකින් යුක්ත වූ රාශි චක්‍රය පිළිබඳව (Zodiacal) එමෙන්ම ඔවුන්ගේ සංචරනය අනුව ලොකයට හා මිනිසාට සිදුවන සම්පත් විපත් පිළිබඳව මෙම ශාස්ත්‍රය මගින් අනාවරණය කරනු ලැබේ. (සේදරමන්, ජේ.රි.1983) මිනිසා ඉපදුන මොහොතේ වේලාව බලා ග්‍රහ පිහිටීම අනුව මිනිසා පිළිබඳ අනාවැකි කීම මෙම ශාස්ත්‍රයෙහි ප්‍රධානම විෂය ක්ෂේත්‍රය වේ. ජ්‍යොතිෂයට අනුව එලෙස මිනිසාට බලපාන ප්‍රධාන ග්‍රහයන් මෙසේය. එනම් රවි, චන්ද්‍ර, කුජ, බුධ, ගුරු, ශුක්‍ර, ශනි, එමෙන්ම රාහු, කේතු, හා යුරේනස්, නෙප්චූන්, ප්ලූටෝ වැනි ග්‍රහයන්ගේ බලපෑම ලැබෙන බව සඳහන් වේ. ජ්‍යොතිෂය විද්‍යාව අනුව මිනිසාගේ හා ලෝකයෙහි පැවැත්ම හා ඉරණම තිරණය වනු ලබන්නේ මෙම ග්‍රහයින්ගේ ක්‍රියාකාරිත්වය ශක්තිය හා බලපෑම මතය. මෙලෙස අධිභෞතික මාතවාදයන් මත ජ්‍යොතිෂය රඳා පවතින බැවින් එය ගුප්ත විද්‍යාවක් ලෙස හැඳින්වීමට යොමු වී ඇත.

### යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්

යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් හා පලාඵල කීම සෘජුවම ජ්‍යොතිෂය විෂය හා සම්බන්ධ නොවුණත් ඒ හා සමගාමීව පවතින විෂයන්ය. ඇතැම් ජෝතිෂඥයෝ ජ්‍යොතිෂය කටයුතු සිදු කරන අතර යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් හා පලාඵල කීමද සිදු කරති. යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්වල ආරම්භය නිශ්චිතවම කිව නොහැකි වුවත් මානව සමාජයෙහි ආරම්භයේ පටන්ම ඒවාද පැවති බවට තහවුරු

කිරීමට ප්‍රමාණවත් සාධක ඇත. හින්දු ආගමේ ආරම්භයේ පටන්ම එනම් ඍග් වේද හා අථර්වන් වේද යුගයන්හි ආරම්භ වී වර්ධනය වූ දෙවියන් වන්දනා කීම සඳහා සකස් වූ මන්ත්‍ර රාශියක් වේද යුගයෙහි දැකිය හැක. මෙම යුගයේදී මන්ත්‍ර කළා වූ ඍෂිවරුන් දස දෙනෙකු පිළිබඳව දිඝනිකායෙහි සඳහන් වේ. එනම්, අට්ඨක, වාමන, වාමදෙව, අංගිරස, වෙස්සාමිත්ත, යමතග්ගි භාරද්වාජ, වාසෙට්ඨ, කාශ්‍යප සහ භගු (දී.නි.1,පි. 234) යන ඍෂිවරුන්ය.

මෙහි සඳහන් පරිදි ඍග් වේද යුගයේ සිටම දෙවිවරු වන්දනා කිරීම සඳහා මන්ත්‍ර හා ස්තෝත්‍ර සකස් වී තිබුණ බව පැහැදිලි වේ. එමෙන්ම මෙම මුල් කාලීන මන්ත්‍ර පසුකාලීන භාරතීය යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් සකස් වීමට බලපාන්නට ඇති බව විශ්වාස කළ හැක.

බෞද්ධාගමේ යන්ත්‍ර මන්ත්‍ර භාවිතය පැහැදිලිව දැකගත හැකි වූයේ තන්ත්‍රයානයෙහි ආරම්භයත් සමඟමය. තන්ත්‍රයානයෙහි ඇතැම් තාන්ත්‍රික ලක්ෂණ වර්ධනය වීම සඳහා හින්දු දහමෙහි බලපෑම නොලැබුණේ යැයි කිව නොහැක. මුල් බුදුසමයෙහි ඇති ඇතැම් සංසිද්ධීන් ද තාන්ත්‍රික බුදුදහම වර්ධනය වීමට හේතු වී ඇති බව ඇතැම්හු පෙන්වා දෙති. පිණ්ඩොල භරද්වාජ තෙරුන් අහසට නැග රත් සඳුන් පාත්‍රය ගැනීම, මුගලන් තෙරුන් නන්දොපනන්ද නාගරාජයා දමනය කිරීම, මෙන්ම ආටානාටිය සූත්‍රය ද ආදර්ශයට ගත් තාන්ත්‍රිකයෝ, යන්ත්‍ර මන්ත්‍ර ආරම්භ කරන්නට ඇත. (සාසනරතන හිමි, මොරටුවේ, 1999.පි.335) මහායාන සම්ප්‍රදායෙහි යන්ත්‍ර මන්ත්‍ර භාවිත ආරම්භවීමට මන්ත්‍රයාන සම්ප්‍රදාය ආරම්භ වීමද ප්‍රධාන හේතුවක් විය. සාධනමාලා නම් තාන්ත්‍රික ග්‍රන්ථයෙහි සඳහන් පරිදි මන්ත්‍ර හා තන්ත්‍ර ආරම්භ කරන ලද්දේ බුදුන් වහන්සේ විසින්මය. (එම.පි.338) එහෙත් එවැනි මතවාදයක් එක්වරම පිළිගැනීමට නොහැක. ඊට හේතුව නම් බුදුන් වහන්සේ විසින් සුත්ත නිපාතයෙදී මන්ත්‍ර භාවිත නොකළ යුතු බව සඳහන් කොට තිබීමයි. (එම.පි.347) තාරානාථ සඳහන් කරන පරිදි තන්ත්‍ර හා තාන්ත්‍රික අදහස් ආරම්භ කරන ලද්දේ නාගර්ජුන පාදයන් විසින්ය. (History of Indian Literature vol. ii. p. 394)

තන්ත්‍රයානය හා මන්ත්‍රයානය යන මහායාන ශාඛාවන්හි පමණක් නොව මුල් කාලින මහායාන සූත්‍රයන්හිද මන්ත්‍ර භාවිතය දැකිය හැක. උදාහරණයක් ලෙස සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය හා ලලිත විස්තර සූත්‍රය වැනි සූත්‍රවල මන්ත්‍ර භාවිතය දැකිය හැක. සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයෙහි විසි එක් වන පරිච්ඡේදයෙහි අමනුෂ්‍යාදීන්ගෙන් පැමිණෙන උවදුරු වළක්වා ගැනීම සඳහා උගන්වනු ලැබූ මන්ත්‍ර කිහිපයක් දැකිය හැක. ''ජුවලෙ මහාජුවලෙ උක්කෙ මුක්කෙ අඩෙ, අඩාවති ත්‍රිත්‍යෙ ත්‍රිත්‍යාවති ඉටිනි, විටිනි, චිටිනි ත්‍රිටිනි ත්‍රිටාවති ස්වාහා'' යනුවෙන් සඳහන් වී ඇත්තේ එවැනි මන්ත්‍රයකි.

ලක්දිව භික්ෂුව කෙරෙහි යන්ත්‍ර මන්ත්‍ර හා තාන්ත්‍රික ක්‍රමවේද බලපාන ලද්දේ මහායාන බුදුසමයේ බලපෑම මත බව කිව හැකි වුවත්, ඉන් පෙර සිටම ලාංකියයන් යන්ත්‍ර මන්ත්‍ර හා ජ්‍යොතිෂය විෂය කෙරෙහි උනන්දුවක් දක්වා ඇති බවට සාධක ඇත. උදාහරණයක් ලෙස අනුරාධපුර නගරය නිර්මාණය කිරීමේදි නැකත් දන්නවුන් ගෙන්වා බලා එය ඉදිකිරීම මෙන්ම ''අනුරේ'' නැමැති නැකතින් එය ඉදිකිරීම ආරම්භ කල බැවින් අනුරාධපුර නැමැති නම තැබීම (නිවාසන්තා අනුරාධානං අනුරාධපුරං අහු, නක්ඛත්තෙනානුරාධෙන පතිට්ඨාපිතතයාච) යන කරුණු දැක්විය හැක. (මව. 2006. පි. 62) ශ්‍රී මහා බෝධිය ලංකාවට වැඩම කරන අවස්ථාවෙහි පැමිණි දහඅට ශ්‍රේණීන් අතර බමුණන් ද සිටි බැවින්, ලාංකිකයන් අතීතයේ සිටම ජ්‍යොතිෂය පිළිබඳ දැන සිටින්නට ඇත. (එම.පි.109) කෙසේ වෙතත් මුල් කාලින ලාංකික ථෙරවාදි භික්ෂූන් අතර ජ්‍යොතිෂය කටයුතු හා යන්ත්‍ර මන්ත්‍ර සිදු කිරීම් දක්නට නොලැබෙන බැවින් ලාංකික භික්ෂුව එම තිරශ්චීන විද්‍යාවන් කෙරෙහි නැඹුරු වන්නට ඇත්තේ මහායාන අදහස්වල බලපෑම මත බව විශ්වාස කල හැක. එහෙත් මෙයින්ම එයම සත්‍ය යැයි ප්‍රකාශ නොකෙරේ. කෙසේ වෙතත් ථෙරවාද ලාංකික භික්ෂුව මුල් කාලීනව ප්‍රතිපත්තියටම නැඹුරු වීමෙන් ආත්ම විමුක්තිය සඳහාම යොමු වී සිටි බැවින් පොදු ජනයාගේ එදිනෙදා ජීවිතයෙහි ගැටලු විසඳා ගැනීම සඳහා එතරම් සහයෝග යක් නොලැබිණ.''මහායානිකයන්ට ලක්දිව කටයුතු කිරීමට පහසු

වූයේ ද මහායාන ධර්ම ඉතා ඉක්මනින් ලක්දිව පැතිර ගියේ ද ඔවුන් සංස්කෘත භාෂාව ව්‍යාවහාර කළ බැවිනි. පොදු ජනයාට උවමනා, වෛද්‍ය, ජ්‍යෝතිෂ්‍ය, යන්ත්‍ර, මන්ත්‍ර, තන්ත්‍ර, කලා ශිල්ප, ආදිය පිළිබඳ කිසිවක් පාලි භාෂාවෙන් නොපැවති නමුදු, ඒ සියල්ල සංස්කෘතයෙන් ලියා ඇති බැවින් ද මහායානික භික්ෂූන් මේ සියල්ලෙහි හසළ බුද්ධිමත් පිරිසක් වන බැවින්ද, මහායාන බලය වේගයෙන් පැතිර ගියේය.'' (සාසනරතන හිමි, මොරටුවේ , 1999.පි.370)

මෙම ප්‍රකාශයෙන්ද පැහැදිලි වන්නේ මහායාන යන්ත්‍ර මන්ත්‍ර ශාස්ත්‍රය ථෙරවාද බෞද්ධ ජනයා කෙරෙහි බලපා ඇති බවත් ඒ තුළින් ථෙරවාද බෞද්ධ ජනතාව බෞද්ධ යන්ත්‍ර මන්ත්‍ර කෙරෙහි ළැදියාවක් දක්වා ඇති බවය. කෙසේ වෙතත් වර්තමානයෙහි ථෙරවාදී භික්ෂූන් විසින් සිදුකරනු ලබන ජ්‍යෝතිෂය, යන්ත්‍ර මන්ත්‍ර කෙරෙහි මෙම මහායාන අදහස් බල නොපැවේ යැයි කිව නොහැක. තාන්ත්‍රික බුදුදහමෙහි අන්තර්ගත බොහෝ අභිචාර විධි වර්තමාන ජනප්‍රිය බුදුදහමෙහි අන්තර්ගත වී තිබීමෙන් එය වඩාත් සනාථ වේ.

## බුදුදහමේ ජ්‍යෝතිෂය අන්තර්ගත වන්නේද?

ජ්‍යෝතිෂය ශාස්ත්‍රය, යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම්, ආදීය යථෝක්ත පරිදි අතීතයේ සිටම පැවත එන බව පැහැදිලි කරුණකි. මෙවැනි ඉතා පැරණි ශාස්ත්‍ර බුදුදහමෙහි අන්තර්ගත වී ඇද්ද? බුදුරජාණන් වහන්සේ එවැනි ශාස්ත්‍රයන් පිළිගෙන ඇද්ද? යන්න ඇතැම් විට පැන නගින ගැටලු කිහිපයකි. මෙහිදී සෘජුවම ප්‍රකාශ කළ හැක්කේ බුදුදහමේ එවැනි ක්‍රමවේද පිළිනොගන්නා බවයි. මේ පිළිබඳ එනම් බුදුදහමෙන් එය ප්‍රතික්ෂේප වන අයුරු, සනාථ කිරීමට කරුණු ගෙනහැර දැක්වීම පසුවට තබා බුදුදහම තුළ ජ්‍යෝතිෂය හා යන්ත්‍ර මන්ත්‍ර ආදිය එනම් බුදුදහමෙහිම හඳුන්වන ආකාරයට තිරශ්චීන විද්‍යා හෝ ගර්හිත විද්‍යා බුදුදහමේ අන්තර්ගත වන්නේ යැයි ඇතමුන් විසින් ගෙනහැර දක්වන කරුණු පිළිබඳ අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය කාරණයකි. බුදුදහමේ යථෝක්ත ගර්හිත විද්‍යාවන් යම්තාක් දුරට හෝ අන්තර්ගත වන

බව සනාථ කිරීමට ඇතමෙක් ක්‍රමවේද 3 ක් යටතේ කරුණු ගෙනහැර දක්වත්. එනම්, 01. සිදුහත් චරිතය තුළින්, 02. බුද්ධ චරිතය හා බුදුදහමේ අන්තර්ගත කරුණු තුළින්. 03. පසුකාලීනව රචනා වූ බෞද්ධ ග්‍රන්ථ මගින් (මේ කරුණු 3න් පරිබාහිර කරුණු නැත්තේ යැයි මෙයින් නොකියවෙන බව සැලකිය යුතුයි) මෙහි පළමුවන කරුණ අනුව බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් පරිදි බෝසතාණන් වහන්සේ මහාමායා දෙවියගේ කුස තුළ පිළිසිඳ ගත් අවස්ථාවෙහි එතුමිය විසින් දකින ලද සිහිනයන්හි පලාඵල දැනගැනීම සඳහා බ්‍රාහ්මණ ප්‍රධානීන් සූසැට දෙනෙක් ගෙන්වා ඒ පිළිබඳ විමසීම රජතුමා විසින් සිදු කරන ලදී. (ජාඅ. I, 1926 පි.49) තවද සිදුහත් කුමාරයාගේ නම් තැබීමේ උත්සවයේදී බමුණන් ගෙන්වා සුදොවුන් රජතුමා එම බමුණන්ගෙන් ඉල්ලා සිටියේ තම පුතුට සුදුසු නමක් තබන ලෙසය. එහිදී කොණ්ඩඤ්ඤ නැමැති බමුණා සිදුහත් කුමරු මතු බුදු වන්නේ යැයි අනාවැකි ප්‍රකාශ කලේය. (පපංචසුදනී, පි. 155.156) මීට අමතර සිදුහත් චරිතයෙහි බොහෝ අවස්ථා ජ්‍යොතිෂය හා සම්බන්ධ වී ඇත. මෙහිදී ඉතා පැහැදිලිව සඳහන් කළයුතු කරුණක් වන්නේ සිදුහත් චරිතය හෝ ඒ හා සබැඳි චාරිත්‍ර ධර්ම බුදුදහමට අදාළ නොවන බවය. සිදුහත් කුමරු උපත ලැබුයේ හින්දු සමාජයෙහි සාමාජිකයෙකු ලෙසය. එබැවින් නැකැත් බැලීම, අනාවැකි ප්‍රකාශ කිරීම හින්දු සමාජයෙහි නිතැතින්ම පවතින්නකි. ජ්‍යොතිෂය හින්දු දහම හා බැඳී පවතින්නකි. එබැවින් සිදුහත් චරිතයෙහි සිද්ධි ජ්‍යොතිෂය හා බැඳී පැවති යයි ප්‍රකාශ කිරීම වරදක් නොවේ. එහෙත් ඒ තුළින් කවරෙකු හෝ බුදුදහම ජ්‍යොතිෂය කෙරෙහි පක්ෂපාතීත්වයක් දක්වන්නේ යැයි තහවුරු කිරීමට උත්සාහ කරන්නේ නම් එය සම්පූර්ණ වැරදි මතයකි.

ඉහත සඳහන් දෙවැනි කරුණ අනුව ඇතමෙක් බුද්ධ චරිතය හා බුදුදහමේ අන්තර්ගත ඇතැම් කරුණු තුළින් බුදුදහම ජ්‍යොතිෂය යන්ත්‍ර මන්ත්‍ර කෙරෙහි පක්ෂපාතීත්වයක් දැක්වූ බවට සනාථ කිරීමට උත්සාහගනිති. එවැනි අවස්ථා හා අන්තර්ගත කිහිපයක් පහත පරිදි දැක්විය හැක. බුදුරජාණන් වහන්සේගේ චරිතය හා සම්බන්ධ බුදුසිරිතෙහි අවස්ථාවන් පිරුණු චන්ද්‍රයාගෙන් යුත්

පසළොස්වක පොහොය දිනවලට සම්බන්ධ වීම, උදාහරණයක් ලෙස බුදු සිරිතෙහි ඉපදීම, බුදු වීම, සහ පිරිනිවන්පෑම යන තෙමඟුල පූර්ණ චන්ද්‍රයාගෙන් යුක්ත වෙසක් පොහෝදින සිදුවීම. එවැනි එක් කරුණකි. තවද භික්ෂූන් වහන්සේලා වස් සමාදන් වීමේ අවස්ථාවන්වලදි නැකත් ගැන සැලකිල්ලක් දැක්වීම. (වි. I, පි. 136) සහ බුදුන් වහන්සේ එය ප්‍රතික්ෂේප නොකිරීම, මෙම කරුණු දෙකෙහිම සිදු වී ඇත්තේ පවතින්නා වූ දින ක්‍රමය අනුව කටයුතු සිදුවීම හා ඒ ඒ නියමිත දිනයන්හි කටයුතු යොදා ගැනීම මිස ජ්‍යෝතිෂය සම්බන්ධ වු නැකත් බැලීමක් නොවන බව සඳහන් කළ යුතුය. බුදුරජාණන් වහන්සේගේ ශරීරයෙහි ඇති දෙතිස්මහා පුරුෂ ලක්ෂණ (දී.නි.3.පි.141) ජ්‍යෝතිෂය හා සම්බන්ධ වූ ලක්ෂණ ශාස්ත්‍රයට අදාළ වූවක් බැවින් ඒ තුළින්ද ඇතැමෙක් බුදුදහම ජ්‍යෝතිෂය කෙරෙහි උනන්දුවක් දක්වා ඇති බවට හුවා දක්වනු ලැබෙත්.

ඉහත සඳහන් කරුණුවලට අමතරව බුදුදහම යන්ත්‍ර මන්ත්‍ර ප්‍රතික්ෂේප කිරීමක් දක්වා නොමැත යන්න සනාථ කිරීම සඳහා ඇතැමෙකුට ඉවහල් වන කරුණු කිහිපයක් පිළිබඳව ද ගෙනහැර දැක්වීම ද මෙහිදී වැදගත් වේ. විනය පිටකයට අනුව එක්තරා භික්ෂු නමකට අමනුෂ්‍ය ආබාධයක් ඇති විය. ආචාර්ය උපාධ්‍යායයන් වහන්සේලා එය සුවපත් කිරීමට අසමත් වූහ. එවිට ඒ භික්ෂුව ඌරන් මරණ තැනකට ගෙන ගොස් අමු මස් කා අමු ලේ පිදීය. එවිට අමනුෂ්‍ය රෝගය සංසිඳිණ. මෙය දැනගත් බුදුන් වහන්සේ අමනුෂ්‍ය ආබාධයකදී අමු මස් කෑමට අනුදැන වදාළහ. (වි. I, පි. 202) (සම. 2005. 3. පි. 121) සමන්තපාසාදිකාවෙහි යකැදුරන් විසින් යකුන් විසින් ගන්නා ලද පුරුෂයන් මුදා ගන්නා අයුරු පිළිබඳ සඳහන් වේ. එසේ යක්ෂයන් විසින් යම් පුරුෂයෙක් ග්‍රහණය කරගෙන මුදා නොහරින්නේ නම් මැටියෙන් යක්ෂයාගේ රූපයක් අඹා, එම මැටි රූපයෙහි අත් පා ආදිය කපා හරිනු ලැබේ. එවිට ඒ අනුවම යක්ෂයාගේ අවයවද කැපෙයි. රූපයෙහි හිස කපා දැමු විට යක්ෂයා ද ජීවිතක්ෂයට පැමිණේ. (වි.3.පි.84, සම.I,පි.448) තවද යක්ෂයන් අරක්ගත් විහාරස්ථාන බුද්ධ කාලීනව පැවති බව සඳහන් වේ. එක්තරා භික්ෂු නමක් තම අහිතවත් භික්ෂු

නමක් ඝාතනය කරනු කැමතිව යක්ෂයින් අධිගෘහිත විහාරයට පිටත් කොට යවා ඇත. යක්ෂයින් විසින් ඒ භික්ෂුවගේ දිවි තොර කරන ලදි. (වි.3.පි.84) තවද ඇතැම් අවස්ථාවන්වල අමනුෂ්‍ය අධිගෘහිත භික්ෂූන්ට පහර දී ඒ භික්ෂූන් මරණයට පවා පත්කොට ඇත. (වි.3.පි.85) සමන්තපාසාදිකාවෙහි අමනුෂ්‍යාධිගෘහිතයන්ට ධර්ම කථා කළ යුතු ආකාරය මෙසේ දක්වා ඇත.'' අමනුෂ්‍යාධිග ෘහතයන්ට පහර නොදිය යුතුය. තල්පතක් හෝ පිරිත් නූලක්ගෙන අතෙහි හෝ පයෙහි බැඳිය යුතුය. සිල්වත් භික්ෂූන් නොපෙළනු මැනවැයි. ධර්ම කථා කළ යුතුය'' (සම.I,පි.449) සංයුක්ත නිකාය අට්ඨකථාවෙහි අමනුෂ්‍යයන් චිත්ත වික්ෂේපය කරන අයුරු දක්වා ඇත. (ස.නි.අට්ඨකථා, 1.368,ස.නි.පි.1.206) එමෙන් මන්ත්‍ර ජප කිරීමෙන් කරන විස්මයජනක ක්‍රියාවන් පිළිබඳවද අට්ඨකතාවල සඳහන් වේ. (සම.1.පි.416) බුදුදහමෙහි එවැනි දේ පිළිබඳ අන්තරගත වන්නේ යැයි ඇතමෙකුට හැඟී ගියත් යථෝක්ත සිද්ධින් පැහැදිලි කිරීම් ආදිය විමසිලිමත්ව පරීක්ෂා කරන්නෙකුට අවබෝධ වන්නේ බුද්ධ කාලීනව පැවති ඇතැම් අභිචාර විධි හා විශ්වාස එම පැහැදිලි කිරීම් තුළ අන්තර්ගත වනවා විනා බුදුදහම එවැනි ගර්හිත විද්‍යාවන් පිළිගත්තා යන්න නොවේ.

බුදුදහමෙහි ඇතැම් ඉගැන්වීම්වල ජ්‍යෝතිෂය ලක්ෂණ අන්තර්ගත බව පිළිගැනීමට යමෙක් පෙළඹෙන්නේ පහත කරුණු සැලකිල්ලට ගෙනය. පිරිත් පොතෙහි අන්තර්ගත චන්ද පිරිත (ස.නි, 1.පි.50) සූරිය පිරිත (එම) ආදී දේශනාවන්හි අන්තර්ගත ''රාහු අසුරින්දො '' (රාහු අසුරින්ද්‍රයා යන කියමන) ආටානාටි සූත්‍රයන්හි අන්තර්ගත ඉගැන්වීම් (පිරිත් පොත) රතන සූත්‍රයෙහි අන්තර්ගත ''දිවාච රත්තෝච හරන්ති යේ බලිං (සු.නි. පි.38) එසේම සෙත් පිරිත්වල අන්තර්ගත ''පාපග්ගහෝ දුස්සු පිනං අකන්තං'' යන දේශනා පාඨ මෙන්ම ඛුද්දක නිකායේ නිද්දේසපාළියේ සඳහන් නැකත් 28 (අට්ඨවිසති නක්ඛත්තානි) යන කියමන, ''භික්ෂූන් වහන්සේලා නැකත් පද පිළිබඳ දැනගත යුතුය'' ''නකඛත්තපාදානි උග්ගහෙතබ්බානි සකලානි වා ඒක දෙසානිවා'' (වි.2.පි.216) යන දේශනාවන්ද බුදුදහම ජ්‍යෝතිෂය පිළිගත්තා යැයි සනාථ කිරීමට යොදාගෙන ඇත. ඉහත සඳහන් දේශනා පාඨ මගින් බුදුදහම

ජ්‍යොතිෂය හෝ ඒ හා සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳව උනන්දුවක් දක්වා ඇතැයි ඔප්පු කිරීමට පෙර ඒවායෙහි අන්තර්ගත, පැහැදිලි අර්ථය විවරණය කරගැනීම ඉතා වැදගත් වේ. රතන සූත්‍රයෙහි සඳහන් පාඨයෙන් එනම් ''දිවාච රත්තෝච හරන්ති යේ බලිං'' යන පාඨයෙන් පැහැදිලි වන්නේ දිවා රාත්‍රි දෙවියන් වෙනුවෙන් පූජා (බලිං) පවත්වන බවය. එසේම චන්ද හා සූරිය පිරිතෙහි සඳහන් වන්නේ චන්ද්‍රග්‍රහණය හා සූරියග්‍රහණය පිළිබඳවය. එසේම විනය පිටකයේදී බුදුන් වහන්සේ දක්වා ඇත්තේ ආරණ්‍යවාසි භික්ෂූන්ට හොරුන්ගෙන් වන පීඩා ගැන සලකා නැකත් පද හා දිශාවන් පිළිබඳව අවබෝධයක් ලබා ගත යුතුයි යන්නයි. මෙහි ''නැකත් පද''හා ''දිශා'' යන කියමන් උපුටා දක්වා ඒ මගින් බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේලා ජ්‍යොතිෂය උගැන ගත යුතුයි යන්න අනුදැන වදාරා ඇතැයි, යමෙක් තහවුරු කිරීමට උත්සහා ගන්නේ නම් එය එම පාඨයන්හි හා එහි අන්තර්ගතය එසේ කිමෙහි අරමුණු පිළිබඳව කරුණු අවබෝධ කොට නොගෙන කරන ප්‍රකාශයක් ලෙස මෙහිදී සඳහන් කළ යුතුය. එබැවින් ඉහත සඳහන් දේශනා පාඨයෙන් බුදුන් වහන්සේ ජ්‍යොතිෂය අනුමත කොට ඇතැයි ප්‍රකාශ කිරීම සාවද්‍යය.

කර්ම සිද්ධාන්තය හා ජ්‍යොතිෂය අතර සාම්‍යක් පෙන්වීමට ඇතමෙක් උත්සාහගනිත්. භාරතීය දාර්ශනිකයන් විසින් කර්ම සිද්ධාන්තය පිළිබඳව විවිධ මතවාදයන් ඉදිරිපත් කොට ඇති බැවින් මෙහිදි අප සැලකිල්ලට ගන්නේ බෞද්ධ කර්ම සිද්ධාන්තය ජ්‍යොතිෂය හා බැඳී පවතී යනුවෙන් ඉදිරිපත් කොට ඇති අදහස් පිළිබඳ පමණි. භාරතීය කර්ම සිද්ධාන්තය හා ජ්‍යොතිෂය පිළිබඳව රාමන් මෙසේ පවසයි.''ජ්‍යොතිෂයත් කර්මයත් අන්තර් සම්බන්ධිතය. ජ්‍යොතිෂය මේ ජීවිත කාලය තුළ අපට මතක් කළ නොහැකි වූත් මේ භවයෙදී ගලපා ගත නොහැකිවූ ත් අපේ ක්‍රියාවන්ගේ ප්‍රතිඵල හෙළිදරව් කරයි. අප අපගේ ඉරණම හෝ අදෘෂ්ට නමින් හඳුන්වන්නේ අප නොදන්නා අපේ කර්ම ඵලයි. එබැවින් කර්ම නියාමය නමින් දැක්වෙන්නේ හේතුඵල සම්බන්ධය වේ. (පැට්රික් නාරාවිල, 2005.පි.20) මෙහිදි කර්මයත්, කර්ම ඵලයත් නියතිවාදි දෘෂ්ටිකෝණයක් මත පිහිටා අර්ථ දැක්වීමට රාමන් උත්සාහගෙන

ඇත. කර්මය පිළිබඳ භාරතීය අදහස් නියතිවාදි ස්වරූපයක් ඉසිලුවත් බෞද්ධ කර්ම සිද්ධාන්තයෙහි නියතිවාදි ස්වරූපය අන්තර්ගත නොවේ. බුදුදහමෙහි කර්ම සිද්ධාන්තය විස්තර කොට ඇත්තේ හේතුඵල ධර්මයට අනුරූප වන ආකාරයටය. මෙහිදි හේතුඵල දහම නියතිවාදි ස්වරූපයක් උසුලන්නේ යැයි ඇතමෙකුට හැඟී ගියත් බෞද්ධ හේතුඵල සිද්ධාන්තය නියතිවාදි නොවේ. මන්දයත් හේතු ඵල නියාමනය පවා නියාමනය කිරීමට පුද්ගලයාට ස්වච්ඡන්දතාව ඇති බැවිනි. ''ආරම්භධාතු, සත්තානම් අත්තකරෝ, නික්ඛමධාතු වැනි කියමන්වලින් ඒ බව පැහැදැලි වේ. (බලන්නඃ අ.නි.3.පි.337) තවද බෞද්ධ කර්ම සිද්ධාන්තයෙහි පැහැදිලි වන්නේ පුද්ගල ක්‍රියාවට අනුව ලැබෙන ප්‍රතිඵලයක් මිස ඉරණම්වාදයක් නොවේ. යහපත් ක්‍රියාවට යහපත් ප්‍රතිඵලත් අයහපත් ක්‍රියාවට අයහපත් ප්‍රතිඵලත් ලැබෙන බවය. ''යාදිසං වපතේ බීජං තාදිසං හරතේ ඵලං කල්‍යාණකාරි කල්‍යාණං පාපකාරිච පාපකං'' (ස.නි.1.පි.227) තවද බුදුදහමට අනුව සියල්ලම සිදු වන්නේ කර්මය නිසා නොවේ. ඒ සඳහා බලපාන ස්වාභාවික නියාමයන් 5ක් ඇත. (උතු නියාම, බීජ නියාම, චිත්ත නියාම, කර්ම නියාම, ධර්ම නියාම) කර්මය මෙම පහෙන් එකක් පමණි. නියාම ධර්මයන්ට අනුව ඇතැම් සිද්ධින් ස්වාභාවික බලවේග යන් (අව්ව, වැස්ස, ඉර, හඳ සහ තාරකා ක්‍රියාකාරීත්වය) අනුව සිදුවේ. මෙම ස්වාභාවික සංසිද්ධින් ජ්‍යෝතිෂය හා සම්බන්ධ යැයි හුවා දක්වමින් බුදුදහමෙහි ද ජ්‍යෝතිෂය අන්තර්ගත වන්නේ යැයි ඇතමෙක් ප්‍රකාශ කරත්. ජ්‍යෝතිෂය විෂයය හා ඉර, හඳ, තාරකා අව්ව වැස්ස ආදි ස්වාභාවික සංසිද්ධින් සම්බන්ධ වන බව සත්‍යයකි. එහෙත් බුදුදහමෙහි එම නිගමනයන් දක්වා ඇත්තේ ජ්‍යෝතිෂයට අනුරූපතාවක් දැක්වීමට නොව ස්වාභාවික සංසිද්ධින්ගේ යථා සැවරූපය පැහැදිලි කිරීමටය. ජ්‍යෝතිෂයෙහි සඳහන් පරිදි ඒවා මගින් අදෘශ්‍යමාන බලපෑමක් ලැබෙන බව සඳහන් වේ. එහෙත් බුදුදහමෙහි එය පිළිගැනීමෙන් එවැනි අර්ථයක් කිසිසේත්ම ගම්‍යමාන නොවේ.

තවද, පාප කර්මයන්ගෙන් වැළකීමට බුදුදහම මඟ කියා දෙන්නා සේ ජ්‍යෝතිෂය මගින් ඉදිරියෙදී ඇතිවන ආපදාවන්ගෙ

න් වැළකීමට මග කියා දෙන බව සමහරු විස්වාස කරති. මෙහිදි සඳහන් කළ යුත්තේ බුදුදහම පාපයන්ගෙන් වැළකීමට මග කියා දෙන්නේ හේතුඵලවාදි ධර්මය මතය. එහෙත් ජ්‍යෝතිෂය මග කියා දෙන්නේ ඉරණම්වාදය මත පිහිටාය.

බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානය ජ්‍යෝතිෂයේ දක්නට ලැබෙන අනාගත වැකි කියනවුන් හා සමාන වන්නේද යන්න ද පවතින කුකුසකි. ජ්‍යෝතිෂය අනුව අනාවැකි කියනු ලබන්නේ ග්‍රහ පිහිටිම හා ඒවායෙහි බලපෑම මතය. එහෙත් බුදුරජාණන් වහන්නේ අනාගත පිළිබඳව දේශනා කොට ඇත්තේ කෙලෙස් ප්‍රහීණය කිරීම තුළින්ය. ''උපක්කිලෙසේ, පහිනෝ'' (ස.නි.3.පි333) එබැවින් ජ්‍යෝතිෂය අනාගත වැකි කියනවුන් හා බුදුන්ගේ සර්වඥාතා ඥානය අතර බොහෝ පරස්පරතා ඇත.

ලෝක ප්‍රාරම්භය හා පරිණාමය පිළිබඳ පැහැදිලි කරන අග්ගඤ්ඤ සූත්‍රය එක් අවස්ථාවක සඳ හිරු, නැකත් තරු, රෑ දාවල්, මාස, අර්ධ මාස, ඍතු අවුරුදු (දී.නි.3.පි.85) ආදි පහළවිම සඳහන් කරයි. මෙහි නැකත් තරු පිළිබඳ පැහැදිලි කිරීම ජ්‍යෝතිෂය හා සම්බන්ධ වූවක් යැයි දැක්වීමට උත්සාහගෙන ඇත. මෙහිදී ද සඳහන් කළ යුත්තේ බුදුදහම මෙහිදී දක්වා ඇත්තේ භෞතික ලෝකයේ පරිණාමය පිළිබඳ සිද්ධිදාමය විනා ජ්‍යෝතිෂය හා සම්බන්ධ වූ පැහැදිලි කිරීමක් නොවන බවය.

බුදුදහමේ ජ්‍යෝතිෂය අන්තර්ගත වන්නේ යැයි සනාථ කිරීම යොදා ගන්නා තෙවැනි කරුණ ලෙස ඉහතදී සඳහන් කරන ලද්දේ පසුකාලීනව රචනා වූ බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ තුළින් යන්නය. ඇතමෙක් බෞද්ධ සාහිත්‍යයෙහි විශේෂයෙන්ම ලාංකීය බෞද්ධ සාහිත්‍යයෙහි ඇතැම් කෘතිවල අන්තර්ගත ජ්‍යෝතිෂය පිළිබඳ කරුණු මගින් බුදුදහම ජ්‍යෝතිෂය පිළිගත්තේ යැයි සනාථ කිරීමට උත්සාහ ගනිති. මෙම මතය ඉදිරිපත් කිරීම සඳහා ඉවහල් වූ කෘති පිළිබඳව මෙන්ම ඒවායෙහි අන්තර්ගත ජ්‍යෝතිෂය කරුණු පිළිබඳව ද කෙටියෙන් සලකා බැලීම වටී. ලාංකීය වංශකථාවන් වන දිපවංශයෙහි නැකත් පිළිබඳවත් (දිප.1970-පි. පරි-,ස, ගාථා 78,7, පරි,-9, ගාථා, 32, පරි,- 11, ගාථා 14,15 පරි,-14, ගාථා 40,41) මහාවංශයෙහි අභිෂේක චාරිත්‍ර පිළිබඳවත් (මව. 1959, පරි-7, ගාථා

71, පරි-8, ගාථා 27, පරි-10, ගාථා 77,78) තවද අභිෂේකය පිළිබඳව වංසත්ථප්පකාසිනී නම් වූ මහාවංශ ටීකාවෙහිද (වස. 1994 පිටු, 230,232) සඳහන් වේ. මීට අමතරව රසවාහිනියේ අකුරු කිරීමේ මංගල්‍යයක් හා ඒ හා බැඳී චාරිත්‍ර පිළිබඳව සඳහන් වේ. (රස 2001 පි. 176) තවද සද්ධර්ම රත්නාවලියෙහි අංග ශාස්ත්‍රය පිළිබඳවත් (සර. 2007, පි. 58, 160, 230, 591, 612, 802, 1146, 1165, 1178) පූජාවලියෙහි අෂ්ටාදස ශිල්පය හා සුසැට ශිල්පය පිළිබඳවත් (පූජා. 2008, පිට.151, 329, 591) ධර්මප්‍රදීකාවෙහි නිමිතිකීම සම්බන්ධවත් (ධප්‍ර. 2001 පිට.218, 255, 256) රජු හා ජ්‍යොතිෂය විද්‍යා සංකල්ප පිළිබඳව කඳවුරු සිරිතෙහි හා දඹදෙණි හස්නෙහිද (කෝන්ග ස් තැන්නේ ආනන්ද 1997. පි. 18, 39, 41,48,50,67,68,69,75) ලසු ජාතකයෙහි රාශි ග්‍රහයින් ආදිය පිළිබඳවත් (පි. පේමරාජ 1929) ආදි කරුණු අන්තර්ගත වේ. මෙම පැහැදිලි කිරීම් දෙස සලකා බැලීමේදී පැහැදිලි වන්නේ මේවා එම යුගයන්හි සංස්කෘතින් හා බැඳී පැවති චාරිත්‍ර වාරිත්‍ර විනා බුදුදහමෙහි පිළිගන්නා ලද ඉගැන්වීම් නොවන බවය. කවරෙක් විසින් හෝ කිනම් වූ කරුණක් ගෙන හැර දක්වා බුදුදහමෙහි ජ්‍යොතිෂය පිළිබඳ අන්තර්ගත වන්නේ යැයි සනාථ කිරීමට උත්සාහ ගන්නේ නම් එවැනි පැහැදිලි කිරීම් මුල් බුදුසමය හා සසඳා බැලීමේදී සත්‍ය අසත්‍යතාව වටහා ගත හැක. ඉහත සඳහන් සෑම කරුණක්ම එසේ සසඳා බැලීමේදී පැහැදිලි වන්නේ මුල් බුදුසමය සමග අනුරූපතාවක් නොදක්වන බවය. එබැවින් ජ්‍යොතිෂය පිළිබඳව පිළිගැනීමක් බුදුදහමෙහි අන්තර්ගත නොවන බව මෙහිදී පැහැදිලිවම සඳහන් කළ හැක.

## ජ්‍යොතිෂය, යන්ත්‍ර මන්ත්‍ර හා බෞද්ධ භික්ෂුව (ඓතිහාසික විමර්ශනයක්)

බුදුදහමේ ජ්‍යොතිෂය පිළිබඳ පිළිගැනීමක් හෝ ඉගැන්වීමක් දක්වා නොමැති වුවත් අතීතයේ සිටම භික්ෂූන් වහන්සේ ජ්‍යොතිෂය, යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් ආදිය සිදුකොට ඇති බවට මූලාශ්‍රයවලින් පැහැදිලි කරගත හැක. ඉහතින් සඳහන් කළ පරිදි මහායානයෙහි ඇතැම් නිකායන් යන්ත්‍ර මන්ත්‍ර ආදිය භාවිත කොට ඇති ආකාරය පැහැදිලි වේ. එබැවින් බෞද්ධ භික්ෂුව ජ්‍යොතිෂය යන්ත්‍ර මන්ත්‍ර

ආදියෙහි යෙදුණා යන්න නොරහසකි. බොහෝ මහායාන බෞද්ධ රටවල මෙන්ම ථෙරවාදි රටවල භික්ෂූන් වහන්සේලා ජ්‍යෝතිෂය, යන්ත්‍ර මන්ත්‍ර ආදි ශාස්ත්‍ර භාවිත කළ බවට සාධක ඇත. චීන බෞද්ධ භික්ෂූන් අතර ජ්‍යෝතිෂය පිළිබඳ උගත් පිරිස් සිටි බව සඳහන් වේ. විශේෂයෙන්ම ෂඕ-ලිං පන්සලක ජ්‍යෝතිෂය සමිතියක් පිහිටුවා ගෙන සිටි බව සඳහන් වේ. එසේම චීන චිං රාජ්‍ය වංශයේ රාජ්‍ය උපදේශකවරුන් ලෙස සිටි භික්ෂූන් වහන්සේ ජ්‍යෝතිෂය පිළිබඳ උගත්තු වූහ. තවද ටිබෙට් දේශයෙහි සෑම ආරාමයකම ජ්‍යෝතිෂය දන්නා එක් භික්ෂුවක් වාසය කරයි. බුරුම භික්ෂූන් අතර ඇති ජ්‍යෝතිෂය ක්‍රමය මහාබොතේ (Mahābote) යනුවෙන් හැඳින්වේ. තායි භික්ෂූන් අතර ද ජ්‍යෝතිෂය භාවිත වේ. දෛනික ජීවිතයේ බොහෝ අවස්ථාවලදී තායි ජනයා නැකත් ශාස්ත්‍ර භාවිත කරති.

ප්‍රාග් මහින්ද යුගයේ සිටම ගුප්ත විද්‍යා කෙරෙහි ලාංකිකයා යොමු වී සිටි බවට යක්ෂ හා නාග වන්දනාවලින් පැහැදිලි වේ. එමෙන්ම මහින්දාගමනයෙන් පසුව ශ්‍රී මහා බෝධිය වැඩම විමේදී පැමිණි ශ්‍රේණින් 18 අතර ජ්‍යෝතිෂය පිළිබඳව දන්නා පිරිස් ද වූහ. මේ සටහන් මගින් පැහැදිලි වන්නේ එම වකවානුව වන විට ජ්‍යෝතිෂයේ අවශ්‍යතාව ලාංකියන්ට ද දැනී තිබුණු බවය. මිනිසුන් විසින් ජ්‍යෝතිෂය යන්ත්‍ර මන්ත්‍ර ආදිය පිළිබඳ උනන්දුවක් දැක්වූවත් මුල් කාලීන භික්ෂුව ඒවායෙහි යෙදුණේ ද යන්න සාධක සොයාගැන්ම දුෂ්කරය. ''දඹදෙණි කාලයට පෙර ලක්දිව මහාවිහාර සම්ප්‍රදාය අනුගමනය කළ භික්ෂූන් අතර යකුන් කෙලවීම ආදි දුෂ්ප්‍රතිපත්ති පැවති බවට සාධක ඉදිරිපත් කිරීම අපහසුය. (ධම්ම විසුද්ධි හිමි, යටදොලවත්තේ 1995, පි.135) මේ කියමනෙන් පැහැදිලි වන්නේ දඹදෙණි යුගයට පෙර භික්ෂූන් වහන්සේලා ජ්‍යෝතිෂයෙහි යෙදුණේය යන්න සාධක සොයා ගැනීම අපහසු බව මිස ඊට පෙර භික්ෂූන් වහන්සේලා ඒවායෙහි නොයෙදුණේය යන්න නොවේ. ඊට හේතු නම් මහායානික සම්ප්‍රදායක් වූ අභයගිරි භික්ෂූන් එය නොදැන සිටියේ යැයි කිව නොහැකි බැවිණි. එනම් ගෝඨාභය රජු දවස ලංකාවට පැමිණි සංඝමිත්‍ර නම් භික්ෂුව මහසෙන් කුමරුට අකුරු ඉගැන්වීය. මහායානික

භික්ෂුවක් වූ ඔහු වෛද්‍ය විද්‍යාව, ජ්‍යොතිෂය, යන්ත්‍ර මන්ත්‍ර තන්ත්‍ර ආදිය පිළිබඳ උගතෙක් විය යුතුය. (සාසනරතන, මොරටුවේ, 1999. පි. 370) එබැවින් අනුරාධපුර යුගයෙහි ථෙරවාදි භික්ෂූන් ජ්‍යොතිෂය කෙරෙහි නැඹුරු නොවුණේ වී නමුත් යම් තරමකට හෝ මහායානික භික්ෂූන් ඒ කෙරෙහි නැඹුරුතාවක් දක්වන්නට ඇති බව අනුමාන කළ හැක. නිකාය සංග්‍රහයෙහි සඳහන් පරිදි තාන්ත්‍රික ලක්ෂණ හා විවිධ අභිචාර විධි අන්තර්ගත මහායානික සම්ප්‍රදායන් තුනක් ලංකාවට පැමිණ ඇත. ''වෛතුල්‍යවාදය, වාජිරියවාදය, රත්නකුටාදි ශාස්ත්‍රය යන මේ තුන ශ්‍රී ලංකාද්විපයට ද උපගත විය.''(නිස. 1997, පි. 11) තවද තාන්ත්‍රික ලක්ෂණ බොහෝ සෙයින් අන්තර්ගත ඉහත සඳහන් වාජිරියවාදය නොහොත් වජ්‍රයානය මත්වල සෙන් රජුගේ සමයෙහි (ක්‍රි.ව.833-853) ලංකාවට ගෙනා බව සඳහන් වේ. ''මත්වල සෙන් නම් රජෙක් මෙරට රජ විය. ඒ රජු දවස වජ්‍රපර්වත නිකායවාසි වූ භික්ෂු ප්‍රතිරූපක තීර්ථකයෙක්, දඹදිවින් මෙරට අවුත් වීරාංකුර නම් ආරාමයේ වසනුයේ''(එම. 23). වජ්‍රයානයෙහි ප්‍රධාන ලක්ෂණ බෝධිසත්ත්ව පූජාව තාන්ත්‍රික ලක්ෂණ බව භට්ටාචාර්ය පෙන්වා දෙයි. (ධම්ම විසුද්ධි හිමි, යටදොලවත්තේ 1995, පි. 170) තාන්ත්‍රික බුදුදහමෙහි අන්තර්ගත ගුප්ත විද්‍යා හා මන්ත්‍ර පිළිබඳව අභිලේඛනවලින්ද පැහැදිලි වේ. නවවන ශත වර්ෂයට අයත් අක්ෂරවලින් ලියන ලද අනුරාධපුරයෙන් සොයාගන්නා ලද තඹ තහඩුවක ''ඕං වජ්‍රාති ක්ෂ රං''යන මන්ත්‍ර පාඨයෙන් පරණවිතාන මහතාට අනුව ගම්‍යවන්නේ තාන්ත්‍රික දෙවියෙකුට ආමන්ත්‍රණය කිරීමකි. (cj.sg.vo1.II.p. 47) අනුරාධපුරයට උතුරින් පිහිටි විජයාරාමයේ ස්ථූපයක තිබී සොයාගන්නා ලද 9 වන ශත වර්ෂයට අයත් තඹ තහඩුවල ද ගුප්ත තාන්ත්‍රික මන්ත්‍ර ඇතුළත් කොට ඇත.''එහි ඕං කිලි කිලි කුරු කුරු ස්වාහා'' යනුවෙන් සඳහන් වේ. මෙම පාඨයෙන් ද තාන්ත්‍රික මන්ත්‍රවල ස්වභාවය පැහැදිලි වන බව පරණවිතාන මහත පෙන්වා දෙයි. (එම.පි.49,50) ඉහත සාධකවලින් පැහැදිලි වන 9 වන ශත වර්ෂයේ පමණ එනම් වජ්‍රයානය පැතිර තිබූ සමයෙහි ඇතැම් මාහායානික භික්ෂූන් ගුප්ත විද්‍යාවන් වූ මන්ත්‍ර යන්ත්‍ර පිළිබඳ කටයුතු සිදුකොට ඇති බව පැහැදිලිය. වජිරියවාදයේ ඉගැන්වීම් ක්‍රි.ව.15 ශත වර්ෂය දක්වා පවතින්නට ඇති බව

පරණවිතාන මහතාගේ මතයයි. (එම.පි.54) මහායානයේ තාන්ත්‍රික ඉගැන්වීම් පසුකාලීන ථේරවාද භික්ෂූන් කෙරෙහිද බලපාන්නට ඇතිබව වර්තමානයේ භික්ෂූන් වහන්සේලා සිදුකරන ලබන යන්ත්‍ර මන්ත්‍ර අධ්‍යයන කිරීමේදි පැහැදිලි වේ. ලාංකීය ථේරවාද භික්ෂුව යන්ත්‍ර මන්ත්‍ර කෙරෙහි නැඹුරුවීම තන්ත්‍රයානය නිසා පමණක් සිදුවූවක් නොවේ. පොළොන්නරු යුගයේ සිටම හින්දු සිරිත් විරිත් සමාජයෙහි තදින්ම පැතිරෙන්නට වූ බව පෙනේ. මෙසේ හින්දු සිරිත් විරිත් සමාජයෙහි පැතිරිම ද භික්ෂූන් වහන්සේලා යන්ත්‍ර මන්ත්‍ර කෙරෙහි නැඹුරුවීමට බලපාන්නට ඇත. (ධම්ම විසුද්ධි හිමි, යටදොලවත්තේ 1995.පි.136) තවද පවතින ආර්ථික, සමාජීය හා සංස්කෘතික වෙනස්කම්වලට අනුව භික්ෂූන් වහන්සේලා ද වෙනස්විමේ ප්‍රතිඵලයක් ලෙස යන්ත්‍ර මන්ත්‍ර කෙරෙහි භික්ෂූන් වහන්සේලා නැඹුරුවීම සිදු වන්නට ඇත. උදාහරණයක් ලෙස මාඝගේ පාලන කාලයෙහි භික්ෂූන් වහන්සේලාට බොහෝ ආර්ථික දුෂ්කරතාවලට මුහුණපාන්නට සිදුවිය. එබැවින් ජීවනෝපායක් ලෙස යකුන් කෙලවීම ආදි ක්‍රියාවන්ට භික්ෂුව පෙළඹෙන්නට ඇත. (එම.පි.136)

දඹදෙණි කතිකාවතෙහි සඳහන් පරිදි එම යුගය වන විට භික්ෂූන් වහන්සේලා ගිහියන්ට ශ්ලෝක බැඳ කීම, රෝගාබාධවලට යකුන් කෙලවීම, බලි තිබීම්, බලිබත් කියවීම ආදි කටයුතුවල සම්බන්ධ සිටි බවට සඳහන් වේ. ''උපන් රෝගය නිසා යකුන් කෙලවීම බලි තිබීම්, බලිබත් කියවීම ආදි'' (දක.1985.පි.118) නිකාය සංග්‍රහයෙහි සඳහන් උභයවාස (නිස.පි.28) භික්ෂූන් වහන්සේලා අතර මතභේදයක් ඇති වී අසමගිය වර්ධනය වූ බව සඳහන් වේ. මෙම උභයවාස (ග්‍රාමවාසි-ආරණ්‍යවාසි) භික්ෂූන්වහන්සේලා අතර අසමගිය ඇතිවීමට හේතු වූ කාරණා අතර එකල පැවති භික්ෂූන්ගේ දුෂ්ප්‍රතිපත්ති වූ යකුන් කෙලවීම, බලි තිබීම්, බලි බත් කියවීම ආදිය හේතුවන්නට ඇති බව අනුමාන කෙරේ. (ධම්ම විසුද්ධි හිමි, යටදොලවත්තේ, 1995. පි. 68) මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ යථොක්ත යුගයන්හි භික්ෂූන් වහන්සේලා යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් ආදියෙහි යෙදි සිටි බවය. යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් පමණක් නොව භික්ෂූන් වහන්සේලා ජ්‍යෝතිෂය ශාස්ත්‍රයෙහි පවා යෙදි

සිටි බව දඹදෙණියේ රජකළ II පරාක්‍රමබාහු රජුගේ කාලයෙහි අනවමදර්ශි නැමැති හිමිනමක් විසින් දෛවඥකාමධෙනුව සහ පරෝපකාරය යන නම්වලින් ජ්‍යෝතිෂ්ශාස්ත්‍රිය ග්‍රන්ථ දෙකක්ම සංස්කෘත භාෂාවෙන් රචනා කිරීමෙන් පැහැදිලි වේ. (සාහිත්‍ය, දඹ.කලා.1958.පි.121) තවද නුවර යුගයේ රචිත සඟරාජවත අනුව එකල සිටි ගණින්නාන්සේලා විසින් ද ජ්‍යෝතිෂය යන්ත්‍ර මන්ත්‍ර ආදි ශාස්ත්‍රයන්හි නියැලි සිටි බවට සඳහන් වේ. එහි සඳහන් පරිදි ගණින්නාන්සේලා ''නැකත් වෙදකම් ගොවිතැන් වෙළඳාම් ආදී වූ අකර්තව්‍යයෙහි යෙදී රන් රිදී ආදිය පිළිගනිමින් මිත්‍යාජිවයෙන් ජිවත්ව දන් උයන්නට මාගමුන් කැන්දගෙන දුශ්ශිලව වසන'' ආදියෙහි යෙදී සිටි බව සඳහන් වේ. (සංඝරාජ සාදුචරියාව. 1997.පි.3) දැනට පරිත්‍රාන ධර්ම දේශනාවලදී සජ්ඣායනය කරන පිරිත් පොත් වහන්සේ සකස් කිරීම එසේම පිරිවාන පොත් වහන්සේ තුළ සිවලී යන්ත්‍රය, රත්නමාලි යන්ත්‍රය ආදි යන්ත්‍ර අන්තර්ගත වීමෙන් පැහැදිලි වන්නේ බෞද්ධ අභිචාර විධි කෙරෙහි ඒ ඒ යුගයන්හි භික්ෂූන් වහන්සේලා අතර වර්ධනය වෙමින් තිබූ ජ්‍යෝතිශාස්ත්‍රය යන්ත්‍ර හා මන්ත්‍ර බලපා ඇති බවය. මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ බුද්ධ ධර්මයේ ජ්‍යෝතිෂය විෂය පිළිනොගන්නේ නමුදු විවිධ අවශ්‍යතා මත හා විවිධ බලපෑම් මත පසුකාලිනව විසූ ලාංකිය හා විදේශිය භික්ෂූන් වහන්සේලා විසින් ජ්‍යෝතිශාස්ත්‍රය යන්ත්‍ර මන්ත්‍ර ආදි ශාස්ත්‍රයන් අධ්‍යයනය කිරීම ඒ මගින් මහජනයාට සේවාවන් ලබාදීම සිදුකොට ඇති බවය.

### ජ්‍යෝතිෂය පිළිබඳ බෞද්ධ මතය

බුදුදහමේ ජ්‍යෝතිෂය ප්‍රතික්ෂේප කොට ඇත්තේ ඇයි ද යන්න විමසා බැලීමට ප්‍රථම බුදුරජාණන් වහන්සේ විසින් ජ්‍යෝතිෂය පිළිබඳ දක්වා ඇති අදහස්, එසේම එය ප්‍රතික්ෂේප කොට ඇති අවස්ථා මෙන්ම පසුකාලීනව ලාංකේය සමාජයෙහි කතිකාවත්වලින් භික්ෂූන් වහන්සේලා ජ්‍යාතිෂය නොකළ යුතු බවට සඳහන් කොට ඇති නීති රීති පිළිබඳවද කෙටියෙන් සඳහන් කළ යුතුය. බුදුරජාණන් වහන්සේ විසින් ජ්‍යෝතිෂය, නක්ෂත්‍රය, යන්ත්‍ර, මන්ත්‍ර, පේන කීම, අනාවැකි කීම ආදි ගර්හිත විද්‍යාවන් භික්ෂුවකට නොගැළපේ යැයි ඉතා පැහැදිලිවම දක්වා ඇත්තේ

බ්‍රහ්මජාල සූත්‍රයේය. (සිංහල දික්සගිය,1998.පි.5) එම සූත්‍රයෙහි අන්තර්ගත තිරශ්චීන විද්‍යාවන් වර්තමාන භික්ෂුව විසින් සිදුකරන ලබන ජ්‍යෝතිෂය ආදි කටයුතු සමඟ සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමට ඉවහල් වන බැවින් මෙහිදි එම තිරශ්චීන විද්‍යාවන් සංක්ෂේපව හෝ දැක්විය යුතුය. බුදුන් වහන්සේ මෙහිදී දක්වා ඇත්තේ,

''ඇතැම් මහණ බමුණන් ගිහියන් සැදැහයෙන් දුන් බොජුන් වළඳා අංග නිමිති, උත්පාද, ස්වප්න, පුරුෂ ලක්ෂණ, වස්ත්‍ර මීයන් කෑම ආදිය පිළිබඳ නිමිති කීම, ධාන්‍යවලින් ලේවලින් ගිනි දෙවියන් පිදීම, ශරීරාංග, ගෙබිම්, නීති, සොහොන් ජප, යක්ෂ ප්‍රලය, බිම්ගෙහි මන්ත්‍ර ඉගැනිම, මන්ත්‍ර ජප කොට සර්පයන් ගෙන්වීම, සර්ප විෂ බැස්ස වීම, විස රුද වීම, සතුන්ගේ හඬ අසා පලාඵල කීම, ජීවත්වන කාල ප්‍රමාණය කීම ඊබැදුම, ඊය නොවැදෙන්නට ගුරුකම් කීම, තිරිසනුන්ගේ අදහස් කීම ආදි තිරශ්චින විද්‍යාවන්ගෙන් ජීවිකාව ගෙන යත්''

''ඇතැම් මහණ බමුණන්, මැණික් දුනු, ඊතල ආදි වස්තුන්ගේද ස්ත්‍රී පුරුෂ ආදින්ගේද, හස්ති අශ්ව ආදි සතුන්ගේද යන මෙකී දැ පිළිබඳ ලක්ෂණ අනුව පලාඵල කිම් ආදි තිරශ්චීන විද්‍යාවන්ගෙන් දිවිපෙවෙත ගෙවත්''

''ඇතැම් මහණ බමුණන් රජුන්ගේ දිනිම්, පැරදිම්, සතුරන් පැමිණිම, රටේ රජු පැන යෑම ආදිය පිළිබඳ අනාවැකි කියමින් දිවිපෙවෙත ගෙවත්''

''ඇතැම් මහණ බමුණන් චන්ද්‍රග්‍රහණ, සූර්ය ග්‍රහණ, නක්ෂත්‍ර ග්‍රහණ සඳ හිරු, නැකත් තරු නිසිමගින් ගමන් කිරීම, ඒවා උදාවීම බැසයාම, පොළව කම්පා වීම, වැස්ස නොමැතිව ගෙරවීම යන මේවා සිදුවන වකවානු හා එයින් සිදුවන පලාඵල කීම ආදි තිරශ්චීන විද්‍යාවන්ගෙන් දිවිපෙවෙත ගෙවත්''

''ඇතැම් මහණ බමුණන් නැකත් බලා වැසි ඇති නැති වන කාලය, ආහාර සුලභවන කාලය, රටට කරදර වන කාලය නොවන කාලය, මෙකී තිරශ්චීන විද්‍යාවන්ගෙන් දිවිපෙවත ගිනියත්''

''ඇතැම් මහණ බමුණන් අවාහ විවාහ, වෙන්වූ අඹු

සැමියන් එක් කිරීම, එක්වූ අඹු සැමියන් වෙන් කිරීම, දුන් ණය ලැබෙන්නට සැලැස්වීම, ණය හෝ පොළියට මුදල් දීම යන මේවාට නැකත් කීම, සම්පත් දියුණු වීමට හෝ පිරිහිමට මන්ත්‍ර ජප කිරීම ද නැසෙන දරුගැබ් රැක්මට පිළියම් කිරීම, දිවගුළුලෑම, හනු තදකෙරුම, අත් පෙරලිම, කන් අගුළුලෑම, පේන බැලීම, කුමාරියන් ලවා ද යක්දෙස්සන් ලවා ද පේන කියැවීම, හිරු පිදුම, මහබඹු පිදුම මන්ත්‍ර බලයෙන් හෝ බෙහෙත් බලයෙන් මුවින් ගිනි නිකුත් කිරීම, මතුරු බලයෙන් සිරිකත කැඳවිම යන මෙකී නොකී මිත්‍යා ජීවයෙන් වෙසෙත්''

මීට අමතරව බලි කර්ම කිරීම, මන්ත්‍ර කියා මුණ සේදීම, දෙවියන්ට බාර වීම, බාර ඔප්පු කිරීම ආදි තිරශ්චීන විද්‍යාවන් හි මහණ බමුණන් යෙදුණු බව බ්‍රහ්මජාල සූත්‍රයෙහි සඳහන් වේ.

මෙලෙස එකල මහණ බමුණන් ගිහියන් සැදැහයෙන් දුන් බොජුන් වළදා නොයෙක් තිරශ්චීන විද්‍යාවන්හි යෙදුණු බව දේශනාකොට බුදුන් වහන්සේ පෙන්වා දුන්නේ ශ්‍රමණභවත් ගෞතමයන් වහන්සේ වූ තමා එකී මිථ්‍යා ජීවයන්ගෙන් හා ඒ හා සම සෙසුත් මිථ්‍යා ජීවයන්ගෙන් තොරව වෙසෙන සේක යනුවෙනි. මෙහිදී බුදුන් වහන්සේ පැහැදිලිව දක්වා ඇත්තේ ගිහියන් සැදැහයෙන් දුන් බොජුන් වළදා ඉහත සඳහන් මිත්‍යා ජීවයෙන් භික්ෂුවක් ජීවත් වේනම් එය භික්ෂු ජීවිතයට නුසුදුසු බවය. එසේම තමාද ආදර්ශයෙන් පෙන්වා එසේ නොකරන බැවින් භික්ෂුවද එසේ නොකළ යුතු යන්න බව ඉහත සඳහන් දේශනාවෙන් ගම්‍යමාන වේ. බුදුන් වහන්සේ විසින් භික්ෂුවක් ජ්‍යෝතිෂය, නක්ෂත්‍ර, යන්ත්‍ර මන්ත්‍ර බලි තොවිල්වල නොයෙදිය යුතුයි යන්න සනාථ කිරීමට ඉහත සඳහන් බ්‍රහ්මජාල සූත්‍රයේ පැහැදිලි කිරීම ම ප්‍රමාණවත් වේ. මෙම කරුණු සලකා බලා ඉතා පැහැදිලිව සඳහන් කළ යුත්තේ කිසිවිටත් බුදුදහම තුළ භික්ෂුවක් විසින් ජ්‍යෝතිෂය කළ යුතුයි යන්න අනුමත කොට නැති බවය. එවැනි විශ්වාසයන් කෙරෙහි බුදුදහම සැලකිල්ලක් දක්වා නොමැති බවය. එසේම එවැනි ඉගැන්වීම් බුදුදහමේ පරම නිෂ්ඨාවට පාදක නොවන බැවින් එම ඉගැන්වීම් තිරශ්චීන විද්‍යා හෝ ගර්හිත විද්‍යා ලෙස නම් කොට බැහැර කොට ඇත යන්නය.

බුදුරජාණන් වහන්සේ විනය පිටකයෙදී භික්ෂූන් වහන්සේලාට තිරශ්චීන විද්‍යාව හැදෑරීම තහනම් කොට ඇත. විනය පිටකයේ සඳහන් පරිදි ඡබ්බග්ගිය භික්ෂූන් වහන්සේලා තිරශ්චීන විද්‍යාව අධ්‍යයනය කරමින් සිට ඇත. ''තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛු තිරච්ඡානවිජ්ජං පරියාපුනන්ති'' (වි.II.පි.139) මෙය දැනගත් බුදුන් වහන්සේ අනුදැන වදාළේ යම් භික්ෂුවක තිරශ්චීන විද්‍යාවන්හි නිරත වන්නේ නම් දුකුලා ඇවතක් සිදු වේ යන්නයි. ''න භික්ඛවේ තිරච්ඡානවිජ්ජා පරියාපුණිතබ්බා යො පරියාපුණෙය්‍ය ආපත්ති දුක්කටස්ස'' (එම) මෙහි ''තිරච්ඡානවිජ්ජා'' යැයි දක්වා ඇත්තේ බ්‍රහ්මජාල සූත්‍රයෙහි සඳහන් තිරච්ඡාන විද්‍යාවන්ම විය යුතුය. ඉහතින් සඳහන් කළ බ්‍රහ්මජාල සූත්‍රයේහි තිරශ්චීන විද්‍යාවන්ට අයත් වන විෂය ක්ෂේත්‍රය පැහැදිලිව දක්වා ඇත. එබැවින් චුල්ල වග්ග පාළියෙහි ද යොදා ඇත්තේ එම අර්ථයෙන්ම විය යුතුය.

ජාතක අට්ඨකතාවෙහි නක්ඛත්ත ජාතකයෙහි දක්වා ඇත්තේ ''අනුවණයා සුභ දවස් බලමින් සිටි එහෙත් වාසනාව හැමදාම ඔහුගෙන් ගිලිහෙත්, වාසනාවෙහි ග්‍රහයා වාසනාවමය, හුදු ග්‍රහයන්ට ලැබිය හැක්කේ කුමක්ද'' ''නක්ඛත්තං පතිමානෙන්තං අත්ථො බාලං උපච්චගා - අත්ථො අත්ථස්ස නක්ඛත්තං, කිං කරිස්සන්ති තාරකා'' (ජාඅ.I.පි.258) මෙහිදි පැහැදිලිව දක්වා ඇත්තේ වාසනාව උරගා බැලීම සඳහා නක්ෂත්‍ර විෂයෙහි සහය පැතිම නිශ්ඵල ක්‍රියාවක් බවය. එසේ කිරීමෙන් ඇතැම් විට පුද්ගලයා බොහෝ කරදරවලට හා අපහසුතාවන්ට මුහුණ දෙන්නට සිදු වන බව ජාතක කතාව වැඩිදුරටත් පැහැදිලි කරයි. වර්තමානයේ පවා ඇතැම් මිනිසුන් නක්ෂත්‍ර විද්‍යාවෙන් තම වාසනාව උරගා බැලීමට ගොස් අවාසනාවන්ත ලෙස නොයෙක් කරදර, අපහසුතාවන්ට මුහුණ දුන් අවස්ථා ජනසමාජය තුළ දක්නට ඇත.

ඉහත සඳහන් කරුණුවලට අනුව පැහැදිලි වන්නේ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට ජ්‍යෝතිෂය කිරීම නුසුදුසු යැයි දක්වා ඇති බවය. ගිහියන් විසින් සැදැහයෙන් දුන් බොජුන් වළඳා සිල්වතෙකු විසින් එවැනි දෑ කිරීම නුසුදුසු බැවින් තමාද එම විෂයන්වලින් වෙන් වී කටයුතු කරන බව බ්‍රහ්මජාල

සූත්‍රයෙහි දක්වා ඇත. භික්ෂුවට එවැනි දෑ කිරීම නුසුදුසු බැවින් විනය පිටකයෙදී එම තිරශ්චීන විද්‍යාවන්ගේ නියැලීම දුකුලා ඇවතක් සිදුවන බව දක්වා එසේ කිරීම තහනම් කොට ඇත. එසේම ජාතකට්ඨකතාවේදී ජ්‍යොතිෂය විෂයෙහි ඇති නිශ්ඵලතාව දක්වා තමාගේ කටයුතු කරගැනීම සඳහා ජ්‍යොතිෂය නැකත්වල පිහිට පැතීම අනුවන ක්‍රියාවක් ලෙස දක්වා ඇත. මේ කරුණු සියල්ල සම්පිණ්ඩනය කොට බැලීමේදී පැහැදිලි වන්නේ බුදුදහම ජ්‍යොතිෂය විෂය හැදෑරීම, අනුගමනය කිරීම, ඒ පිළිබඳ විශ්වාස තැබීම ප්‍රතික්ෂේප කොට ඇත යන්නයි.

ඉහතින් සඳහන් කරන ලද බුද්ධ දේශනාවන්වල පමණක් නොව පසුකාලීනව ලාංකේය කතිකාවත් හා සෙල්ලිපිවලින් ද පැහැදිලි වන්නේ භික්ෂූන් වහන්සේලා දුෂ්ප්‍රතිපත්තින්වලින් මුක්ත විය යුතු බවය. (මෙහි දුෂ්ප්‍රතිපත්තින් වශයෙන් දක්වා ඇත්තේ භික්ෂූන් වහන්සේලාට නුසුදුසු ක්‍රියාවන්ය) ''පැරණි කතිකාවත්වල ප්‍රධාන අරමුණ භික්ෂූන්ගේ දුෂ්ප්‍රතිපත්ති නැති කොට උන්වහන්සේලා යහපත් ශ්‍රමණ ජීවිතයකට පුරුදු කරවීමයි'' (ධම්ම විසුද්ධි හිමි, යටදොලවත්තේ 1995.පි.15) ජේතවනාරාම සංස්කෘත සෙල්ලිපියේ දක්වා ඇත්තේ මිථ්‍යාජීවයෙන් යුක්ත (භික්ෂුව) ද මවුපියන් හැර ස්ත්‍රීන් පෝෂණය කරන භික්ෂුවද (මේ විහාරයෙහි) නොවිසිය යුතු යන්නයි.''මිත්‍යාජීවිනා න ච, ස්තව්‍යං කේණ නවස්තව්‍යම්, අන්‍යත්‍ර මාතා පීතෘභ්‍යාම්'' (Ez.I.no.I.pp.4.5.lines 12.20) මෙහි සඳහන් මිත්‍යා ආජීවයන්ට, ජ්‍යොතිෂය හා නක්ෂත්‍ර විද්‍යාවන් ඇතුළත් නොවේ යැයි කිව නොහැක. මන්දයත් මෙම සෙල්ලිපිය පිහිට වූ යුගය ලෙස අනුමාන වශයෙන් සැලකෙන ක්‍රි.ව. 9වන ශත වර්ෂය (Ez.i.p.4) වන විට වජ්‍රයානයේ බලපෑම බෙහෙවින් ඇති වී තිබූ බව නිකාය සංග්‍රහයෙහි සඳහන් වේ. (නි.ස.1997.පි.82) සමන්තපාසාදිකාවෙහි දක්වා ඇති ආකාරයට සංගායනා පවත්වන ලද්දේ පරවාද මර්දනය කොට ශාසන මල පහකොට පිරිසිදු සද්ධර්මය සංග්‍රහ කිරීමටය. (සම.2003 පි.7) ඒ ආකාරයෙන්ම ලාංකේය කතිකාවත් පිහිටුවන ලද්දේ භික්ෂූන්ගේ දුෂ්ප්‍රතිපත්ති දුරුකොට මහණ දම් දියුණු කිරීමෙන් ශාසනය ආරක්ෂා කරගැනීම සඳහාය. (කතිකාවත් සඟරා I.පි.35) යන

උදෘත දෙක උපුටා දක්වා යටදොල වත්තේ ධම්ම විසුද්ධි හිමියන් කතිකාවන්වල අරමුණ පැහැදිලිව දක්වා ඇත. (ධම්ම විසුද්ධි හිමි,යටදොලවත්තේ 1995,පි.19.20)

පළමුවන විජයබාහු රජුගෙන් පසු රටේ ඇති වූ පරිහානිය පිළිබඳව වාර්තා කරන මහාවංස කතුවරයා භික්ෂූන් වහන්සේලාගේ පරිහානිය දක්වා ඇත්තේ ''ලාභාපෙක්ෂාවෙන් සසුන කෙලෙසූ දුෂ්ශීලයන් සහ මහණකම ජීවන මාර්ගයක් කොටගත් භික්ෂූන් (මව.76.19,71.5) යනුවෙන්ය. මෙලෙස භික්ෂූන් වහන්සේලා ආමන්ත්‍රණය කිරීමට හේතුවන්නට ඇත්තේ භික්ෂූන් වහන්සේලා තුළ පැවැති දුෂ්ප්‍රතිපත්තීන් නිසා වෙනි. (එනම් අඹු දරුවන් පෝෂණය කිරීම, ගර්හිත විද්‍යාවන්වල නිරතවීම ආදිය විය හැක)

දඹදෙණි කතිකාවෙහි ද එම භික්ෂූන් වහන්සේලාගේ දුෂ්ප්‍රතිපත්තීන් සැලකිල්ලටගෙන සඳහන් කොට ඇත්තේ භික්ෂූන් වහන්සේලා යකුන් කෙලවීම, බලි තිබ්ම, බලි බත් කියවීම ආදි යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්වලට සම්බන්ධ, නොගැළපෙන දෑ නොකළ යුතුයි යන්නයි. ''උපන් රෝගය නිස යකුන් කෙලවීම, බලි තිබ්ම, බලි බත් කියවීම ආදි නොසරුප් දෑ නොකළ යුතුය.'' (දක.1985.පි.118) තවද මහා පරාක්‍රමබාහු රජතුමා පොළොන්නරු කතිකාවත සකසන්නේ ද භික්ෂූන් වහන්සේලා තුළ තිබූ යථොක්ත දුෂ්ප්‍රතිපත්ති සකස් කිරීම සඳහාය. එහි සඳහන් පරිදි ''අඥාන දුර්ඥාන මූලක අප්ප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති විෂවෙග විහතවැ අපායාන්නව ශාසනාවචර කුලප්‍රත්‍රයන් දැකැ'' (පොළොන්නරු කතිකාවත - 1985 පි.97). මෙහි ජ්‍යොතිෂය හා යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් පිළිබඳව සඳහන් නොවුණත් මෙම දුෂ්ප්‍රතිපත්තීන්ට එවැනි ක්‍රියාවන් අයත් නොවූයේ යැයි කිව නොහැක. මන්දයත් මේ යුගයවන විට ඇති වී තිබූ දේශපාලන ආර්ථික බලපෑම් හේතුවෙන් භික්ෂූන් වහන්සේලා එවැනි ක්‍රියාවල යෙදෙන්නට ඇතැයි අනුමාන කළ හැක. (බලන්න, ධම්ම විසුද්ධි හිමි,යටදොලවත්තේ.1995.පි.39) නුවර යුගයේ රචිත සංඝරාජ සාධු චරියාවෙන් (සඟරාජවත) තුළින්ද පැහැදිලි වන්නේ එම යුගයේ විසූ භික්ෂූන් වහන්සේලාගේ දුෂ්ප්‍රතිපත්ති වූ අඹු දරුවන් පෝෂණය කිරීම, යන්ත්‍ර මන්ත්‍ර ආදියෙහි යෙදීම (සංඝරාජ සාධු චරියාව.1997.පි.3) ආදිය නැති

කොට සංඝරාජ හිමියන් විසින් උත්සහා කරන ලද්දේ නැවතත් පිරිසිදු ශාසනය පිහිටුවා භික්ෂූන් වහන්සේලා අතර මහණදම් ඇති කිරීමටය. ඒ සඳහාම උන්වහන්සේ සිල්වත් සමාගම නම් භික්ෂු සමාගමක්ද ආරම්භ කළහ.

ඉහත සඳහන් කරුණුවලින් පැහැදිලි වන්නේ ලාංකිය සමාජයේ භික්ෂූන් වහන්සේලා අතර වර්ධනය වූ දුෂ්ප්‍රතිපත්තින් ( අඹු දරුවන් පෝෂණය කිරීම, නක්ෂත්‍ර කිරිම ආදිය) ලාංකිය භික්ෂු සමාජයෙන් තුරන් කිරීමට රජවරුන් හා ඇතැම් භික්ෂූන් වහන්සේලා විසින් කටයුතු සිදු කොට ඇති බවයි. එම උත්සහායන්ගේ ප්‍රතිඵල කොතෙක් දුරට සාර්ථක වූයේ දැයි කිව නොහැකි වුවත් ඉතිහාසයේ සිටම භික්ෂූන් වහන්සේලාගේ දුෂ්ප්‍රතිපත්තින් බොහෝ විට ජනසමාජය අනුමත කොට නොමැති බව ඉහත කරුණුවලින් පැහැදිලි වේ. එහෙත් භික්ෂූන්ගේ එම ප්‍රතිපත්තින් අනුමත කළ පිරිසක් නොසිටියේ යැයි කිව නොහැක. ඊට හේතුව නම් මහාවංශයෙහි සඳහන් පරිදි භික්ෂූන් වහන්සේලා සමඟ අඹු දරුවන් ලෙස කටයුතු කළ පිරිසක්ද සිටි බැවිණි. (ම.ව.67.2) කෙසේ වෙතත් භික්ෂූන් වහන්සේලාගේ දුෂ්ප්‍රතිපත්තින් වැළැක්වීමට උන්වහන්සේ විසින් ආදර්ශයෙන් හා විනය නිති පැනවීමෙන් මග කියා දුන්නා සේම, ලාංකිය ඉතිහාසයේද එවැනි ප්‍රතිපත්තින් භික්ෂූන් සමාජයෙන් තුරන් කිරීමටත්, භික්ෂූන්ගේ එවැනි ප්‍රතිපත්තීන් පිළිනොගැනීමටත් ඇතැම් රජවරුන් විසින් හා ථෙරවරුන් විසින් කටයුතු සිදුකොට ඇත යන්න ඉහත සඳහන් කරුණුවලින් සනාථ කළ හැකි නිගමනය වේ.

**බුදුදහමේ ජ්‍යෝතිෂය ප්‍රතික්ෂේප කොට ඇත්තේ ඇයි?**

බුදුදහම ජ්‍යෝතිෂය ප්‍රතික්ෂේප නොකරන බව ඇතමෙක් දක්වත්.''ස්ථිර ලෙසින් කියතොත් බුදුරජාණන් වහන්සේ වෙනත් විෂයන් ගැන දක්වා ඇති පරිදි ජ්‍යෝතිෂයශාස්ත්‍රය ගැන නියම වශයෙන් කිසිදු ප්‍රකාශයක් කර නැති සේය. උන්වහන්සේ වදාරා ඇත්තේ මෙවැනි ලෞකික විෂයයන් පිළිබඳ සාකච්ඡා අධ්‍යාත්මික සංවර්ධනයට අදාළ නොවන බවකි. ඇතැම් වෙනත් ආගම් මෙන් බුදුසමය ජ්‍යෝතිෂය ප්‍රතික්ෂේප කර නැත.'' (ධම්මානන්ද. කේ.

1992 පි.352) මෙම ප්‍රකාශය පිළිබඳ ඉතා සැලකිල්ලෙන් විමසා බැලිය යුතුය. බුදුරජාණන් වහන්සේ ස්ථිර ලෙස ජ්‍යෝතිෂය පිළිබඳ අදහසක් ඉදිරිපත් කොට නැත්තේ එහි සත්‍ය හෝ අසත්‍යතාව පිළිබඳ කරුණු දැක්වීමට උන්වහන්සේට අවශ්‍යතාවක් නොතිබුණ නිසා විය හැක. එහෙත් අන්‍ය ආගම්වල මෙන් බුදුදහමෙහි ජ්‍යෝතිෂය ප්‍රතික්ෂේප කොට නැතැයි සඳහන් කිරීම යෝග්‍ය නොවේ. ඒ මගින් බුදුදහම ජ්‍යෝතිෂය පිළිගත්තා යැයි ගම්‍යමාන වන බැවිණි. ඉහතින් සඳහන් කළ බ්‍රහ්මජාල සූත්‍රයේ පැහැදිලිව දක්වා ඇත්තේ ගිහියන් විසින් සැදැහයෙන් දුන් බොජුන් වළඳා භික්ෂුවක් විසින් හෝ වෙනත් ශ්‍රමණයෙකු විසින් එසේ ජ්‍යෝතිෂය ආදි කටයුතුවල නිරත වීම යෝග්‍ය නොවන බවය. එනම් භික්ෂුව ජ්‍යෝතිෂයෙහි නොයෙදිය යුතුයි යන්න නොවේද?

බුදුරජාණන් වහන්සේ විසින් ජ්‍යෝතිෂය පිළිබඳ දක්වා ඇත්තේ එය අධ්‍යාත්මික සංවර්ධනය ඉවහල් නොවන විෂයක් බවය. බුදුදහමෙහි පරම අපේක්ෂාව විමුක්ති සාධන යයි. ඒ සඳහා ඉවහල් වන නිවැරදි මාර්ගය උන්වහන්සේ විසින් දේශිතය. ආර්ය අෂ්ටාංගික මාර්ගය මත පදනම් වූ මධ්‍යම ප්‍රතිපදාව ඒ සඳහා ඉවහල් වන මාර්ග යයි. මෙම මාර්ගය අනුගමනය කරමින් සන්තානගත ක්ලේශයන් මුලිනුපුටා දැමීම මගින් නිර්වාණය ලබාගත හැක. මෙය බුදුන් වහන්සේ විසින් දේශනා කොට ඇත්තේ ''මහණෙනි දුක්ඛ නිරෝධාර්ය සත්‍ය (නිර්වාණය ලැබීමේ මාර්ගය) මෙයයි. එනම් තෘෂ්ණාවෙහි ශේෂයන් නොමැතිව ඉවත් කිරීම, නැති කිරීම, ක්ෂය කිරීම, දුක්ඛ නිරෝධය හෙවත් නිර්වාණය යන්නයි.''ඉදං ඛො පන භික්ඛවේ දුක්ඛ නිරෝධං අරිය සච්චං යො තස්සායෙව තණ්හාය අසේස විරාගනිරොධෝ චාගො පටිනිස්සග්ගෝ මුක්ති අනාලයෝ'' (පටිසම්භිදාමග්ග.II.පි.147) මෙම පරම නිෂ්ඨාව සාක්ෂාත් කරගැනීම සඳහා ජ්‍යෝතිෂය වැනි විෂයක අදාළත්වයක් නොමැත යන්න බුදුදහම දරණ මතය වේ. එසේම චතුරාර්ය සත්‍ය මත පදනම් වූ නිර්වාණගාමී මාර්ගය ලගා කරගැනීම ජ්‍යෝතිෂය නක්ෂත්‍ර ආදි බාහිර බලවේගයන් මත විශ්වාස තබා සිදුකරනු ලබන ක්‍රියා පිළිවෙතක් නොවේ. එය ජ්‍යෝතිෂය වැනි විෂයනුත් අතික්‍රමණය කොට පුද්ගලයා තමාගේ

උත්සහායෙන් තමා විසින්ම ලබාගත යුත්තකි. ජ්‍යෝතිෂය විෂය පුද්ගලයාගේ ගැලවුම්කාරයෙකු ලෙස පෙනී සිටින විෂයකි. එහෙත් බුදුදහම පෙන්වා දෙන්නේ අඩු තරමින් බුදුරජාණන් වහන්සේ පවා කිසිවෙකුගේ ගැලවුම්කාරයෙකු නොවන බවය. එසේම උන්වහන්සේ මාර්ගය පෙන්වන්නා පමණක් බවය. එසේම පුද්ගලයාගේ විමුක්තිය සාධනය කරගත යුත්තේ පුද්ගලයාගේ උත්සාහයෙන්මය. ''තුම්මෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතං'' (ධම්මපදය.40) තවද බුදුදහම පෙන්වා දෙන්නේ තමාගේ පිහිට තමාම වන බවය. අනුන්ගේ පිහිටක් නොමැති බවය. තමා යහපත් ලෙස දැමුණු කළ දුර්ලභ වූ නිර්වාණය ලබයි. ''අත්තාහි අත්තනො නාථො කොහි නාථො පරොසියා අත්තනාව සුදත්තේන නාථං ලභති දුල්ලභං'' (ධම්මපදය.23) මෙයින් පැහැදිලි වන්නේ තමා විසින් ළඟා කරගත යුතු විමුක්ති සාධනය සඳහා බාහිර බලවේගයන් වන ජ්‍යෝතිෂය, දේව විශ්වාස, නක්ෂත්‍ර වැනි බලවේගයන්ට කිසිවක් කළ නොහැකි බව බුදුදහමේ මතය බවය.

බුදුදහම ජ්‍යෝතිෂය වැනි බාහිර බලවේගයන් මත පදනම්ව කටයුතු නොකරන බවත් පුද්ගලයාට එදිනෙදා ජීවිතයේ පැමිණෙන ගැටලු පවා විසඳාගත යුත්තේ පුද්ගලාභ්‍යන්තරය තුළින් තමා විසින්ම බව පැහැදිලි වන සූත්‍රයක් ලෙස ජටා සූත්‍රය පෙන්වා දිය හැක. මෙහිදී එක්තරා දෙවියෙකු බුදුන් වහන්සේගෙන් විමසනු ලබන්නේ ''පුද්ගල අභ්‍යන්තරයෙත් ගැටලුය. බාහිර සමාජයෙත් ගැටලුය, ගැටලු එකින් එකට වෙලී ඇත. මේ ගැටලු විසඳිය හැක්කේ කා හටද?'' යන්නයි. ''අන්තො ජටා බහි ජටා, ජටාහි ජටිතා පජා තං තං ගොතම පුච්චාමි, කො ඉමං විජටයෙ ජටං'' (ස.නි.I.පි.13) මෙහිදී බුදුන් වහන්සේගේ පිළිතුර වූයේ ''ශීලයෙහි පිහිටා සිතත් ප්‍රඥාවත් වඩන පුද්ගලයාට මෙම අභ්‍යන්තර හා බාහිර සියලු ගැටලු නිරාකරණය කරගත හැක.'' යන්නයි. ''සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤෝ චිත්තං පඤ්ඤං ච භාවයං-ආතාපි නිපකො භික්ඛු සො ඉමං විජටයේ ජටං'' (එම) මෙහිදී පැහැදිලිව දක්වා ඇත්තේ ආර්ය අෂ්ටාංගික මාර්ගය මත පදනම් වූ ශීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂා වැඩීම මගින් පුද්ගලයාට අභ්‍යන්තර හා බාහිර වශයෙන් පැමිණෙන ගැටලු නිරාකරණය කරගත හැකි

බවය. මෙලෙස බුදුදහම අනුව පුද්ගලයාට පැමිණෙන ගැටලු විසඳාගත යුත්තේ ඔහු විසින්මය. ඒ සඳහා බාහිර බලවේගයන් වන ජ්‍යොතිෂය යන්ත්‍ර මන්ත්‍ර වැනි විශ්වාසයන් මගින් උපයෝගිතාවක් සිදු නොවන බව බුදුදහමෙහි පිළිගැනීමයි. පුද්ගලයා තුළ සීලයත්, සමාධියත්, ප්‍රඥාවත් දියුණු කළ හැකි විභව ශක්තිය අන්තර්ගත වී ඇත්නම් එම ත්‍රිශික්‍ෂා තුළින් සියලු ගැටලු විසඳිය හැකිනම් ජ්‍යොතිෂය වැනි විෂයන් පසුපස හඹායෑම නිෂ්ඵල නොවේද?

ඉහතදී සඳහන් කළ පරිදි කර්මය හා ජ්‍යොතිෂය අතර සාම්‍යක් දැකීමට ඇතැම් උගතුන් පෙළඹී ඇත. පුද්ගලයාට බලපාන්නා වූ යහපත් හෝ අයහපත් කර්මවල ප්‍රතිඵල කල්තියා දැනගෙන ඒ සඳහා පිළියම් කිරීම ජ්‍යොතිෂය මගින් සිදු කළ හැකි බව ඇතැම් අයගේ පිළිගැනීම වේ. එහෙත් බුදුදහම පෙන්වා දෙන්නේ තමා තුළ ඇති විභව ශක්තිය මගින් අධ්‍යාත්මය දියුණු කොට තමාට එදිනෙදා ජීවිතයේ විපාක දෙන කර්මයන් පමණක් නොව සහමුලින්ම සියලු ක්ලේශ ධර්මයන් (කර්මයන්) මුලින් උපුටා දමා නැවත භවය ඇති වීමද ළැලැක්විය හැක යන්නයි. මෙය ජ්‍යොතිෂයෙන් සිදු කළ හැක්කක් නොවේ. එබැවින් බුදුදහමේ ප්‍රකට ඉරණම වෙනස්කර ගැනීමේ මාර්ගය ජ්‍යොතිෂය වැනි ලෞකික විෂයක් ඉක්මවා යන මාර්ගයකි. එබැවින් බුදුදහමට අනුව පුද්ගලයාට ගැටලු විසඳා ගැනීම සඳහාත්, පරම අපේක්‍ෂාව වූ නිවන ලබා ගැනීම සඳහා ජ්‍යොතිෂය වැනි විෂය සහය අවශ්‍ය නොවේ.

බුදුදහම පෙන්වා දෙන්නේ පුද්ගලයාට අදට යෙදී ඇති කාර්ය අදම කළයුතු බවය. ''අජ්ජේව කිච්චං ආතප්පං'' (ම.නි.III.පි.187) යෙදී ඇති කාර්ය සිදුකිරීම කල් දැමීම බුදුදහම අනුමත කොට නොමැත. බොහෝ විට ජ්‍යොතිෂය මගින් සිදු කරනු ලබන්නේ නැකත් යෙදෙන තුරු කාර්යයන් කල් දැමීමයි. නැකත්වල ඇති සත්‍ය අසත්‍යතාව කෙසේ වෙතත් කාර්යන් කිරීම කල් දැමීම කාලය අපතේ යෑමක් මෙන්ම තමාගේ කටයුතු ද අතපසු කරගැනීමකි. බෞද්ධයන් නොවන ඇතැම් බටහිර මිනිසුන් නැකත් නොබලමින් තමාගේ කටයුතු නියමිත වේලාවට ආරම්භ කොට නියමිත කාලසීමාවට අවසන් කරනු ලැබ ඇති බව අප

බොහෝ විට දකින කාරණයකි. එහෙත් ඇතැම් විට බෞද්ධයන් වූ ආසියානුවෝ ගෙවල් සෑදිම, විවාහයන් සිදුකිරීම ආදි කටයුතුවලදී නැකත් බලමින් තමාගේ වැදගත් කාලය අපතේ යවන ආකාරය අප දැක ඇත. තවද නැකත්වලට අනුව වැඩ ආරම්භ කළේ නමුදු ඒවා නිසියාකාර නියමිත කාලසීමා තුළ අවසන් කොට නොමැති බව අප බොහෝ විට දකින සිද්ධියකි. එබැවින් බුදුදහමට අනුව තම කාර්යයන් නැකත් බලමින් කල් දමනවට වඩා අද කළයුතු කාර්ය අදම කිරීම යෝග්‍ය බව දක්වා ඇත. තවද සමජිවිකා සූත්‍රයේ සඳහන් වන්නේ විවාහයෙදී හෝ අඹු සැමි යුවලක් ලෙස ජීවිතය ගත කිරීමේදී දෙදෙනෙකුගේ සිතිවිලි හා හැසිරීම් ගළපා ගැනීම වඩා වැදගත් බවය. (අ.නි.II.පි.61) එහෙත් වර්තමානයේ බොහෝ විවාහයන්දී සලකා බලනු ලබන්නේ කේන්දරය ගැළපීම පමණි. කේන්දර තුළින් පුද්ගලයා දරුණු වංචනික පුද්ගලයෙකු යැයි හඳුනා ගැනීමට නොහැක. එසේ හඳුනාගත හැක්කේ සිතිවිලි හා හැසිරීම තුළින්ය. පොරොන්දම් ගළපා සිදුකොට ඇති බොහෝ විවාහයන් අසාර්ථක වන්නෙත්, දික් කසාදයන් සිදු කරගන්නෙත් මෙසේ ජ්‍යෝතිෂය කෙරෙහිම පමණක් විශ්වාස තබමින් පුද්ගලයගේ සිතිවිලි හා හැසිරීම් සොයා නොබලා සිදුකෙරෙන විවාහයන් ගෙනි. මෙම කරුණු නිසා බුදුදහම පෙන්වා දෙන්නේ පුද්ගලයෙකු යම්තරමකට හෝ තේරුම් ගැනීම සඳහා ඔහුගේ සිතිවිලි හා හැසිරීම් පිළිබඳ දැනුමක් ලබා ගැනීම වැදගත් බවය.

බුදුරජාණන් වහන්සේ නිර්වාණගාමී ප්‍රතිපදාව සකස් කරගැනීම සඳහා ධර්මදේශනා කොට ඇතත් පුද්ගලයාගේ එදිනෙදා ජීවිතයේ ගැටලු නිරාකරණය කරගැනීමට ද බොහෝ දේශනාවන් සිදු කොට ඇත. එම දේශනාවන් අතර මංගල කරුණු පිළිබඳ දක්වන මංගල සූත්‍රයෙදී ජ්‍යෝතිෂය අනුව කටයුතු කිරීම මංගල කාරණයක් ලෙස දක්වා නොමැත. එසේම පිරිහීමට හේතු දක්වා ඇති පරාභව හා වසල වැනි සූත්‍රවල එසේ පිරිහිමට එක් හේතුවක් වශයෙන් හෝ ජ්‍යෝතිෂය අනුගමනය නොකිරීම යැයි දක්වා නොමැත. එමෙන්ම සිගාලෝවාද සූත්‍රයෙදී ගිහි ජීවිතයේ අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටුකරමින් යහපත් හා වාසනාවන්ත ජීවිතයක් ගතකිරීම සඳහා හේතුවන කරුණක් ලෙස

ජ්‍යෝතිෂය දක්වා නොමැත. එසේම ව්‍යග්ඝපජ්ජ වැනි ආර්ථික ස්ථාවරත්වය ඇති කරගන්නා ආකාරය පිළිබඳ දේශනාකොට ඇති දේශනාවන්ගේ ආර්ථික සංවර්ධනය ඇති කරගැනීම සඳහා හේතුවන කරුණක් ලෙස ජ්‍යෝතිෂය දක්වා නොමැත. බුදුරජාණන් වහන්සේ පහළවන යුගයේ සිටම පැවති ජ්‍යෝතිෂය නක්ෂත්‍ර යන්ත්‍ර මන්ත්‍ර ආදියෙහි ඉහත සඳහන් කාරණාවන් කෙරෙහි යම්තරමකට හෝ උපයෝගිතාවක් තිබුණේ නම් ඉහත සඳහන් සූත්‍ර දේශනාවන්වලදී ජ්‍යෝතිෂයේ බලපෑම ද එක් කරුණක් ලෙස භාවිත කළ යුතුය. එහෙත් එම දේශනාවන්වල ජ්‍යෝතිෂය පුද්ගලයාගේ යහපත හෝ අයහපත තීරණය කිරීමට හේතුවන බවක් දක්වා නොමැත. මේ මගින් පැහැදිලි වන්නේ බුදුරජාණන් වහන්සේ ජ්‍යෝතිෂය වැනි පාරභෞතික විෂයන් කෙරෙහි සැලකිල්ලක් නොදක්වා ඇති බවය. ඉහත සඳහන් කරුණුවලට අනුව බුදුදහමේ ජ්‍යෝතිෂය ප්‍රතික්ෂේප කොට ඇත්තේ ඇයි ද යන්න වටහාගත හැක.

### වර්තමාන භික්ෂුව ජ්‍යෝතිෂය, නක්ෂත්‍ර, හා යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්

බුදුදහමේ ජ්‍යෝතිෂය පිළිබඳ පිළිගැනීමක් හෝ ඒ පිළිබඳ හැදැරීමක් පිළිබඳව අන්තර්ගත නොවුණත්, අතීතයේ පටන් භික්ෂුව ජ්‍යෝතිෂය, නක්ෂත්‍ර, හා යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්වල නිරත වූ බව යථෝක්ත කරුණුවලින් පැහැදිලි වේ. බුදුදහමේ ජ්‍යෝතිෂය පිළිබඳ පිළිගැනීමක් නොමැති වුවත් භික්ෂූන් වහන්සේලා ඒවායෙහි නිරතවීමට පෙළඹුණේ මන්ද යන්න මෙහිදී සොයා බැලිය යුතුය. නොයෙක් කරුණු පිළිබඳ සොයාගත් මිනිසා යම් දෙයක හෝ යමෙකුගෙන් පිහිට, ආරක්ෂාව පැතීම මානව පරිණාමයේ සිට පැවත එන්නකි. බුදුදහම කෙරෙහි බොහෝ මිනිසුන් පැහැදුණත් උන්වහන්සේ ගැලවුම්කාරයෙක් නොවන බැවින් බුදුදහම අදහන්නා වූ බොහෝ පිරිස් දෙවිවරු විශ්වාස කිරීම ඇදහීම අතීතයේ සිටම සිදුකොට ඇත. විහාරස්ථානවල දේවාල පිහිටුවා ගෙන නොයෙක් වතාවත් සිදු කරනු ලබන්නේ ඒ නිසාවෙනි. විහාරස්ථානවලට පැමිණෙන බොහෝ පිරිස් විහාරස්ථානයේ ඇති දේවාලයෙන් පිහිට පැතීම වර්තමානයේ

පවා දැකිය හැකි ප්‍රධාන ලක්‍ෂණයකි. ඉහතින් සඳහන් කළ පරිදි පිහිට ආරක්‍ෂාව පැතීම මිනිසාගේ ස්වාභාවික ලක්‍ෂණයකි. මෙම මිනිස් අවශ්‍යතාවය සපුරාලීමට ථෙරවාද බුදුසමයෙන් මහත් පිටිවහලක් නොලැබුණ බැවින් ඇතැම් විට භික්‍ෂූන් වහන්සේලාට ජනතාවගේ අවශ්‍යතා ඉටුකරලීම සඳහා ජ්‍යෝතිෂය වැනි විෂයන් හි යෙදීමට සිදුවන්නට ඇත. ථෙරවාද බුදුසමය තුළ බෙහෙවින් අර්ථගන්වා ඇත්තේ ආමිස පූජාවට වඩා ප්‍රතිපත්ති පූජාවයි. එහෙත් වර්තමානයේ ජනතාව වැඩි කැමැත්තක් දක්වන්නේ ප්‍රතිපත්ති පූජාවට වඩා ආමිස පූජාවටයි. එබැවින් බුදුදහම හා බැඳුණු එමෙන්ම නොබැඳුණු බොහෝ අභිචාර විධි ජනතාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා භික්‍ෂූන් වහන්සේලා විසින් වර්තමානයේ පවා සිදුකරනු ලැබේ. ජ්‍යෝතිෂය වැනි විෂයන් කෙරෙහි භික්‍ෂුව නැඹුරුවීමට බලපෑ එක් හේතුවක් ලෙස ඉහත සඳහන් මිනිස් අවශ්‍යතා පෙන්වා දිය හැක.

මීට අමතරව හින්දු දහමේ බලපෑම තදින්ම බෞද්ධයන් කෙරෙහි ලැබී ඇති බව පැහැදිලි වේ. බොහෝ හින්දු දෙවිවරු බෞද්ධයන් විසින් ද නමස්කාර කරනු ලැබේ. ථෙරවාද බුදුසමයෙන් නොලැබෙන පිටිවහලක් (එනම්, ආරක්‍ෂාවක්, විශ්වාසයක්) හින්දු දහමේ දෙවිවරු ඇදහීම මගින් ලැබෙන නිසා එම මිනිස් අවශ්‍යතාව ඉස්මතුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් හින්දු දහමේ ආභාසය ලද ජ්‍යෝතිෂය කෙරෙහි නැඹුරුවීමට බෞද්ධ ජනයා පෙළඹෙන්නට ඇත. එබැවින් භික්‍ෂූන් වහන්සේලාට ඊට අනුගත වීමක් වශයෙන් හා අවශ්‍යතා සපුරාලීමක් වශයෙන් ජ්‍යෝතිෂයෙහි නියැලීමට සිදුවන්නට ඇත.

තවද මහායානයේ ශාඛාවක් වන තන්ත්‍රයානයේ බලපෑම ද වර්තමාන ලාංකීය භික්‍ෂුව යන්ත්‍ර මන්ත්‍ර කෙරෙහි නැඹුරුතාවක් දැක්වීමට හේතු වූ බව ඉහතදී පැහැදිලි කොට ඇත. මෙම කරුණුවලට අමතරව ඒ ඒ යුගයන්හි ඇති වූ ආර්ථික, දේශපාලනික, ආගමික, සංස්කෘතික වෙනස්කම් නිසා මෙන්ම කලානුරූපව වෙනස් වූ භික්‍ෂු ප්‍රතිපත්තින් නිසා හා සමාජ අවශ්‍යතා නිසා භික්‍ෂූන් වහන්සේලා ජ්‍යෝතිෂය, නක්‍ෂත්‍ර, යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් කෙරෙහි නැඹුරුවන්ට ඇතැයි අනුමාන කළ හැක.

ලංකාවේ මෙන්ම විදේශීය භික්ෂූන් වහන්සේලා ද ජ්‍යෝතිෂය කටයුතුවල නිරත වන බව ඉහතදී පැහැදිලි කොට ඇත. මෙහිදී අප බලාපොරොත්තු වන්නේ වර්තමාන ලාංකීය භික්ෂුව විසින් එලෙස සිදුකරන ලබන ජ්‍යෝතිෂය, නක්ෂත්‍ර හා යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් මොනවාද යන්න සොයා බැලීමයි. උපුටා දැක්වීමක් කළ නොහැකි බැවින් පොදුවේ වර්තමාන භික්ෂුව යෙදෙන එවැනි ජ්‍යෝතිෂය යන්ත්‍ර මන්ත්‍ර කටයුතු කිහිපයක් පිළිබඳව මෙහිදී දක්වනු ලැබේ. ඒවා නම් කේන්දර බලා පලාඵල කීම, විවාහ පොරොන්දම් ගැළපීම, නැකත් බැලීම, වාස්තු විද්‍යාව සඳහා නැකැත් බැලීම, කේන්දර සෑදීම, මල්වර වීම, මරණය, අකුරු කියවීම ආදි උපතේ සිට මරණය දක්වා ඇති ජීවිතයේ විශේෂ අවස්ථාවන්වලට නැකත් බැලීම, අනාවැකි කීම, ග්‍රහ උපද්‍රව පිළිබඳ පලාඵල කීම, අංග ලක්ෂණ ශාස්ත්‍රය නිමිති කීම, ආදි ජ්‍යෝතිෂය හා කෙලින්ම බැඳුණු කාර්යන්හි නිරත වීම සිදු කරනු ලබයි. මීට අමතරව, පේන බැලීම, වශී ගුරුකම් සෙත් කවි කීම, දේව පූජා සිදුකිරීම, දෙවියන්ට භාරවීම, භාර ඔප්පු කිරීම, මන්ත්‍ර ජපකිරීම, බලිතොවිල් කිරීම, කොඩිවින, අනවින කිරීම ඒවා කැපීම, ආදි බොහෝ ජ්‍යෝතිෂය යන්ත්‍ර මන්ත්‍ර කටයුතුවල මෙන්ම අනෙකුත් මෙහි සඳහන් වී නොමැති ඒ ඒ සංස්කෘතීන් හා බැඳී නොයෙක් අභිචාර විධින් වර්තමාන ඇතැම් භික්ෂූන් වහන්සේලා විසින් සිදුකරනු ලැබේ.

මෙම ජ්‍යෝතිෂය නක්ෂත්‍ර යන්ත්‍ර මන්ත්‍ර ආදිය සිදුකරනු ලබන භික්ෂූන් වහන්සේලා උපුටා දැක්වීමට නොහැකි බැවින් මෙම පොදුවේ ගොනු කරනු ලැබූ කරුණු පිළිබඳ අඩුපාඩුවක් ඇත්තේ නම් ඒ පිළිබඳ කාරුණික වන මෙන් මෙහිදී දක්වන්නෙමි. කෙසේ වෙතත් පුවත්පත් දැන්වීම්වලින් හා ගුවන්විදුලියෙන්, රූපවාහිනියෙන් මෙන්ම අන්තර්ජාලයෙන් ද මෙලෙස ජ්‍යෝතිෂය කටයුතුවල නිරතවන සුළු පිරිසක් වූ භික්ෂූන් වහන්සේලා පිළිබඳ අනාවරණය කරගත හැක. ජනවහරෙහි එන ''කොන්ඩදෙණියේ හාමුදුරුවෝ '' ඉහත සඳහන් යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්වල නිරත වූ සුප්‍රසිද්ධ හිමිනමක් බව අප කවුරුත් දන්නා කරුණකි. වර්තමානයේ පවා මෙවැනි ප්‍රසිද්ධ යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්වල නිරත වන භික්ෂූන්

වහන්සේලා ඇතත් මෙහිදි ඔවුන් පිළිබඳ නාමිකව සඳහන් කරනු නොලැබේ.

**භික්ෂූන් වහන්සේලාට ජ්‍යෝතිෂය නක්ෂත්‍ර හා ගුරුකම් සිදු කිරීම කැපද? අකැපද?**

වර්තමාන භික්ෂුව විසින් සිදුකරනු ලබන ජ්‍යෝතිෂය නක්ෂත්‍ර හා ගුරුකම් බ්‍රහ්මජාල සූත්‍රයෙහි සඳහන් තිරශ්චීන විද්‍යාවන් හා සඝසදා බැලිමේදි පැහැදිලි වන්නේ භික්ෂූන් වහන්සේට එවැනි තිරශ්චීන විද්‍යාවන්ගේ යෙදීම අකැප බවයි. එහෙත් වර්තමාන භික්ෂු ප්‍රතිපත්තිවල ඇති වෙනස්කම් ද සැලකිල්ලට ගනිමින් එසේම ජ්‍යෝතිෂය, නක්ෂත්‍ර වැනි විෂයන්වල ජනතාවගේ ගැටලු විසඳීම සඳහා ඉවහල් වන උපයෝගිතාව සැලකිල්ලට ගනිමින් භික්ෂුව විසින් ජ්‍යෝතිෂය කළ යුතු ද නොකළ යුතුය ද යන්න මෙහිදි කරුණු දැක්වීමට බලාපොරොත්තු වෙමි.

වර්තමාන භික්ෂු ප්‍රතිපත්ති බොහෝ සෙයින් වෙනස් වී ඇත. එබැවින් සාමඤ්ඤඵල සූත්‍රයෙහි සඳහන් ශ්‍රමණ ඵල වර්තමාන භික්ෂුවකගෙන් බලාපොරොත්තු වීම එතරම්ම සාධාරණ නොවේ. මන්දයත්, එකල සමාජය හා වර්තමානය සමාජය අතර බොහෝ වෙනසක් ඇති බැවිනි. විදර්ශනා ධුරයෙන් ග්‍රන්ථ ධුරයට භික්ෂූන් වහන්සේ පරිවර්තනය වීමත් සමඟ භික්ෂු ජීවිතයේ බොහෝ වෙනස්කම් ඇති විය. ඒ තුළින් භික්ෂු ජීවිතය පරම අපේක්ෂාව වූ නිවන සාක්ෂාත් කිරීම යම්තාක් දුරට ඈත් වූ අතර ධර්මය කට පාඩමෙන් ආරක්ෂාකර ගැනීම, ග්‍රන්ථකරණය, මුල් දේශනාවලට නොයෙක් අර්ථකථන ඉදිරිපත් කරමින් අටුවා ටීකා ආදිය රචනා කිරීම මෙන්ම, ඒ අතරවාරයේ දායික දායිකාවන්ගේ කාර්යයන් ඉෂ්ට කිරීම, බෝධි පූජා, බුද්ධ පූජා, පාංශු කූල, සෙත් පිරිත්, මහාපිරිත් දේශනා කිරීම, ධර්ම දේශනා කිරීම, විහාර පරිපාලනය, සමිති සමාගම්වල නිලතල දැරීම භික්ෂු ජීවිතයේ ප්‍රධාන කාර්යයන් බවට පත් වී ඇත. මෙලෙස වර්තමානය දක්වා විකාශය වී ඇති භික්ෂු ජීවිතය නොයෙක් ගැටලු මැද පරමාර්ථයන් හා අරමුණ වෙනස් වෙමින් පරිණාමය වී ඇත. ලෝකය ශීඝ්‍රයෙන් දියුණු වීමත් සමඟම වෙනස්වන ලෝකයට අනුකූලවන පරිදි භික්ෂු

ජීවිතයද හැඩගැසී ඇත. මෙලෙස යුගයෙන් යුගයට භික්ෂු ජීවිතයේ පරමාර්ථයන් වෙනස් වීමෙන් පැහැදිලි වන්නේ භික්ෂු ජීවිතය වෙනස්වන සමාජයට සරිලන පරිදි හැඩගැසීමයි. පරිණාමවාද ඉදිරිපත් කළ චාල්ස් ඩාවින් උදාහරණ මගින් පෙන්වා දී ඇත්තේ වෙනස් වන ලෝකයට අනුව වෙනස් නොවන යමෙක් හෝ යමක් ඇද්ද එහි පැවැත්මක් නොමැති බවය. එබැවින් භික්ෂු ජීවිතය වෙනස් වීම පරිහානියක් නොව පැවැත්ම සපුරා ගැනීමක් ලෙස හැඳින්විය හැක. මෙලෙස වෙනස් වන ලෝකයට අනුව වෙනස් වූ භික්ෂුව ගුරුවෘත්තිය, දේශපාලනය, පරිපාලනය වැනි වෘත්තීන්ගේ නියැලෙනු ලැබේ. භික්ෂුව මෙලෙස ඇතැම් වෘත්තීන්ගේ යෙදෙන්නේ නම් තම දායක දායිකාවන්ට වඩාත් උපයෝගිතාවක් දක්වන ජ්‍යෝතිෂය වැනි කටයුතුවල නිරතවීමේ අයෝග්‍යතාව කුමක්ද යන්න ඇතමුන් ප්‍රශ්න කරනු ලැබෙත්.

ජ්‍යෝතිෂය සිදුකිරීම භික්ෂුවට අකැප දෙයක් ලෙස ඉහතදී දක්වන ලදී. එබැවින් මෙහිදි සලකා බලනු ලබන්නේ භික්ෂුවක් විසින් එවැනි කටයුතු කිරීම යෝග්‍යද අයෝග්‍යද යන්නයි. වර්තමාන භික්ෂූන් වහන්සේලා ඇතැම් විට තමන්ට යෝග්‍ය වූත් (වෙනස් වන ලෝකයට අනුව ජනයාට ඇති උපයෝගිතාව සලකා) අයෝග්‍ය වූත් ජ්‍යෝතිෂය, නක්ෂත්‍ර යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම්වල නිරතවන බව පැහැදිලි කරුණකි. මෙහිදි අපගේ දැනුම පරිදි භික්ෂු ජීවිතයේ මූලික ලක්ෂණයන්ට අනුව සමාජයට අනුකූලවන පරිදි භික්ෂුවකට යෝග්‍ය වූත් අයෝග්‍ය වූත් එවැනි ජ්‍යෝතිෂය කටයුතු පිළිබඳ කෙටියෙන් දක්වමු.

බුදුරජාණන් වහන්සේ තමාගේ පළමුවන ශ්‍රාවක පිරිස අමතා ප්‍රකාශ කරන ලද්දේ දෙවි මිනිසුන්ගේ හිත සුව පිණිස ධර්ම චාරිකාවෙහි හැසිරෙන ලෙසය ''අත්ථාය හිතාය දෙව මනුස්සානං (මහාවග්ග පාළි.I.20) මෙහිදී පැහැදිලිව බුදුන් වහන්සේ වදාරා ඇත්තේ බොහෝ ජනයාගේ හිත සුව පිණිස ධර්මය දේශනා කරන ලෙසය. එසේම මෙහිදි අර්ථවත් කොට ඇත්තේ බුද්ධ දේශනාව දේශනා කිරීම විය යුතුය. එහෙත් මිනිසුන්ගේ යහපත වෙනුවෙන් බුද්ධ දේශනා වෙහි අන්තර්ගත නොවන කටයුත්තක් කිරීම බුදුදහමට අනුව පටහැනි නොවේ. කෙසේ වෙතත් එවැනි

යහපත් කටයුත් කිරීමට පෙර බුදුදහමට අනුව ක්‍රියාවක් තෝරාග ැනීමේ නිර්ණායක පිළිබඳ අවබෝධයක් ලබාගත යුතුය. බුදුන් වහන්නේ දේශනා කොට ඇත්තේ තමන්ටත් අනුන්ටත් අවැඩක් වන ක්‍රියාවන්ගෙන් වෙන් වීමක් පිළිබඳවය. (ම.නි.I.පි.413) මෙම ක්‍රියාවක් තෝරා ගැනීමේ බෞද්ධ නිර්ණායකට අනුව තමන්ටත් අනුන්ටත් අවැඩක් නොවන යම් කිසි ජ්‍යෝතිෂමය කටයුත්තක් ඇත්නම් එවැනි ක්‍රියාවක නිරතවීම බුදුදහමට අනුව පටහැනි නොවේ. එහෙත් යම් භික්ෂුවක් තමන්ටත් අනුන්ටත් අවැඩක් වන පරිද්දෙන් යම්කිසි වූ ජ්‍යෝතිෂමය ක්‍රියාවක නිරතවන්නේ නම් එය බුදුදහමට සපුරා පට හැනිය.

මෙහිදී තමන්ටත් අනුන්ටත් හානියක් වන ජ්‍යෝතිෂය හා නක්ෂත්‍ර කටයුතු පිළිබඳ සඳහන් කළ යුතුය. යමෙක් එනම් භික්ෂුවක් වංචනික ලෙස මිනිසුන් රවටා මුදල් උපයා ගැනීමේ පරමාර්ථයෙන් හෝ පළිගැනීමේ පරමාර්ථයෙන් හෝ ජ්‍යෝතිෂය කටයුතු සිදු කරන්නේ නම් එවැනි කටයුතු භික්ෂුවට යෝග්‍ය නොවේ. නක්ඛත්ත, ජාතකයෙහි සඳහන් වන්නේ එක්තරා ආජීවකයෙක් පුද්ගලයෙකු රැවටීමේ අරමුණින් වංචනික ලෙස නැකත් කීම හා පලාඵල කීම නිසා විවාහ වෙන්නට සිටි යුවලකට සිදු වූ කරදරයක් පිළිබඳවයි. (ජා.අ.I.පි.258) මෙලෙස වංචනික ලෙස කූට ලෙස ජ්‍යෝතිෂය කටයුතුවල නිරත වෙමින් මුදල් උපයා ගන්නා අය බොහෝ ඇත. ''මම ජ්‍යෝතිෂය විශ්වාස කරමි ........... එහෙත් ජ්‍යෝතිශ්ශාස්ත්‍රඥයන් විශ්වාස නොකරමි. අතීතයේ දීප්තිමත් ජ්‍යෝතිශ්ශාස්ත්‍රඥයෝ සිටියහ. අදත් සිටිති. නමුත් අවාසනාවකට මෙන් බොහෝ කපටි අය නිසා ජ්‍යොතිෂ්‍යයේ නම නරක් වී තිබේ. ඔවුහු අනාගතයේ සැබෑවිය නොහැකි දේ කියමින් මිනිසුන් මුලා කෙරෙති. ඉතා පහසුවෙන් රවටා ගත හැකි අයගේ බිය නොදැනුවත්කම වාසියට හරවා ගනිමින් ඔවුන්ගේ මුදල් සූරාගනිති. මෙහි ප්‍රතිපලයක් වශයෙන් විද්‍යාඥයෝ ජ්‍යෝතිෂය කෙරෙහි විශ්වාස නොතබති.'' (ධම්මානන්ද.කේ.1992 පි.153) යනුවෙන් කේ. ධම්මානන්ද හිමියන් ජ්‍යෝතිෂයේ ඇති වංචනික භාවය පිළිබඳව දක්වා ඇත. ඇතැම් අවස්ථාවල භික්ෂූන් වහන්සේලා ද අධික ලෙස මුදල් අයකර ගනිමින් ජ්‍යෝතිෂය

කටයුතුවල නිරත වූ අවස්ථා නැත්තේම නොවේ. මෙලෙස වංචනික ලෙස මුදල් උපයා ගැනීමේ පරමාර්ථයෙන්ම යම්කිසි භික්ෂුවක් ජ්‍යොතිෂය කටයුතුවල නිරතවන්නේ නම් එය තමන්ටත් අනුන්ටත් හානියක්වන ක්‍රියාවකි. එබැවින් එවැනි ක්‍රියා පිළිවෙත් භික්ෂුවකට කිසිසේත්ම නොගැළපේ.

තවද භික්ෂුවක් විසින් සිදු නොකළ යුතු එමෙන්ම අයෝග්‍ය ජ්‍යොතිෂ්‍ය කටයුතු ඇත. එනම් කොඩිවින කිරීම, කොඩිවින කැපීම, වශී ගුරුකම් කිරීම, බලි තිබීම, දේවාල තනාගෙන ඒවා මගින් යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් කිරීම ආදිය භික්ෂුවක් නොකළ යුතුය. (මෙවා පමණක්ම නොකළ යුතුයි යන්න මෙහිදී සීමා කිරීමක් නොදැක්වේ. මීට අමතරව තව බොහෝ එවැනි ජ්‍යොතිෂ්‍ය කටයුතු ඇතැම් විට භික්ෂුව විසින් සිදුකරනු ලැබේ) මෙවැනි ජ්‍යොතිෂය කටයුතු හා යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්වල නිරතවීම තමාටත් එනම් තමාගේ භික්ෂු ප්‍රතිරූපයටත් අනුන්ටත් එනම් ඒවායෙන් විපාක විඳින පිරිසටත් අවැඩක් වන බැවින් භික්ෂුවක් විසින් මෙවැනි ජ්‍යොතිෂය කටයුතුවල නිරත නොවිය යුතුය. යම්කිසි භික්ෂුවක් එවැනි කටයුතුවල නිරතවන්නේ නම් එයින් එම භික්ෂුවට පමණක් නොව භික්ෂු සමාජයෙහිම ප්‍රතිරූපයට අවැඩක් වේ. මෙවැනි ජ්‍යොතිෂය කටයුතුවල නිරත වූ වර්තමාන ඇතැම් භික්ෂූන් නිසා භික්ෂු සමාජයෙහි ඇතැම් අවස්ථාවල කැලැල් ඇති වූ අවස්ථා බොහෝය. ඇතැම් අවස්ථාවල එවැනි භික්ෂූන් මහජනතාව විසින් සිවුරු හරවා ශාසනයෙන් නෙරපූ අවස්ථාද නොමැත්තේ නොවේ.

ඉහත සඳහන් ජ්‍යොතිෂය කටයුතුවල නිරත නොවෙමින් ජනතාවට ජ්‍යොතිෂයෙන් සිදුවන උපයෝගිතාව සලකා තමන්ටත් අනුන්ටත් අවැඩක් නොවන පරිදි යම්කිසි භික්ෂුවක් ජ්‍යොතිෂය සිදු කරන්නේ නම් මුල් බුද්ධ දේශනාවට අනුව එය අනුමත කළ නොහැකි වුවත් එසේ කිරීම අයෝග්‍ය නොවේ. මන්දයත්, මහජනතාව භික්ෂූන් වහන්සේලාගෙන් එවැනි කටයුතු අපේක්‍ෂා කරන බැවිනි. මෙහිදී එක්තරා ග්‍රන්ථ කතෘවරයෙකු මේ පිළිබඳව උදාහරණයක් දක්වා ඇති සිද්ධියක් පිළිබඳ මෙහි සඳහන් කිරීම යෝග්‍ය වේ. ''දිනක් මම මගේ හිතවත් තරුණ භික්ෂුවක් හමුවීම සඳහා උන් වහන්සේගේ විහාරයට ගියෙමි. මා උන් වහන්සේ

සමග සාකච්ඡා කරමින් සිටියදී මවක සහ දියණියක පන්සලට ආහ. නව යොවුන් වියේ සිටි දියණියගේ අත උළුක්කු වී තිබිණ. මව දියණිය කැටුව පන්සලට පැමිණ තිබුණේ භික්ෂූන් වහන්සේ ලවා මතුරා දියණියගේ උළුක්කුව අද්දවා ගැනීම සඳහාය. මව මා ඉදිරියේදීම භික්ෂූන් වහන්සේට ඒ බව කීවාය. මා හිතවත් ඒ භික්ෂුව ද මවගේ අවශ්‍යතාව පරිදි දියණියගේ අත්ල අල්ලා ඈ විසින් රැගෙන විත් තිබු තෙල් වර්ගයක් ද අත්ලමත ආලේප කොට මතුරා උළුක්කුව ඇද්දේය. මෙය කිරීමෙන් පසු නැවත පිළිසඳරට එක් වෙමින් මිනිසුන් අපෙන් බලාපොරොත්තුවන දේවල් බලන්න යැයි මා සමග පැවසුහ.'' (කුමාරසිරි, ජයන්ත 2001.පි.22) මෙය භික්ෂූන් වහන්සේලාගෙන් එලෙස ගිහි ජනතාව බලාපොරොත්තුවන එක් සිද්ධියක් පමණි. මීට අමතරව තවත් එවැනි බොහෝ ජ්‍යොතිෂය කටයුතු මෙන්ම යන්ත්‍ර මන්ත්‍ර කිරීම ද ඇතැම් ජනයා භික්ෂූන්ගෙන් බලාපොරොත්තු වෙති. එබැවින් ජවතාවට යහපතක් වන එවැනි කටයුතුවල නිරතවීම භික්ෂුවකට අයෝග්‍ය නොවේ. එහෙත් ඒ සෑම අවස්ථාවකදීම භික්ෂු ප්‍රතිරූපයට නොගැළපෙන දෑ නොකිරීමට තමන් වගබලාගත යුතුය. මෙලෙස මහජනතාවට ඉවහල් වන උපයෝගිතාව සලකා බලා භික්ෂුවක් විසින් පලාඵල කීම, නැකත් සෑදීම, වාස්තු විද්‍යාවල නිරත වීම, සෙත් කවි සකස් කිරීම, ග්‍රහ අපල සඳහා පූජා පැවැත් වීම ආදි කටයුතුවල නිරත වීම භික්ෂු ප්‍රතිරූපයට එතරම්ම අයෝග්‍ය භාවයක් නොමැත. මෙවැනි කටයුතු කිරීම තුළින් තම විහාරස්ථානයේ දායක දායිකාවන්ට තමාගෙන් සේවාවක් ද සිදුවන බැවින් ඒ තුළින් තමාට හෝ අනුන්ට අයහපතක් නොවන බැවින් ඉහත සඳහන් ජ්‍යොතිෂ්‍ය කටයුතුවල නිරත වීම භික්ෂුවකට අයෝග්‍ය නොවේ යැයි වර්තමානයේ මහජනයාගේ අවශ්‍යතා සලකා බලා, එමෙන්ම භික්ෂු ප්‍රතිරූපයේ වෙනස් කම් ද සැලකිල්ලට ගනිමින් මෙහිදී සඳහන් කළ හැක.

කෙසේ වෙතත් මෙහිදී භික්ෂුවක් විසින් මේ දේ කළ යුතුයි, මේ දේ නොකළ යුතුයි යන්න නිගමනයකට නොපැමිණේ. මක් නිසාද යත් එවැනි නිගමනයකට පැමිණීම සඳහා මෙම මාතෘකාව භික්ෂු සංස්ථාව විසින්ම පුළුල් ලෙස සාකච්ඡා කොට කතිකාවතක්

ඇති කරගත යුතු හෙයිනි. මෙවැනි කාරණා පිළිබඳ කිසිවෙකු පෞද්ගලික තීරණවලට නොපැමිණිය යුතුය. එබැවින් මේ පිළිබඳ නිර්ණායක හා තීරණ ඉදිරිපත් කළ යුත්තේ සමස්ත සංඝ සමාජය තුළින්මය. කෙසේ වෙතත් වර්තමාන සමාජ තත්ත්වය දෙස බැලීමේදී භික්ෂුව ජ්‍යෝතිෂය කටයුතුවලින් මුදවාගැනීම ලෙහෙසියෙන් කළ නොහැක්කකි. ඊට හේතුව නම් ජ්‍යෝතිෂය කටයුතු, භික්ෂුව හා මහජනතාව අතර ඒ සඳහාම සුවිශේෂ වූ සබඳතාවක් අතීතයේ පටන්ම පැවත එන බැවිනි. එබැවින් මෙහිදී කළ යුත්තේ ඒවා සිදු කරනු ලබන භික්ෂූන්ට චෝදනා කිරීම නොව භික්ෂූන් වහන්සේලා විසින් එවැනි කටයුතු සිදු කරන්නේ කෙසේද, ඒවායෙහි නිර්ණායක හා සීමා මොනවාද යන්න භික්ෂු සමාජය තුළම සම්මුතියක් ඇති කරගැනීමයි. මෙහිදී මාගේ පෞද්ගලික අදහස වන්නේ ඉහත අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයෙහි සඳහන් ක්‍රියාවක් තෝරා ගැනීමේ ක්‍රමවේදය මේ සඳහා භාවිත කරනු ලබන්නේ නම් එනම් තමන්ටත් අනුන්ටත් අයහපත වන ජ්‍යෝතිෂය කටයුතුවල නිරත නොවීමටත් තමන්ටත් අනුන්ටත් යහපතක් වන ජ්‍යොතිෂ්‍ය කටයුතුවල නිරත වීමත් භික්ෂු සමාජය තුළ පොදු ආකල්පයක් ඇති කොට ගෙන සම්මුතියකට එළඹීමයි. එවැනි ක්‍රමවේයක් තුළින් භික්ෂු ප්‍රතිරූපයට ද හානියක් නොවන අයුරින් ජ්‍යෝතිෂය කටයුතුවල නිරත වීමට හැකි වේ යැයි අනුමාන කළ හැක.

### වෙදකම හා බුදුදහම

ත්‍රිපිටකය පුරා ඇති කරුණු අධ්‍යයනය කිරීම මගින් පැහැදිලි වන්නේ බුදුදහම වෙදකම, වෛද්‍ය ප්‍රතිකාර, බෙහෙත් වර්ග ආදි වෛද්‍ය ක්ෂේත්‍රය හා සම්බන්ධ බොහෝ කරුණු විග්‍රහ කොට දක්වා ඇති බවය. මෙහිදී අවධානය යොමු කරනු ලබන්නේ වෙදකම හා වෛද්‍ය ප්‍රතිකාර පිළිබඳ බෞද්ධ ආකල්පය ඉතා කෙටියෙන් පැහැදිලි කොට එවැනි වෘත්තියක නියැළීම භික්ෂුවකට කැපවේද නොවේද යන්න කරුණු ගෙනහැර දැක්වීමයි.

නිරෝගිව ජීවත්වීම සඳහා සියලු දෙනාටම වෛද්‍ය ප්‍රතිකාර බෙහෙත් වර්ග අත්‍යවශ්‍ය සාධකයකි. භික්ෂුවකගේ ජීවිතය පවත්වා

ගෙන යාම සඳහා අවශ්‍ය සාධක අතර බෙහෙත් ද අන්තර්ගත වේ. (ගිලානපච්චය) එසේම බුදුන් වහන්සේ විසින් දේශනා කොට ඇත්තේ නිරෝගිකම උතුම්ම සැපත ලෙසය (ආරෝග්‍ය පරමා ලාභා) - (ධම්මපද,ගාථා30).

වෛද්‍යාචාර්යවරයෙකු තරම්ම වෙදකම පිළිබඳ දතයුතු බොහෝ කරුණු බුදුන් වහන්සේ විසින් දැන සිටිය බව ත්‍රිපිටකය අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨ මනෝ වෛද්‍යවරයෙකි. උන්වහන්සේගේ දර්ශනය තුළ වැඩි අවධානයක් යොමු කොට ඇත්තේ මිනිසාගේ මානසික අසමතුලිතතා ඇති වීමට හේතු පැහැදිලි කිරීම (Psychopathology) සහ ඒ සඳහා ප්‍රතිකර්ම (Theraphy) ඉදිරිපත් කිරීමයි. බුදුන් වහන්සේ විශේෂයෙන්ම මානසික සමතුලිතාව ඇති කරගැනීම සඳහා මනෝ වෛද්‍යවරයෙක් වශයෙන් බොහෝ කරුණු ඉදිරිපත් කොට ඇති බැවින් උන්වහන්සේ භිසක්ක සහ භේසජ්ජ ගුරු යන නාමයෙන්ද හඳුන්වනු ලැබේ. (අ.නි. තිකනිපාතඅට්ඨකථා-822) මනෝ වෛදයවරයෙක් වශයෙන් උන්වහන්සේ විසින් ලෝකයට දයාදකොට ඇති බෞද්ධ භාවනා ක්‍රමවේද වර්තමානයේද විවිධ මානසික රෝග නිවාරණය කරගැනීමට යොදාගනු ලැබේ. මිනිසාගේ මානසික නිරෝගී භාවය සඳහා උන්වහන්සේ වැඩි අවධානයක් යොමු කොට තිබුණත් අවශ්‍ය අවස්ථාවන්වලදී කායික වෛද්‍ය ක්‍රමවේද පිළිබඳව දේශනා කොට ඇත. වෛද්‍ය ක්‍රමවේදවල උපයෝගිතාව පිළිබඳ සුවිශේෂී අවබෝධයක් තිබූ උන්වහන්සේ වෛද්‍ය ක්ෂේත්‍රය නැතහොත් වෛද්‍ය වෘත්තිය ඉතා උසස් කොට සලකමින් දේශනා කොට වදාළේ, මහණෙනි, යමෙක් මාගේ අවවාදය කරන්නේනම් හෙතෙමේ ගිලනුන්ට උවටැන් කරන්නේය.''සො ගිලානං උපට්ඨෙති සො මං උපට්ඨෙති'' (වි.I.පි.301) උපස්ථාන කරමින් උන්වහන්සේ වෙදකමෙහි ඇති උසස්භාවය පැහැදිලි කර දුන්හ. පූතිගතිස්ස තෙරුන් වැනි රෝගාතුර වූ ඉතා අසාධ්‍ය වූ ගිලනුන්ට උපස්ථාන කිරීම උදාහරණ ලෙස දැක්විය හැක. (ධම්මපදට්ඨකථා.1.318) ශරීරික වශයෙන් මෙන්ම බොහෝ සෙයින් මානසික වශයෙන් නොයෙක් ගැටලු හා අසහනයන්ට පත්ව සිටි බොහෝ මිනිසුන්ට වෙදකමින්

මෙන්ම හෙදකමින්ද බුදුරජාණන් වහන්සේ උපකාර කොට ඇති බව උන්වහන්සේගේ දිනචරියාව අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ.

බුදුරජාණන් වහන්සේ මනසේ ව්‍යුහය, එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව අභිධර්ම පිටකයේදී සංශ්ලේෂි හා විශ්ලේෂී ක්‍රමවලින් ඉතා පැහැදිලිව දේශනා කොට ඇත්තා සේම උන්වහන්සේ ව්‍යුහ විද්‍යාව පිළිබඳ (Anatomy) විශේෂ දැනුමක් තිබූ බව ස්බන්ධ, ධාතු, ආයතන විග්‍රයෙන් මෙන්ම ත්‍රිපිටකයේ බොහෝ ස්ථානවල පැහැදිලිව දක්වා ඇති ශරීරයේ ව්‍යුහය පිළිබඳ විග්‍රහවලින් පැහැදිලි වේ. සතිපට්ඨාන සූත්‍රයේදී (දී.නි.II.පි.292) ''අත්‍ථි ඉමස්මිං කායෙ කෙසා, ලොමා, නඛා.....'' ආදි වශයෙන් දක්වා ඇති විස්තරයෙන් බුදුන් වහන්සේ ශරීරයේ ව්‍යුහ විද්‍යාව පිළිබඳ ප්‍රමාණාත්මක දැනුමකින් සිටි බව පැහැදිලි වේ. තවද මජ්ඣිමනිකාය අට්ඨකථාවෙහි විතක්කසණ්ඨාන සූත්‍ර වර්ණනාවෙහි ශරීරයෙහි අස්ති තුන් සියයක් ද, නහර නවසියයක් ද, මාංශ පේශි නව සියයක් ද, ව්‍රණ මුඛ නවයක් ද, රෝමකූප නව දහසක් ද, කුණප දෙතිසක් ද අන්තර්ගත වන බව සඳහන් වේ. (ම.නිඅ.II.පි.87)

ශල්‍ය වෛද්‍ය හා සර්වාංග වෛද්‍ය වශයෙන් දෙයාකාර වෛද්‍යවරුන් පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන් වේ. (සේල ථෙර ගාථා, 296) ශල්‍ය වෛද්‍යවරයා හැඳින්වීම සඳහා ''සල්ලකත්ත'' යන වචනයද සර්වාංග වෛද්‍යවරයා හැඳින්වීමට ''භිසක්ක'' යන වචනයද භාවිතා කොට ඇත. ''තස්ස මිත්තාමච්චා ඤාති, සාලොහිතා භිස්සකං සල්ලකත්තං උපට්ඨපෙසුං''(ම.නි.I.පි.429) බුද්ධ කාලීන භාරතයේ රාජ වෛද්‍යවරයා වූ බුදුන් වහන්සේට ද උපස්ථාන කළ ජීවක වෛද්‍යවරයා සර්වාංග වෛද්‍යවරයෙක් මෙන්ම, ශෛල්‍ය වෛද්‍යවරයෙක් ද වූ බව ත්‍රිපිටකයෙන් අනාවරණය කරගත හැක. ජීවක විසින් රජගහ සිටුවරයාගේ හිසෙහි කරන ලද සැත්කමක් පිළිබඳවත්, බරණැසස් සිටු පුත්‍රයාට උදරයෙහි කරන ලද සැත්කමත් පිළිබඳවද මහාවග්ගපාළියෙහි සඳහන් වේ. (වි.I.පි.275) ශල්‍ය ප්‍රතිකාර පමණක් නොව ජීවක විසින් නොයෙක් අවස්ථාවන්වල බිම්බිසාර, චණ්ඩපජ්ජෝත වැනි රජවරුන්ට, බුද්ධ ප්‍රමුඛව මහාසංඝයාට ද අන්තඃපුර ස්ත්‍රීන්ට ද

නොයෙක් කායික රෝග සඳහා  වෙදකම් කල බව ත්‍රිපිටකයෙන් අනාවරණය වේ (වි.I.පි.268).

ජීවක දක්ෂ වෛද්‍යවරයෙකු ලෙස ත්‍රිපිටකයෙහි දක්වා ඇත්තාසේම, රෝගයන් හා රෝග කාරකයන් පිළිබඳ බුදුන් වහන්සේ තුළ තිබූ දැනුමද ත්‍රිපිටකයෙන් අනාවරණය කර ගත හැක. ගිරිමානන්ද සූත්‍රය මේ සඳහා හොඳම නිදසුන වේ. එහි සඳහන් රෝග වර්ගිකරණය මෙසේය. ''ඇස් රෝග, කන් රෝග, නාසයෙහි රෝග, දිවෙහි රෝග, කයෙහි රෝග, හිසෙහි රෝග, මුඛ රෝග, දන්ත රෝග, කාස රෝග, ඇදුම රෝග, පීනස් රෝග, දාහය, ජරපත් වීම, කුසෙහි රෝග, සිහිමුර්ඡාව, ගණ්ඩ රෝග, කිලාස රෝග, ක්ෂය රෝග, අපස්මාරය, දද, කැසීම, සුළු කැසීම්, නියෙන් සිරුණ තැන හටගන්නා රෝග, (නබසා) මහකැසීම්, ලේ පිත, මධුමේහය, අංසා, පිළිකා, භගන්දළා,'' (අ.නි.V.109) මෙම රෝග පිළිබඳ විස්තරයට අමතර රෝග කාරක පිළිබඳවද එහිම සඳහන් වේ. ඒවා නම්''පිත සෙම, වාතය, සන්නිපාතික, සෘතු විපර්යාසය, විෂම හැසිරීම්, උපක්‍රම මගින් හටගන්නා රෝග, කර්ම විපාක වශයෙන් වැළදෙන රෝග, ශීත උෂ්ණ, සාගින්න, පිපාසය, මළපහ කිරීම, මුත්‍රා කිරීම, (එම) යන කාරණා රෝගාබාධ හටගැනීමට හේතුවන රෝග කාරක ලෙස දක්වා ඇත.

රෝගයන් පිළිබඳවත්, ඒ සඳහා ඇති ප්‍රතිකාර, බෙහෙත් වර්ග, ඒවායෙහි කැප අකැප බව, වෛද්‍ය ප්‍රතිකාර සඳහා සුදුසු කාලය, මාත්‍රාව පිළිබඳවත්, ඒ ප්‍රතිකාර සඳහා අවශ්‍ය වන භාණ්ඩ පිළිබඳවත් පැහැදිලිවම විස්තරයක් දක්වා ඇත්තේ භේසජ්ජක්ඛන්ධකයෙහිය. එහි සඳහන් බෙහෙත් වර්ග හා ප්‍රතිකාර පහත පරිදි දැක්විය හැක. 1. ගිතෙල්, තලතෙල්, වෙඬරු, මී පැණි උක්සකුරු යන බෙහෙත් වර්ග පස 2. තෙල් වර්ග, 3. මුල් වර්ග, 4. කහට වර්ග, 5. කොළ වර්ග, 6. ඵල වර්ග, 7. මැලියම් වර්ග, 8. ලුණු වර්ග, 9. මස් වර්ග, 10. අඳුන් වර්ග, 11. හිස තෙල් ගෑම, 12. නස්‍ය කිරීම, 13. දුම් බීම, 14. මධ්‍යසාර වර්ග, 15. ස්වේද කර්ම, 16. තැවීම, 17. ලේ ඇරීම, 18. ශල්‍ය කර්ම, 19. කල්ක, 20. සර්ප විසට මල මුත්‍රා භාවිතය, 21. ඉනා බෙහෙත්වලට මඩවතුර පෙවීම, 22. විරේක කිරීම, 23. කැඳ වතුර, 24. මුං තැම්බූ වතුර, 25. මස් රසය,

26. ලුණු කාඩි ආදි බෙහෙත් වර්ග සහ ප්‍රතිකාර ක්‍රම එහි සඳහන් වේ. මීට අමතර වෛද්‍ය ප්‍රතිකාර සඳහා භාවිත කරන උපකරණ පිළිබඳවද එහි සඳහන් වේ. එනම්. 1. ඇඹරුම් ගල, 2. වංගෙඩිය, 3. අඳුන් කුලාව හා ඒ සඳහා භාවිත උපකරණ, 4. දුම් නලය හා ඒ සඳහා භාවිත උපකරණ, 5. පැලැස්තර, 6. වනය බඳින රෙදි කඩ ආදි උපකරණ පිළිබඳවද එහි සඳහන් වේ (වි.I.පි.198).

බුදුරජාණන් වහන්සේ ඇතැම් අවස්ථාවල ආරෝග්‍යශාලාව වෙත වැඩම කොට දහම් දෙසූ අවස්ථා පිළිබඳ ද සඳහන් වේ. (අ.නි.III.පි.147) ගිලනුන් පිළිබඳ විශේෂ අවධානය යොමු කළ බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට දේශනා කොට වදාළේ වැඩි වස් ඇති භික්ෂු නමක් වුවද බාල වස් ඇති භික්ෂු නමක් වුවද ගිලන් වූ විට අස්නෙන් නැගිට්ටවීම දුකුලා ඇවතක් බවයි. ''න භික්ඛවේ ගිලානො වුට්ඨාපෙතබ්බෝ, යෝ වුට්ඨාපෙය්‍ය ආපත්ති දුක්කටස්ස'' (වි.II.පි.165) තවද බුදුරජාණන් වහන්සේ විසින් ගිලනා හට ගිලාන භත්ත යනුවෙන්ද ගිලානෝපස්ථායකයාට ගිලානෝපට්ඨානභත්ත යනුවෙන්ද බත් දෙකක් අනුදැන වදාළා ඇත. (වි.I.පි.294) ගිලානෝපස්ථානය පිළිබඳ භික්ෂුව උනන්දු කිරීම සඳහාත් එහි ඇති වටිනාකම පිළිබඳව අවධානය යොමු කිරීම සඳහාත් බුදුන් වහන්සේ විසින් ගිලන් භික්ෂුව සතු වස්තුව ඔහුගේ මරණයෙන් පසු ගිලානෝපස්ථායකයාට හිමි විය යුතු බව දක්වා ඇත. (වි.I.පි.303) එසේම ගිලන් භික්ෂුවට උපස්ථාන කරන්නේ උපසපන් හා සාමණේර යන දෙදෙනා විසින්ම නම් සාමණේර භික්ෂුවට පවා ඔහුගේ මරණයෙන් පසු මියගිය භික්ෂුව සතු දේ සමසේ බෙදා දිය යුතුය(එම). මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ බුදුරජාණන් වහන්සේ ගිලානෝපස්ථානය උසස්කොට සැලකිමටත් ඒ සඳහා භික්ෂූන් වහන්සේලා උනන්දු කරවීම සඳහාත් ඇතැම් සුළු පැනවීම් සිදුකොට ඇති බවය.

අංගුත්තරනිකායේදී බුදුන් වහන්සේ ගිලනුන් තිදෙනෙක් පිළිබඳව කරුණු දක්වා ඇත. එනම්, 1. සත්ප්‍රාය භෝජන, සත්ප්‍රාජය භෙසජ්ජ, සුදුසු උපස්ථායක යන කරුණු ලැබුණද නොලැබුණද සුවපත් නොවන රෝගියා, 2. ඉහත සඳහන් කරුණු තුන ලැබුණද නොලැබුණද සුවපත් වන රෝගියා, 3. ඉහත සඳහන් කරුණු

තුන ලැබීමෙන් පමණක් සුවපත් වන රෝගියා. (අ.නි.I.පි.120) තවද අංගුත්තර නිකායෙහිම කරුණු පසෙකින් යුක්ත වූ ගිලනාට උපස්ථාන කිරීමට දුෂ්කර බව සඳහන් කොට ඇත. එම කරුණු පස නම් 1. රෝගයට අපථ්‍ය දැ කිරීම, 2. පථ්‍ය දැයෙහි පමණ නොදැනීම, 3. බෙහෙත් නියමිත පරිදි නොපිළිගැනීම, 4. ගිලානෝපස්ථායකයාට රෝගිතත්‍වය නිසියාකාරව පැහැදිලි නොකිරීම, 5. ශරීරයෙහි හටගන්නා තීව්‍ර වේදනා නොඉවසීම (අ.නි. III.පි.143).

වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳව ත්‍රිපිටකයෙහි සඳහන් යථෝක්ත කරුණු පිළිබඳව කෙටියෙන් හෝ පැහැදිලි කිරීමක් සිදු කරනු ලැබුයේ, වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳව බුදුදහම දක්වන ආකල්පය පිළිබඳව පැහැදිලි කිරීමත්, බුදුරජාණන් වහන්සේ තුළ තිබූ වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳව දැනුම පැහැදිලි කිරීමත්, වෛද්‍ය ශාස්ත්‍රය ගිලානෝපස්ථානය පිළිබඳ, එහි උපයෝගිතාව හා වැදගත්කම පිළිබඳව බුදුන් වහන්සේ දක්වා ඇති ආකල්ප හා උන්වහන්සේගේ චරිතය මගින් ගිලානෝපස්ථානය පිළිබඳ හෙළිවන කරුණු පැහැදිලි කිරීම සහ එම කරුණු අපගේ ප්‍රස්තුතය වන භික්ෂුව වෙදකමෙහි නියැළිය යුතුද? යන්න වඩාත් නිවැරදිව විග්‍රහ කිරීම සඳහා උපයෝගි කරගැනීම සඳහාය. ඉහත සඳහන් ත්‍රිපිටකයෙහි කරුණුවලින් පැහැදිලි වන්නේ වෙදකම පිළිබඳව බුදුන් වහන්සේ විශේෂ උනන්දුවක් දක්වනු ඇත්තා සේම, එහි ඇති උපයෝගිතාව පිළිබඳ වැඩි අවධානයක් උන්වහන්සේ යොමු කොට ඇති බවය.

**වෙදකම භික්ෂුවකට කැපද අකැපද?**

වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ බුදුන් වහන්සේ විශේෂ අවධානය යොමු කොට ඇතත් බ්‍රහ්මජාල සූත්‍රයෙහි සඳහන් වන්නේ තමා විසින් වෙදකම වෘත්තියක් ලෙස සිදු කිරීමෙන් වැළකී සිටින බවකි. මෙහිදී බුදුන් වහන්නේ දේශනා කරනු ලබන්නේ ''ඇතැම් මහණ බමුණන් ගිහියන් සැදැහැයෙන් දුන් බොජුන් වළඳා......වමනය, ඌර්ධ විරේකය, අධෝ විරේක, ශිර්ෂ විරේක, ගිහියන්ගේ ඇස් ලෙඩට බෙහෙත් කිරීම, ළදරුවන්ගේ ලෙඩට බෙහෙත් කිරීම, කාරම් බෙහෙත් බැඳීම හා ගැලවීම යනාදී තිරශ්චීන විද්‍යාවලින් යුතුව වැරදි ලෙස දිවිගෙවත්, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ එකී

මිථ්‍යා ජීවයන්ගෙන් හා ඒ හා සමාන සෙසුත් මිථ්‍යා ජීවයන්ගෙන් වෙන්වී වෙසෙන සේක.'' (සිංහල දික්සගිය පි.7) යනුවෙන් සඳහන් වේ. මෙහිදී බුදුන් වහන්සේ සඳහන් කරනු ලබන්නේ ගිහියන් සැදැහයෙන් දුන් බොජුන් වළඳන භික්ෂුවක් විසින් වෙදකම කිරීම අකැප බවක්ද? මෙහිදී බුදුන් වහන්සේ පැහැදිලිව දක්වා ඇත්තේ භික්ෂුවකගේ කාර්යභාරය එවැනි කටයුතුවල නිරත වෙමින් කටයුතු කිරීම නොවන බවකි. යම් භික්ෂුවක් මෙවැනි ලෞකික කටයුතුවල නිරතවීමෙන් ඔහුගේ පරම පරමාර්ථය වූ නිවන් සාක්ෂාත් කරගැනීම ප්‍රමාද වනු ඇත. එසේම එවැනි ලෞකික විද්‍යාවන් කිරීමට භික්ෂුවට සෘජුවම අවසර ලබා දුන්නේනම් බුදුදහමේ හරය හා භික්ෂු ජීවිතයේ පරමාර්ථ සපුරා වෙනස් වීමට ඉඩ තිබුණි. එබැවින් මෙවැනි කරුණු සලකා බලා භික්ෂුවක් විසින් එවැනි විද්‍යාවල නිරතවීම යෝග්‍ය නොවන බව මෙහිදී බුදුන් වහන්සේ පැහැදිලි කරන්නට ඇත. එවැනි මතයක් බුදුන් වහන්සේ විසින් දැරුවත් ගිලනුන්ට උපස්ථාන කිරීමෙන් භික්ෂුවට වැළකිය යුතු යැයි බුදුන් වහන්සේ දක්වා නැත. මෙම සූත්‍රයෙන් පැහැදිලිවන තව කරුණක් වන්නේ භික්ෂුවක් විසින් වෙදකමක් ආජීවයක් ලෙස එනම් වෘත්තියක් ලෙස සිදුකිරීම යෝග්‍ය නොවන බවය. එසේ නොමැතිව සේවාවක් ලෙස ලාභාපේක්ෂා බලාපොරොත්තු නොවෙමින් තම පරමාර්ථයන්ට පටහැනි නොවන අයුරින් වෙදකම කිරීම මෙහි ප්‍රතික්ෂේප කොට නොමැත. මෙම සූත්‍රයෙහි වෙදකම සහ ඒ හා බැඳුණු අනෙක් ශාස්ත්‍ර මිථ්‍යා ආජීවයන් ලෙස (මිච්ඡාජීව) ලෙස දක්වා ඇත්තේ කිනම් හේතුවක් නිසා දැයි පැහැදිලිව දැක්විය නොහැක. ඇතැම්විට එම යුගයෙහි ඇතැම් මහණ බමුණන් විසින් වෙදකම වෘත්තියක් ලෙස සිදුකරමින් ධනය රැස්කරන්නට ඇත. ඇතැම්විට ඒ පිළිබඳ දැනුමක් නොමැතිව මිනිසුන් රවටන්නට ඇත. වෛද්‍ය වෘත්තිය මගින් බොහෝ විට අයෝග්‍ය ලෙස ධනය රැස්කරන්නට ඇත. එබැවින් එවැනි වෘත්තියක් එනම් වැරදි ලෙස වෛද්‍ය වෘත්තිය කිරීම ඒ තුළින් ධනය ඉපැයීම, ආදිය භික්ෂුවට නොගැළපෙන බව මෙහිදී බුදුන් වහන්සේ දක්වන්නට ඇත. එසේ නොමැතිව වෙදකම වැනි යහපත් වෘත්තියක් යහපත් ලෙස සිදුකිරීම නොමනා බව උන්වහන්සේම දැක්වීම අවශ්‍ය නොවිණ. ඊට හේතුවනම් එය

අත්‍යවශ්‍ය වෘත්තියක් වන බැවිනි. කෙසේ වෙතත් වෙදකම යනු වෘත්තියක් බැවින් භික්ෂු ප්‍රතිපදාවන්ගෙන් පරිබාහිර වූ කිනම් වූ හෝ වෘත්තියක නියැලීම භික්ෂු ජීවිතයේ පරමාර්ථ යටපත් වීමට හේතුවන බැවින් බුදුන් වහන්සේ එය භික්ෂුවකට සුදුසු නොවන වෘත්තියක් ලෙස දක්වන්නට ඇත.

පරාජිකපාළියේ තතිය පරාජිකාවෙහි දක්වා ඇති ආකාරය එක් කුලුපග ගැබ්ගත් ස්ත්‍රියක් භික්ෂුවකගෙන් ගැබ්හෙළන බෙහෙතක් විමසීය, එවිට ඒ භික්ෂුව ඇයට බෙහෙතක් දුන්නේය. ඒ බෙහෙත භාවිතයෙන් ඕ මළාය. මෙම කරුණු සලකා බලා එසේ කිරීම දුකුලා ඇවතක් බව බුදුන් වහන්සේ පනවා ඇත (වි.III.පි.83). තවද තතිය පරාජිකාවෙහි භික්ෂූන් වහන්සේලා විසින් ගැබ්ගත් කාන්තාවන්ට බෙහෙත් වර්ග කියාදීමට හා ප්‍රතිකර්ම කියාදීමට ගොස් එමගින් අපහසුතාවන්ට පත්වූ අවස්ථා පිළිබඳ සඳහන් වේ. එම කරුණු සලකා බලා එසේ බෙහෙත් වර්ග කීම හා බෙහෙත් දීම ඇවැත් සිදුවන බව බුදුන් වහන්සේ තතිය පරාජිකාවෙහි දක්වා ඇත. (එම)

මෙම තතිය පරාජිකාවෙහි සඳහන් විනය නීති පිළිබඳව හා ඒ හා සම්බන්ධ කරුණු පිළිබඳ සලකා බැලිමේදී පැහැදිලි වන්නේ භික්ෂූන් වහන්සේ වෙදකමෙහි යෙදීමෙන් අනවශ්‍ය වූ කරදරවලට මුහුණ දීමට සිදු වී ඇති බවකි. තව ඇතැම් භික්ෂුවක් නොදැනුවත් කම නිසා සිදුකළ ප්‍රතිකර්ම නිසා කාන්තාවක් මිය ගියාය. භික්ෂුව විසින් එය සිතා මතා නොකලත් එවැනි දේ නිතර නිතර සිදුවීම මගින් භික්ෂූන්ට දෝෂාරෝපණ පැමිණීමට හා භික්ෂූන් කෙරෙහි විශ්වාස නොතැබීමටද හේතුවන කරුණකි. මෙලෙස මෙම කරුණු පිළිබඳ සලකා බලා බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට වෙදකම නුසුදුසු දෙයක් හැටියට දක්වන්නට ඇති බව අනුමාන කළ හැක.

තතිය පරාජිකාවෙහි සඳහන් ඉහත කරුණු පිළිබඳ වැඩි විස්තරයක් සමන්තපාසාදිකාවෙහි සඳහන් වේ. එහි සඳහන් වන්නේ ''පැමිණි පැමිණි අන්දෙනාහට බෙහෙත් නොකළ යුතුය.'' ''ආගතාගතස්ස පරජනස්ස භේසජ්ජං න කාතබ්බං, කරොන්තෝ දුක්කටං ආපජ්ජති'' (සම.II.පි.468), (සමන්තපාසාදිකා සිංහල

I.442) මෙහි තවදුරටත් භික්ෂුවක් විසින් බෙහෙත් කිරීමට කැපවූ පිරිස් පිළිබඳව ද සඳහන් වේ. ඒ අනුව පහත සඳහන් පිරිස්වලට බෙහෙත් කිරීමට භික්ෂුවකට කැප වේ. භික්ෂු, භික්ෂුණී, ශික්ෂාමාන, සාමණේර, සාමණේරි යන සහධම්මිකයන්ටත් (සමාන පැවතුම් ඇතියවුන්ට) මව, පියා, මවුපියන්ට උපස්ථාන කරන්නා, තමන්ගේ වතාවත් කරන්නා, පැවිද්ද අපේක්ෂාවෙන් සිටින පස්දෙනාටත්, එසේම, දෙටු සොයුරා, කණිටු සොයුරා, දෙටු සොයුරිය, කණිටු සොයුරිය, සුළු මව, මහ මව, සුලු පියා, මහ පියා, නැන්දා, මාමා, යන දස නෑයන්ට බෙහෙත් කිරීම භික්ෂුවකට කැප බව සමන්තපාසාදිකාවෙහි සඳහන් වේ. මීට අමතරව යථොක්ත දස නෑයන්ගේ සත්වන පරපුර තෙක්ද, සොයුරාගේ බිරිඳට හෝ සොයුරියගේ සැමියාට ඔවුන්ගේ නෑයන්ටද, බෙහෙත් කිරීම කැප බව සමන්තපාසාදිකාවෙහි දැක්වේ. (සමන්තපාසාදිකා සිංහල පි.443.) ඉහත සඳහන් පිරිස්වලට බෙහෙත් කිරීමේදී ඔවුන් සතුව එම ද්‍රව්‍යයන් තිබේනම් ඔවුන්ගෙන් ඉල්ලාගෙන බෙහෙත් කළ යුතුය. එසේ නොමැතිනම් තමසතු ද්‍රව්‍යයන් යොදා බෙහෙත් සැකසිය යුතුය. තමාලගත් නොමැතිනම් පිඬු සිඟීමෙන් හෝ කලින් පොරොන්දු වූ නෑදෑයන්ගෙන් ලබා ගත යුතුය. එසෙත් කළ නොහැකි නම් අන් තැනකින් සොයා ගත හැකිය. (එම)

උපාධ්‍යායයන් වහන්සේ බැහැරක් ගිය විට උන්වහන්සේගේ ගිලන් වූ මවුපියෝ විහාරයට පැමිණිය හොත් සද්ධිවිහාරික තෙම ඔවුන්ට උපාධ්‍යායන් වහන්සේ සතු බෙහෙත් දිය යුතුය. නැතහොත් තම සතු දේ උපාධ්‍යායන් හට පරිත්‍යාග කොට දිය යුතුය. එසෙත් නොමැති කල්හි අන් විධියකින් සොයා බලා උපාධ්‍යාය සතු කොට දිය යුතුය. මෙපරිද්දෙන්ම උපාධයායන් වහන්සේ විසින් සද්ධිවිහාරිකයාගේ දෙමාපියන් කෙරෙහිද පැවතිය යුතුය. මේ ක්‍රමවේදයම ආචාර්ය අන්තේවාසිකයත් විසින්ද සිදුකළ යුතුය. (එම. පි.444)

තවද අන්‍ය වූ යම් ආගන්තුකයෙක් හෝ සොරෙක් හෝ යුද්ධෙන් පැරදුන ඉසුරෙක් හෝ නෑයන් විසින් හැර දැමූ දුගියෙක් හෝ ගමික මනුෂ්‍යයෙක් හෝ ගිලන්ව විහාරයට පැමිණේද ඒ සියල්ලන්ට ඔවුන් විසින් තමාට කරන ලාභය ගැන නොතකා බෙහෙත් කටයුතුය. (එම)

තව දුරටත් සමන්තපාසාදිකාවෙහි දක්වා ඇත්තේ ''භික්ෂු සංඝයාට සිවුපසයෙන් උපස්ථාන කරන මවුපිය තනතුරට සුදුසු සැදැහැති කුලයක් වේ. එහි ඉදින් කිසිවෙක් ගිලන් වේද, ඔහු පිණිස විශ්වාසයෙන් ස්වාමිනි, බෙහෙත් කොට දුන මැනව යැයි කියත්නම්, බෙහෙත් නොදිය යුතුමය, බෙහෙත් නොකොට යුතුය, තවද කැපය දැන, ස්වාමිනි අසවල් රෝගයට කිනම් බෙහෙතක් කරත්දැයි, මෙසේ විචාරත්ද, මේ මේ දැය ගෙන කෙරෙත් කීම වටී. ස්වාමිණි මාගේ මවුතොමෝ ගිලන්වූවාය, බෙහෙතක් කියනු මැනවයි, මෙසේ විචාල කල්හි වනාහි නොකිය යුතුය. ''ඇවැත අසවල් භික්ෂු නමට මේ රෝගයෙහිදී කිනම් බෙහෙතක් කළාහු ද? ස්වාමිනි මේ බෙහෙතැයි.'' ඔවුනොවුන් කථා කළයුතුය. ඒ අසා අන්‍යයා මවට බෙහෙත් කෙරේද වරද නැත්තේමය, මහාපදුම ස්ථවිරයන් වහන්සේ වනාහි වසභ රජුගේ දේවියට රෝගයක් උපන් කල්හි එක් ස්ත්‍රියක අවුත් විචාරන ලද්දේ ''නො දකිමි යි, නොකියා භික්ෂූන් සමග මෙපරිද්දෙන්ම කථා කළහ. එය අසා ඇයට බෙහෙත් කළහ. රෝගය සන්සුන් කල්හි තුන් සිවුරක්ද කහවනු තුන්සියයක්ද සමග බෙහෙත් කරඬුවක් පුරවා ගෙන අවුත් තෙරුන්ගේ පාමුල තබා ස්වාමිනි මල් පූජා කරනු මැනව යැයි කිහ. ස්ථවිරයන් වහන්සේ මේ ආචාර්ය භාගය යැයි කැප වශයෙන් ගත්වා මල් පුජා කළහ. මෙසේ වනාහි බෙහෙතෙහි පිළිපැදිය යුතුය. (එම. 445)

සමන්තපාසාදිකාවෙහි ඉහත සඳහන් කරුණුවලින් භික්ෂුවක් විසින් බෙහෙත් කළයුතු සහ නොකළයුතු පිරිස් පිළිබඳව පැහැදිලිව දක්වා ඇත. එහි අන්තර්ගත කරුණුවලට අනුව තම විහාරස්ථානයෙහි සහවාසියන්ට, දෙමාපියන්ට තම ඥාතීන්ට හා තවත් ඇතැම් පිරිස්වලට බෙහෙත් කළ හැකි බව සඳහන් වේ. මේ අනුව පැහැදිලි වන්නේ භික්ෂුවකට ඉතා සුළු පිරිසකට හැරුණු කොට තමාගෙන් යුතුකම් ඉටු විය යුතු බොහෝ පිරිසකට බෙහෙත් කළ හැකි බවය. එහෙත් මෙය අට්ඨකථාවෙහි විස්තරයක් බව මතක තබාගත යුතුය.

සමන්තපාසාදිකාවෙන් පැහැදිලි වන තවත් කරුණක් වන්නේ වසභ රාජ්‍ය සමයෙහි (ක්‍රි.ව. 127-171) භික්ෂූන් වහන්සේලා

විසින් වෛද්‍ය වෘත්තියෙහි යෙදී ඇති බවය. සමන්තපාසාදිකාවෙහි වෙදකමෙහි නියැළිය යුතු ආකාරය පිළිබඳව මෙතරම් විස්තරයක් කිරීමට හේතුවන්නට ඇත්තේ ඇතැම් විට භික්ෂූන් වහන්සේලා විවිධ ක්‍රමවේදයන්ට අනුව වෙදකමෙහි යෙදී තිබූ බැවින් යැයි අනුමාන කළ හැක. එහිම මහාපදුම නැමැති ස්ථවිරයන් වහන්සේ තමන් විසින් සිදුකරනු ලැබූ ප්‍රතිකර්මය පිළිබඳව සඳහන් වී ඇත්තේ ඒ නිසාවෙන්ම විය හැක. කෙසේ වෙතත් භික්ෂූන් වහන්සේලා විනය කඩ නොවන අයුරින් (අසුනොවන අයුරින්) බෙහෙත් කිරීමට ඒ සඳහා චේතනයක් ලබාගත් ආකාරයත් මහාපදුම හිමියන්ගේ කතාවෙන් පැහැදිලි වේ. මහාපදුම හිමියන් විනය පිළිබඳ විශේෂඥයෙකු විය යුතුය. උන්වහන්සේ වසභ රජුගේ බිසවගේ රෝගයට ස්ත්‍රිය විසින් බෙහෙත් විචාර කල්හි, බෙහෙත් කෙලින්ම එම ස්ත්‍රිය ප්‍රකාශ කිරීම වරදක් බැවින්, අවශය බෙහෙත් වර්ගය ස්ත්‍රියට ඇසෙන සේ වෙනත් භික්ෂුවකට ප්‍රකාශ කළහ. එය අසාගොස් එම ස්ත්‍රිය දේවියට බෙහෙත් කළේය. මෙමගින් පැහැදිලි වන්නේ විනය නීති කඩ නොවන අයුරින් අතීත ලාංකීය භික්ෂුව විසින් වෙදකම සිදුකොට ඇති බවය. එසේම රෝගය සුව වූ පසු සතුටු පඬුරු වශයෙන් පූජා කළ ද්‍රව්‍යයන්ද කැපකරුවා ලවා විනය නීති උල්ලංඝනය නොවන අයුරින් එම තෙරුන් විසින් පිළිගන්නා ලදී. මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ එම යුගයෙහි භික්ෂූන් වහන්සේලා විනය නීති උල්ලංඝනය නොවන අයුරින් වෙදකමෙහි නිරතවීමට ඒ සඳහා දෙන තුටු පඬුරු පිළිගනිමින් එම කාර්යයනිහි නිරතවීමටද උත්සහා ගත් බවය. කෙසේ වෙතත් මෙම කරුණුවලින් අටුවාචාරීන් වහන්සේ උත්සාහගෙන ඇත්තේ බොහෝ අවස්ථාවන් වලදී භික්ෂුව වෙදකමෙහි නිරතවීම අකැප දෙයක් නොවන බවත් ඒ සඳහා යමක් පූජා කරනු ලබන්නේ නම් එය පිළිගැනීම අකැප නොවන බවත් හුවා දැක්වීමටය. ඇතැම් විට එසේ සඳහන් කොට ඇත්තේ භික්ෂුවක් වෙදකමෙහි යෙදීමේ උපයෝගිතාව පිළිබඳව සලකා බලා මෙන්ම එවැනි දෙයක් සිදුකිරීම එතරම් ම හානිදායක දෙයක් නොවන බව සලකා බලා විය හැක.

වෙදකම හා භික්ෂුව පිළිබඳ අනාවරණය කරගැනීම සඳහා ඓතිහාසික ලාංකේය භික්ෂුව විසින් ඒ සඳහා සිදුකොට ඇති අනුග්‍රහය පිළිබඳවද සලකා බැලීම වටී. වෛද්‍ය ක්ෂේත්‍රයෙහි උන්නතිය සඳහා භික්ෂූන් වහන්සේලා ග්‍රන්ථ රචනා කොට ඇත. ලාංකිය භික්ෂූන් වහන්සේ නමක් පාලි භාෂාවෙන් මුලින්ම රචනා කළ වෛද්‍ය ග්‍රන්ථයක් ලෙස භේසජ්ජ මංජුසාව හැඳින්විය හැක. මෙය රචනා කොට ඇත්තේ දඹදෙණි යුගයේ ප්‍රබල රජෙකු වූ දෙවන පරාක්‍රමබාහු රජුගේ කාලයෙහි විසූ පස්මුල මහා ස්වාමි තෙරුන් විසින්ය. භේසජ්ජ මංජුසාවට සිංහල සන්නසක් නුවර යුගයෙදී වැලිවිට සංඝරාජ හිමියන් විසින් රචනා කොට ඇත. මෙය රචනා කිරීම නිසා නරේන්ද්‍රසිංහ රජු ඇතෙකු පූජාකළ බවද සඳහන් වේ. සංඝරාජ හිමියන් අනුගමනය කළ දියහුන්නත ධම්මජෝති නම් හිමි නමක් විසින් භේසජ්ජ මංජුසාව සිංහලයට නගා වඩාත් යෝග්‍ය ලෙස සකස් කළහ. මෙය යෝග පිටකය යනුවෙන් ද හැඳින්වේ. ලංකා ඉතිහාසයේ පළමුවන වතාවට සිංහල භාෂාවෙන් භික්ෂුවක් විසින් වෛද්‍ය ග්‍රන්ථයක් රචනා කොට ඇත්තේ පළමුවන බුවනෙකබාහු රජුගේ කාලයේදීය. මෙම යුගයේ පූජාවලියෙහි කතෘ වූ බුද්ධ පුත්‍ර හිමියන් විසින් ජනතාවගේ කායික සෞඛ්‍යය නංවාලනු පිණිස යෝගාර්ණාවය හා ප්‍රයෝගරත්නාවලී යනුවෙන් වෛද්‍ය ග්‍රන්ථ දෙකක් ම රචනා කොට ඇත. මෙම බුද්ධ පුත්‍ර හිමි පිළිබඳව ජනප්‍රවාද ගත තොරතුරුවලින් පැහැදිලි වන්නේ උන්වහන්සේ වෙදකමෙහි නිරත වී සිටි බවය. වාකිරිගල අවට ගම්වාසින් විසින් පවසන පරිදි උන්වහන්සේ විසින් සකස් කරන ලද බෙහෙත් තෙල් එහි ගර්පර්වතයෙහි තැන්පත් කොට ඇත. ඉහත සඳහන් යෝගාර්ණාවය සිංහල කවියට නගා ප්‍රතිකාර විධි 48 ක් පිළිබඳව සඳහන්ව රචනා කරන ලද යෝගරත්නාකරය නම් තවත් කෘතියක් ඇත. එහි කතුවරයා අඥාත වුවත් ඔහු මෝදරගම මහතෙරහු යැයි ඇතමෙක් ප්‍රකාශ කරති. එම හිමියන් විසින්ම වරයෝගසරය යනුවෙන් තවත් කෘතියක් රචනා කොට ඇත. වැලිවිට සංඝරාජ පරම්පරාවට අයත් භික්ෂුවක් වූ මාදම්පේ රතනපාල හිමියන් විසින්ද යෝගාසේකරය නමින් කවි 557 ක් අඩංගු වෛද්‍ය ග්‍රන්ථයක් රචනා කොට ඇත.

මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ අතීතයේ විසූ භික්ෂූන් වහන්සේලා ග්‍රන්ථකරණය මගින් මෙන්ම ඇතිම් විට වෙදකමෙහි නිරත වෙමින්ම වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා සේවාවක් ඉටුකොට ඇති බවය. මේ කරුණුවලින් පැහැදිලි වන්නේ වෙදකම පිළිබඳව මුල් බුදුසමය කිනම් මතයක් දැරුවත් භික්ෂූන් වහන්සේලා විසින් වෙදකම සිදුකිරීම ඒ සඳහා ග්‍රන්ථ රචනා කිරීම සිදු කොට ඇති බවය. කෙසේ වෙතත් පසුකාලීන භික්ෂූන් වහන්සේලා විදර්ශනා ධුරයෙන් බැහැරව ග්‍රන්ථධුරයට නැඹුරුවීම මෙම වෙනස සිදුවීමට හේතුවන්නට ඇති බව අනුමාන කළ හැක. මෙම ඓතිහාසික තොරතුරුවලින් පැහැදිලි වන්නේ කාලාන්තයක් තිස්සේ වෙදකම පිළිබඳ උනන්දුවක් දැක්වූ භික්ෂූන් වහන්සේලා එය කැප කටයුත්තක් සේ සලකා කටයුතු සිදුකොට ඇති බවය.

වර්තමාන භික්ෂු සමාජය දෙස අවධානය යොමු කොට බැලීමේදි පැහැදිලි වන්නේ බොහෝ භික්ෂූන් වහන්සේලා විසින් පාරම්පරික ආයුර්වේද ආදි වූ වෛද්‍ය ශාස්ත්‍රයන්හි නියැළෙන බවය. වර්තමාන භික්ෂූන් වහන්සේලා එසේ වෙදකමෙහි නිරතවීම කිසිවෙකු විසින් හෙලා නොදකින අතර දායකයන්ගෙන් ද ඒ සඳහා විරුද්ධතාවක් නොමැත. භික්ෂූන් වහන්සේලා වෙදකමෙහි යෙදීම කැපද අකැපද යන්න පිළිබඳවත් තේරුම් නොගන්නා තරමටම දේශීය වෙදකම භික්ෂුව හා බැඳී හමාරය. එබැවින් එවැනි වෘත්තියක් භික්ෂුවගෙන් වෙන් කිරීම පහසුවෙන් කළ නොහැක්කකි. තවද බොහෝ පිරිසක් භික්ෂූන් වහන්සේලාගෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට කැමැත්තක් දක්වති. තවද මෙහිදී සඳහන් කළ යුතු වන්නේ වෙදකම තුළින් මහජනයාට විශාල සේවාවක් සිදුකරනු ලබන භික්ෂූන් වහන්සේලා වර්තමාන සමාජයෙහි වසන බවය. සමාජයට උන්වහන්සේලාගේ ඇති උපයෝගිතාව අතිමහත්ය. බොහෝ පිරිස් කායික හා මානසික වශයෙන් සුවපත් කරනු ලබන භික්ෂූන් වහන්සේලා ඇත. උන්වහන්සේලා සතු දේශීය වෙදකම පිළිබඳ ඥාන සම්භාරය ද රැකගැනීම ඉතා වැදගත් වේ. තවද මෙහිදී සඳහන් කළයුතු කරුණක් වන්නේ ඇතැම් වර්තමාන භික්ෂූන් වහන්සේලා මුදල් ඉපයිමේ පරමාර්ථයෙන්ම එම වෘත්තියන්හි නිරතවන බවය. ඇතැම් විට එවැනි භික්ෂූන්

වහන්සේලාට වෙදකම පිළිබඳ දැනුමක් නොමැති අතර වෙදකම හා යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් සියල්ල එකට සම්බන්ධ කරගනිමින් ප්‍රතිකාර කරනු ලැබේ. එසේ කිරීමෙන් ජනතාවට උපකාරයක් සිදු වුවත් ලාභ ප්‍රයෝජන අපේක්‍ෂාවෙන් එය සිදු කරනු ලබන්නේ නම් එය භික්‍ෂුවට කැප ලෙස දැක්විය නොහැක. භික්‍ෂුවක් විසින් ලාභාපේක්‍ෂාවෙන් තොරව මහජනයාට සේවය කිරීමේ පරම අභිලාෂ ඇතිව වෙදකමෙහි නිරත වන්නේ නම් වර්තමාන භික්‍ෂු ජීවිතයේ වෙනස්කම් ද සලකා බලා එසේ කිරීම යෝග්‍ය යැයි සඳහන් කළ හැක. එහෙත් යම් කිසි භික්‍ෂුවක් එය මිථ්‍යාජීවයක් ලෙස එනම් වැරදි ලෙස ලාභ ප්‍රයෝජන අපේක්‍ෂාවෙන් සිදු කරනු ලබන්නේ නම් එය යෝග්‍ය දෙයක් හැටියට දැක්විය නොහැක.

භික්‍ෂුවකට වෙදකම යෝග්‍යද අයෝග්‍යද යන්න සලකා බැලීමේදී ත්‍රිපිටකයෙහි සඳහන් ගිලානො පස්ථානයට සුදුසු තැනැත්තා හා නුසුදුසු තැනැත්තා පිළිබඳ විස්තරය දැක්වීම යෝග්‍ය වේ යැයි සිතමි. ඒ අනුව ගිලානොපස්ථානයට නුසුදුසු පුද්ගලයන් ලෙස 1. බෙහෙත් සංවිධානයෙහි ප්‍රතිබල නොවීම. 2. රෝගියාට ප්‍රත්‍ය අපත්‍ය දැ නොදැන අපත්‍ය දෙය දෙන පත්‍ය දැන නොදීම. 3. කිසියම් ලාභයක් අපේක්‍ෂාවකින් මිස මෙත් සිතින් ගිලනාට උපස්ථාන නොකිරීම. 4. රෝගියාගේ මල මුත්‍රා, වමනය කෙල ආදිය බැහැර කිරීමේදී පිළිකුල් ගත වීම. 5. රෝගියා කලින් කල දැහැමි කතාවෙන් සනසවාලීමෙහි අසමත් වීම යන කරුණු පසෙන් යුත් පුද්ගලයා ගිලානොපස්ථානයට නුසුදුසුය. (අ.නි. III.පි.144) ගිලාන උපස්ථානය සුදුසු පුද්ගලයා 1. බෙහෙත් සංවිධානයෙහි ප්‍රතිබල වෙයි. 2. රෝගියාට පත්‍ය අපත්‍ය දැ පිළිබඳ දැනගනි. 3. මෙත් සිතින් මිස කිසියම් ලාභයක් බලාපොරොත්තුවෙන් ගිලනාට උපස්ථාන නොකෙරේ. 4. රෝගියාගේ මල මුත්‍රා කෙළ ආදිය බැහැර කිරීමෙහි පිළිකුල් නොවෙයි. 5. කලින් කල රෝගියා පහදවාලීමෙහි සමත් වෙයි. මෙම කරුණුවලින් යුක්ත පුද්ගලයා ගිලානෝපස්ථානයට සුදුසු බව බුදුන් වහන්සේ දක්වා ඇත. (එම) වර්තමාන භික්‍ෂූන් වහන්සේලා වෙදකමෙහි නිරතවීමේදී යථෝක්ත විනය නීති පිළිබඳව සලකා බලා මෙන්ම මෙම කරුණු පිළිබඳවද සලකා බලා නිරතවන්නේ

නම් එය තමන්ගේ පැවිදි ප්‍රතිරූපයට ද වෙනස් නොකරගනිමින්, පැවිදි ප්‍රතිපත්තින්ද ආරක්‍ෂා කරගනිමින් එහි නිරතවිය හැක. අතීතයේ භික්‍ෂූන් වහන්සේලා (මහාපදුප තෙරුන්) විනය නීති උල්ලංඝන නොවන අයුරින් වෙදකමෙහි නිරත වී ඇත. වර්තමාන භික්‍ෂුවද එසේ යෙදෙන්නේ නම් එය වඩාත් ශික්‍ෂාකාමී බවට මෙන්ම යහපත් බවට ද පත්කළ හැක.

## නිගමනය

වර්තමාන භික්‍ෂු ජීවිතය බොහෝ සෙයින් ජ්‍යොතිෂය, නක්‍ෂත්‍ර යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් මෙන්ම වෙදකම සමග ද ඉතා තදින් බැඳී ඇත. මෙවැනි කටයුතු භික්‍ෂු ජීවිතයෙන් ඉවත් කිරීමට උත්සහා ගැනීමේදී බොහෝ විට සිදුවන්නේ භික්‍ෂූන් වහන්සේලා තමන් වහන්සේලා අතරම අසමගිය ඇතිකොට ගෙන භේද භින්න වීමයි. මේ සඳහා ඉතිහාසයේ පටන් සිදු වූ සංගායනා හා කතාකාවන් සාක්ෂි දරනු ඇත. වර්තමානයේද එවැනි කතිකාවතක් ඇති කරගැනීම පිළිබඳ සාකච්ඡා වුවත් එයද අසාර්ථක වූයේ භික්‍ෂූන් වහන්සේලා අතර ඒ පිළිබඳ ඒකමතිකතාවක් නොමැති වීම හේතුවෙනි. වර්තමාන භික්‍ෂූන් ජීවිතය බොහෝ සෙයින් ලෞකිකත්වයට නැඹුරු වී ඇත. මෙම වෙනස්වීම බුදුන් වහන්සේ ද දේශනා කොට ඇත. තම දායක දායිකාවන්ගේ කුදුමහත් කටයුතු කරමින් ජීවත්වන භික්‍ෂූන් වහන්සේලාට බොහෝ විට විවේකය නොමැති තරම්ය. එසේම දායක දායිකාවන්ගේ අවශ්‍යතා ඉටුකරලීම සඳහා ප්‍රමාණවත් භික්‍ෂූන් වහන්සේලා නොමැති වීම ද ප්‍රධාන ගැටලුවක් වී ඇත. භික්‍ෂූන් වහන්සේලා ආරක්‍ෂා කරගැනීමද අපගේ වගකිමකි. වර්තමාන භික්‍ෂු ජීවිතයට නොග ැළපෙන අයුරින් විනය නීති සකස් කිරීමට ගියහොත් සිදුවන්නේ ශාසනය තුළ භික්‍ෂූන් වහන්සේලාගේ පැවැත්ම අඩුවීමයි. එබැවින් නවනීති පැනවීමට වඩා බුදුන් වහන්සේ විසින් පනවා ඇති නීති හැකිතාක් කඩ නොකර ආරක්‍ෂාකර ගැනීමෙන් යහපත් භික්‍ෂු ජීවිතයක් ගත කළ හැක. ඉහත සඳහන් වෘත්තීන්හි යෙදීම භික්‍ෂුවට යෝග්‍ය වේද නොවේද යන්න කරුණු දැක්වීම ඉතා අපහසුය. එහෙත් බුදුන් වහන්සේ දේශනා කළ පරිදි යමෙක් තමන්ටත් අනුන්ටත් හානියක් වන ක්‍රියාවලින් වැළකී, තමන්ටත්

අනුන්ටත් යහපතක් වන ක්‍රියාවල නිරත වන්නේ නම් එවැනි ඕනෑම ක්‍රියාවක් බුදුදහමට අනුව අනුමත කළ හැක.

## හැකුළුම්

| | |
|---|---|
| අ.නි | අංගුත්තර නිකාය |
| ජ.අ | ජාතක අට්ඨකථාව |
| ද.ක | දඹදෙණි කතිකාවත |
| දී.නි | දීඝනිකාය |
| නි.ස | නිකාය සංග්‍රහය |
| ම.ව | මජ්ඣිමනිකාය |
| ම.නි.අ | මජ්ඣිමනිකාය අට්ඨකථා |
| මව. | මහාවංශය |
| වි. | විනය පිටකය |
| ස.නි | සංයුක්තනිකාය |
| සු.නි | සුත්තනිපාත |
| සම. | සමන්තපාසාදිකාව |

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අමරවංශ හිමි, අකුරටියේ, දිසානායක, හේමචන්ද්‍ර (පරි.), (1994), *මහාවංසටීකාව* (සිංහල අනුවාදය), කැළණිය විශ්වවිද්‍යාලය, කැළණිය.

ආනන්ද කොන්ගස්තැන්තේ, (සංස්.), (1997), *දඹදෙණි අස්න සහ කඳවුරු සිරිත*, රුහුණු විශ්වවිද්‍යාලය, මාතර.

ඉලංගසිංහ මංගල (සංස්.), (2006), *මහාවංසො* (පරිච්ඡේද 1 සිට 54 දක්වා) ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ කොළඹ 10.

කුමාරිසි, ජයන්ත, (2001), *ලංකාවේ භික්ෂුව*, මුද්‍රණය, ප්‍රින්ට් හවුස්, ගාල්ල.

ගුණවර්ධන, වී.ඩී.එස්, (සංස්.), (2001), *ධර්ම ප්‍රදීපිකාව*, සමයවර්ධන පොත්හල, කොළඹ.

ජයතිලක. ඩී.බී., (සංස්.), (1955), *කතිකාවත් සඟරා*, ප්‍රකාශනය ඩී.සී. සහ ඩී.ඇස්. ජයතිලක. කැළණිය.

ධම්මකුසල, අම්බලංගොඩ, (පරි.), සුමංගල අම්බලංගොඩ, (සංස්.), (2005), *සමන්තපාසාදිකා විනයට්ඨකථා* (සිංහල පරිවර්තන) තෙවැනි කොටස, පාලි අට්ඨකථා සිංහල පරිවර්තනය 8, ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය. කොළඹ. 07.

ධම්මකුසල, අම්බලංගොඩ, (පරි.), සුමංගල අම්බලංගොඩ, (සංස්.), (2003), *සමන්තපාසාදිකා විනයට්ඨකථා* (සිංහල පරිවර්තන), පළමුවෙනි කොටස, ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය. කොළඹ. 07.

ධම්මවිසුද්ධි හිමි, යටදොළවත්තේ, (1995), *පොළොන්නරු හා දඹදෙණි*

*කතිකාවත්*, මධ්‍යකාලීන ලාංකික භික්ෂු සමාජය පිළිබඳ ඓතිහාසික හා සමාජවිද්‍යාත්මක අධ්‍යයනයක්, පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය. කැළණිය විශ්වවිද්‍යාලය.

*නිකාය සංග්‍රහය*, (1997), සංස්කරණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

*පපංචසූදනිනාම මජ්ඣිමනිකායට්ඨකථා*, හේවාවිතාරණ මුද්‍රණය, 1943.

පැට්රික් නාරාවිල (පරි.), (2005), මිනිසා කෙරෙහි ග්‍රහබලපෑම් (Planetary Influnces on Human Affairs-by B.V.Raman, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ කොළඹ 10.

පියතිස්ස, විදුරුපොල, (සංස්.), (1926), *ජාතකට්ඨකථාව I*, හේවාවිතාරණ මුද්‍රණය.

පේමරාජ, ඒ.ජේ.පි, (අනු.) (1929), *ලඝු ජාතකය*, සුදර්ශන යන්ත්‍රාලය, මාතර.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්.), (1959), *ඌන පූරණ සහිතෝ මහාවංසෝ*, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

වනරතන, රංජිත්, (සංස්.), (2001), *රසවාහිනි* (ලංකාදිපුප්පත්තිකථා), සමයවර්ධන පොත්හල, කොළඹ.

විමලකිත්ති හිමි, මැදඋයන්ගොඩ, (1958), ''දඹදෙණි සමයේ පඬිවරුන් හා පිරිවෙන්'', *සාහිත්‍ය*, දඹදෙණි කලාපය.

විමලවංශ හිමි, අකුරැටියේ, ආරියදාස සෙනෙවිරත්න, නාගොඩ (සංස්.), (1997), *සංඝරාජ සාධු චරියාව*, (ආයිත්තාලියැද්දේ මුහන්දිරම්රාළ රචිත), සමයවර්ධන පොත්හල, කොළඹ.

සාසනරතන, මොරටුවේ, (1999), *ලක්දිව මහායාන අදහස්*, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

*සාරත්ථප්පකාසිනීනාම සංයුක්තනිකායයට්ඨකථා*, පඨමභාගෝ 1924.

සිංහල දික්සඟිය, I,II,III, (1998), *සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථමාලාව, I* සම්පාදනය, බුද්ධ ශාසන අමාත්‍යංශය.

සිරි රාහුල හිමි, අත්තුඩාවේ, (සංස්.) එදිරිසිංහ, ටී.එච්. (පරි.) (1992), *බෞද්ධ විශ්වාස විමර්ශනය*, (What Buddhist Believe,by K.Sri Dhammananda) සමයවර්ධන පොත්හල, කොළඹ 10.

සේදරමන්. ජේ. ර්., (1983), *ග්‍රහබල හා ග්‍රහයෝග පිළිබඳ ජ්‍යොතිර් විද්‍යාත්මක සිද්ධාන්ත*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ කොළඹ 10.

ඥානවිමල හිමි, කිරිඇල්ලේ, (සංස්.), (1970), *දීපවංශය*, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

ඥානවිමල හිමි, කිරිඇල්ලේ, (සංස්.), (2007), *සද්ධර්මරත්නාවලිය*, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

ඥානවිමල හිමි, කිරිඇල්ලේ, (සංස්.), (2008), *පූජාවලිය*, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

Andersen, D., Smith, (ed.), (1913), S*uttanipāta*, Pali Text Societ, London.

Ceylon Journal of Science, (1928), section,G.vol, »», London.
Doyle Bob, (2011), Free will, *The scandal in Philosophy*, Mass, I-ph press, Cambridge.
*Epigraphia Zeylanica*, vol.I.1912.
Fausball, V,(ed.), (1896-1990), *Jaṭaka with Commentary*, Vol.I.
Feer, L. (ed.), (1890), *Saṁyuttanikāya*, vol. III, Pali Text Society, London.
Feer, L. (ed.), (1884), *Saṁyuttanikāya*, vol. I, Pali Text Society, London.
Hardy, E., (ed.), (1900), *Aṅguttaranikāya*, vol.V, Pali Text Society, London.
*History of Indian Literture* vol. II.
Hinuber, O, Von, Norman, K.R., (eds.), (1994), *Dhammapada*, Pali Text Society, London.
Karpenter, J.E., (ed.), (1910), *Dīghanikāya,* vol.III, Pali Text Society, London.
Kirn, H.Nanji Boy, (eds.), (2006) *Saddharma Puṇḍarīka*, Motilal Banarsidass, Delhi.
Morris, R., (ed.), (1897), *Aṅguttaranikāya*, vol, III, Pali Text Society, London.
Morris, R., (ed.), (1888), (1885), *Aṅguttaranikāya*, vol. I, & II, Pali Text Society, London.
Oldnberg. H., (ed.), (1881), *Vinayapiṭaka* III, (Suttavibhaṅga Pārājikapāli) Pali Text Society, London.
Oldenbery, H., (ed.), (1879-1969), *Vinayapiṭaka* vol. I, (Mahāvagga), Pali Text Society, London.
Oldenberg, H., (ed.), (1880), *Vinayapiṭaka* Vol.II, (Cūlavgga) Pali Text Society, London.
Rhys.Davids, T.W. & Carpenter, J.E., (ed.), (1903), D*īghanikāya* vol. II, Pali Text Society, London.
Rhys Davids, T.W, Carpenter, J.E. (eds.), (1889) *Dīghanikāya* vol.I, Pali Text Society, London.
Smith, Helmer, (ed.), (1906), *Dhammapada, Commentary*, vol.I. Pali Text Society, London.
Taylor A.C., (ed.), (1979), *Paṭisambhidāmagga*, vol.I & II, Pali Text Society, London.
Trenckner,V., (ed.), (1899), *Majjhimanikāya,*vol.III, Pali Text Society, London.

Trenckner,V., (ed.), (1888), *Majjhimanikāya*,vol.I, Pali Text Society,London.

Ven. Buddhadatta, A.P., (ed.), (1939-1940), N*iddēsa Commentary* (Saddhammapajjotikā) vol.I, II, III, Pali Text Society, London.

Wood. J.H. Koambi.D., (ed.), (1928), *Papañcasūdan*i, (Majjhimanikāya, Aṭṭhakathā) vol. II, Pali Text Society, London.